

# ආලවක සුත්තං

# ආලවක සූත්‍රය

— සහ —

# සන්නය

කොළඹ මාදම්පිටියේ ධවලසිංහාරාමාධිපති
ධම්මිස්සර වංසපාලාචරිය


## තොටගමුවේ විමලඤාණතිස්ස නායක
## ස්ථවිරයන් වහන්සේ ලවා


— ශුද්ධකරවා ගෙණ —

ආර්. ජ. කුරේ මහතාගේ අවසරය පිට


## පී. ජේ. කරුණාධාර වන මවිසින්

කොළඹ මරදානේ පිහිටි
කරුණාධාර මුද්‍රණාලයෙහි මුද්‍රණය කරවා
ප්‍රසිද්ධ කරණ ලදී.

බු: ව: 2495
ක්‍රි: ව: 1951

# සංඥාපනය.

## ආලවක සූත්‍රය සහ සන්නය.

අප බුදුරජාණන් වහන්සේ මීට සාරාසැකි කප්සුවහසෙකින් මතුයෙහි කුළුණුනුවණැතිසුමෙධනම්මහාතාපසවැ දිව්කුරු බුදුන් හමුවැ අතට පත් නිවන් සසරසේ හැර අපරිමිත සතුන් වෙත පතළ කතදයාවෙන් ඒ බුදුන්ගෙන් නියත විවරණ සිරි ලැබ සසරට වැද එතැන්පටන් ලෝ පහළවූ සියලු බුදුවරයන් ගෙන්ම ලබනලද විවරණ ඇතියේ සමතිස් පෙරුම්පුරා තුසිතපුර ඉපිද දිව්සිරි විඳිත කලැ දසදහසක් ලෝදැසි දෙව්බඹුන් විසින් කරන ලද අයදුමෙන් එයින් සැව කිඹුල්වත් පුරවරයෙහි සක්කුල තිලකවන් සුදොවුන් මහරදුන් නිසා මහමායා බිසෝ කුස පිළිසිඳ දසඑකඩමසෙකින් මවුකුසින් බිහිව පුන්සඳු ලෙස කෙමෙන් වැඩී විය පැමිණ එකුන්තිස්වන වයසැහි ගිහිසැපත් හැර මහබිනික්මන් කොට පැවිදිව සවසක් මහපදන් විරියකොට ඇසතු බෝතුරුමුලැ හැගි විදුරසුන් අරාසිඳ නොක කුරිරු අවිදූරු සපිරිවර මරදෙව් පරදවා බුදුව සත්සති යවා මහබඹහු අයදුමෙන් බරණැස ඉසිපතන්හි දම්සක් පවත්වා පසුවද දහම්දෙසමින් විනෙදකන් අමා මහනිවන්දක්වනුවෝ, සැවැත්නුවර දෙව්රම්වෙහෙර වැඩවදාරණ සේක. එසමයෙහි අප මුනිඳු එක්දිනක් අළුයම මහකුළුණු සමවතින් නැගීසිට මුලුලොව බලා වදාරණසේක්, ආලවක් කුමාරයාගේ අනාගාමිඵල ප්‍රාප්තියට හෙතුසම්පත් ඇති බව හා ආලවක යක්ෂයාගේ ශ්‍රොතාපත්තිඵල ප්‍රාප්තියට උපනිශ්‍රය සම්පත් ඇති බවද යනාදිය දිවැසින් දැක එදවස් පහන්වූ කලැ පෙරවරු කළමනා බුදුකිස නිමවා පස්වරු එකසිය විසිගවු පමණ මග ගෙවා අලව්රට සමීපයෙහිවූ අලව්යකුගේ විමනටවැඩ ඔහු දමනයකොට ඔහුට හා එහි රැස්වූ අනෙක දෙවතාවන්ටද මේ සූත්‍රය ප්‍රථමකොට වදාළ සේක. අලව්රටදී අලව්රජ ප්‍රමුඛකොට ඇති ඒ නුවර වැසියන්ට දෙවැනිව දෙශනා කළසේක.

නැවතද බුදුහු දෙව්රමට වැඩ අනඳමහ තෙරිඳුට තෙවැනිව දෙශනා කළසේක. එසේ හෙයින් මේ සූත්‍රය සකල සුර නර කර්ණ රසායනවීය. සූත්‍රයෝ වනාහි දෙස දෙශක පරිග්‍රාහක අර්ථගුණ යන පඤ්චප්‍රකාරයන්ගේ වශයෙන් නම් ලබති—හේ කෙසේද යත්? අප සර්වඥයන් වහන්සේ යම් ප්‍රදෙශයකදී යම් සූත්‍රයක් දෙශනා කළසේක්ද ඒ ප්‍රදෙශ වශයෙන් නම් ලබයි, යම් රහත් කෙනෙකුන්විසින් යම්සුතුරක් දෙසනලදද හේ දෙශක වශයෙන් නම් ලබයි, යම් සුතුරක් දෙසූකල්හි යමෙකු විසින් ඒ දහම පිළිගන්නාලදනම් ඒ ප්‍රතිග්‍රාහකයාගේ වසයෙන් නම් ලබයි යම් අර්ථයක් මුල් කොට ගෙන යම් සුතුරක් දෙශනා කරන ලද නම් ඒ අර්ථ වශයෙන් නම් ලබයි. යමක් කාරණකොට ගෙන යම් සුතුරක් දෙසනලද නම් හේ ගුණ වශයෙන් නම් ලබයි, ඉන් අඞ්ඛවිඤ්ඤ සූත්‍රාදිය දෙශවශයෙන්ද, අම්භට්ඨය සූත්‍රාදිය දෙශක වශයෙන්ද, සිගාලොවාද සූත්‍රාදිය පටිග්‍රාහක වශයෙන්ද, මඞ්ගල සූත්‍රාදිය අර්ථවශයෙන්ද මධුපිණ්ඩික සූත්‍රාදිය ගුණවශයෙන්ද නම් ලදහ, මේ පඤ්චප්‍රකාරයෙන් මේවූකලී ප්‍රතිග්‍රාහක වශයෙන් ආලවක සූත්‍රයයි නම්විය. තවද සියලුම්සූත්‍රයන්ගේ උත්පත්තිතොම අත්තජ්ඣාසය, පරජ්ඣාසය, අට්ඨුප්පත්තිකය, පුච්ඡාවසිකයයි සතරවැදෑරුම්වේ. අනුන්විසින් අනුනොදන්නාලදුව බුදුහු තමන්වහන්සේගේම අදහසින් දෙශනා කළ දෙවදූත සූත්‍රාදීන්ගේ උත්පත්තිය අත්තජ්ඣාසය නම්, සෙසුන්ගේ අදහසද අවබොධයද දැනවදාළාවූ චූලරාහුලොවාද සූත්‍රාදීන්ගේ උපත පරජ්ඣාසය නම්, පැමිණි කාරුණු අරබයා වදාළාවූ දක්ඛිණවිභඞ්ග සූත්‍රාදීන්ගේ උපත අට්ඨුප්පත්තික නම්, යම් කෙනෙකුන් විසින් අසන ලද පැණවිසඳීම් වශයෙන් දෙශනා කළ මඞ්ගල සූත්‍රාදීන්ගේ උපත පුච්ඡාවසික නම්, උක්ත චතුර්ප්‍රකාරයෙන් මේ සූත්‍රයාගේ උත්පත්තිය පුච්ඡාවසික වශයෙනැයි දතයුතු.

තවද මෙම්සූත්‍රය වනාහි බුදුරජාණන්වහ[illegible]යෙන් පසු ධර්මසංගීති කාරක අර්හතුන් විසින් සඞ්ගායනා කොට සංයුක්ත නිකායෙහි අන්තර්ගත කරනලදී. හේ මේ සූත්‍රයට පුරාණ පණ්ඩිතයෙකු විසින් කරන ලද බොහෝවූ ධර්ම කාරණයන්ගෙන් යුත් විස්තර සන්නයක්ද තිබේ. ඒ සන්න කර්තෘ මෙනම් ඇත්තෙකැයි යනු සැක සහිත නමුත් කාලය බුද්ධවර්ෂ 2312 වන වර්ෂයයි අවසානයෙහි පෙණේ. ගිහි පැවිදි බොහෝ උදවියට මහොපකාරිවූ මෙම සූත්‍ර සන්නය පිටපත් කීපයක් ඒක්කොට අටුවාවටත් සමකර බලා අප විසින් යථා ශක්තීන් සංස්කාරනලද නමුදු අප

ප්‍රමාදාදීන් ජනිතවූද, අච්චුගැසීමේදී සිදුවීයයි හැඟෙන්නාවූද, යම් යම් අක්ෂර ඌනාතිරේකාදි දෝස් ඇතත් එහි පණ්ඩිතයෝ සමාධි කටයුතු. තවද මෙහි පෙළ වශයෙන් මුලම සූත්‍රයද යොදා ඇත' එහිදු යම් අක්ෂරොනාධිකාදි දොසැත්නම් ඒ සන්නය සමග සමකර බැලීමෙන් තේරුම් ගත්ම හැකි බවත් දතයුතු—

1 යො 'භිද්දචහන්ත මතිහිංස නම්භි පත්‍යං
සබ්ංබලෙන විවිධෙන අජෙය්‍යසත්තං
යක්ඛම්පි ආලවක මාබ්‍රමනන්ත තෙජො
කාමිංදමෙසිතමහං සිරසානමාමි.

2 සම්බොධ ධම්ම නරසාරථී නායකෙන
සම්භාසිතං යමභිපූජිත මුත්තමං ච
සංසාරභීති මතිපාතකරං සුධම්මං
සද්ධාසුදාර සුබදං තමහං නමාමි.

3 බුද්ධානුවාද හරිසෙනහ භිරසඤ්ඤ පතිතා
සුද්ධාසයො විසදචාරු දයාකරෝ යො
සද්ධාදි සත්ත ධනවාරිය සඞ්ඝ සඞ්ඝං
අද්ධාවිසුද්ධ සුබදං තමහං නමාමි.

4 විජ්ජාතිඑත්ථ යදිජාත පමාදදොසා
දොසඤ්ඤැනො විගතුසූය මලාවතෙයෙ
වඤ්ඤ[illegible] පොක්ඛරදලෙ වියවාරිබින්දු
[illegible] සාධුජනතා සරපත්තකාමා.

5 සම්මාපවත්තන්තු විරාය ජිනස්ස ධම්මො
ධම්මෙච රන්තු ධරණී පතයො ච ලොකෙ
ලොකොද්ධලද්ධමපනෙතු විරාගකාමො
කාමං පවස්සන්තු ඝනොබිල යස්සහෙතු.

# ආලවක සුත්තං

—— ඃ<○>ඃ ——

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

එවමෙම සුතං එකං සමයං භගවා, ආලවියං විහරති ආලවකස්ස යක්ඛස්ස භවනෙ, අථ ඛො ආලවකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච, නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි, පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි: දුතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති, සාධාවුසොතිභගවා නික්ඛමි; පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි; තතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි; පවිස සමණාති සාධාවුසොති භගවා පාවිසි; චතුත්ථම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති, නඛ්වාහං තං ආවුසො නික්ඛමිස්සාමි, යං තෙ කරණීයං තං කරොහීති පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි, සචෙ තෙ න ව්‍යාකරිස්සසි චිත්තං වා තෙ ඛිපිස්සාමි, හදයං වා තෙ ඵාලෙස්සාමි, පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපිස්සාමීති, නඛ්වාහං තං ආවුසො පස්සාමි, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, යො මෙ චිත්තං වා ඛිපෙය්‍ය, හදයං වා ඵාලෙය්‍ය, පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපෙය්‍ය, අපි ච ත්වං ආවුසො පුච්ඡ යදා කඞ්ඛසීති, අථ ඛො ආලවකො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං, කිංසු සුචිණ්ණො සුඛමාවහාති
කිංසු හවෙ සාධුතරං රසානං, කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති.

සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං, ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
සච්චං හවෙ සාධුතරං රසානං, පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති

කථංසු තරති ඔඝං, කථංසු තරති අණ්ණවං
කථංසු දුක්ඛං අච්චෙති, කථංසු පරිසුජ්ඣති.

සද්ධාය තරතී ඔඝං, අප්පමාදෙන අණ්ණවං
විරියෙන දුක්ඛං අච්චෙති, පඤ්ඤාය පරිසුජ්ඣති.

කථංසු ලභතෙ පඤ්ඤං, කථංසු වින්දතෙ ධනං
කථංසු කිත්තිං පප්පොති, කථං මිත්තානි ගන්ථති;

අස්මා ලොකා පරං ලොකං, කථංපෙච්ච න සොචති
සද්දහානො අරහතං, ධම්මං නිබ්බාණ පත්තියා.

සුස්සූසා ලභතෙ පඤ්ඤං, අප්පමත්තො විචක්ඛණො
පතිරූපකාරී ධුරවා, උට්ඨාතා වින්දතෙ ධනං.

සච්චෙන කිත්තිං පප්පොති, දදංමිත්තානි ගන්ථති
යස්සෙතෙ චතුරො ධම්මා, සද්ධස්ස ඝර මෙසිනො.

සච්චං ධම්මොධිතිචාගො, සවෙපෙච්ච න සොචති
අස්මා ලොකා පරංලොකං, සවෙපෙච්ච න සොචති.

ඉංඝඅඤ්ඤෙපි පුච්ඡස්සු, පුථුසමණ බ්‍රාහ්මණෙ
යදි සච්චාදමාචාගා, ඛන්ත්‍යාභියො න විජ්ජති.

කථන්නුදානි පුච්ඡෙය්‍යං, පුථුසමණ බ්‍රාහ්මණෙ
සොහං අජ්ජ පජානාමි, යොචත්ථො සම්පරායිකො.

අත්ථායවත මෙ බුද්ධො, වාසායාල විමාගමී
සොහං අජ්ජ පජානාමි, යත්ථ දින්නං මහප්ඵලං.

සො අහං විචරිස්සාමි, ගාමාගාමං පුරාපුරං
නමස්සමානො සම්බුද්ධං, ධම්මස්සච සුධම්මතන්ති.

එවං වුත්තෙ ආලවකො යක්ඛො භගවන්තං එතදවොච; අභික්කන්තං භොගොතම අභික්කන්තං භොගොතම සෙය්‍යථාපි භොගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය; අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙක පරියායෙන ධම්මො පකාසිතො; එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච; උපාසකංමං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං, සරණං ගතන්තීති.

ආලවක සුත්තං නිට්ඨිතං

# ආලවක සූත්‍ර සන්නය.

එවම්මෙ සුතං එකං සමයං භගවා ආලවියං විහරති, ආලවකස්ස යක්ඛස්ස භවනෙ; එවමෙම්සුතං මෙ, එම්බා ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්ස, විශුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධ බෞද්ධ විදග්ධ ජනප්‍රමුඛ සකල ශ්‍රොත්‍ර ජන්මනඃ ප්‍රසාදදායක සකල සුරනර පරම කර්ණරසායනවූ (මේ ආලවක සූත්‍රාන්ත ධර්මදෙශනාව) මා විසින්; එවං සුතං, (මේ ආකාරයෙන් අසනලද මෙසේ අසනලද) මෙසේම අසනලදී; නොහොත් මෙ, මාගේ; සුතං, ශ්‍රැතිය (ඇසීම); එවං, මෙසේ මැයි; එකං සමයං, (සංවත්සර ඍතුමාසාර්ධමාස පූර්වාණ්හ අපරාණ්හාදී කාලයන් අතුරෙන් ද්‍රෙ හෝ නොහොත් ගර්භාවක්‍රාන්තිසමය, ජාති සමය, සංවෙග සමය, අභිනිෂ්ක්‍රමණ සමය, දුෂ්කරක්‍රියාසමය, මාර විජය සමය, සම්‍යක් සම්බොධි සමධිගමකාල සමය, දෘෂ්ටධර්ම සුඛ විහාර සමය, අත්තහිත පටිපත්ති සමය, පරහිත පටිපත්ති සමය, දෙශනා සමය, පරිනිර්වාණ සමය යනාදිවූ දිව්‍ය මනුෂ්‍යයන් කෙරෙහි විශෙෂයෙන් ප්‍රකාශ සමයන් අතුරෙන් කරුණා කෘත්‍ය සමය සංඛ්‍යාතවූ) එක් ධර්මදෙශනා සමයෙක්හි; භගවා, (ලෞකික ලොකොත්තර හිතසුඛාභි නිර්වෘත්තක දාන ශීලාදි කොටිප්‍රාප්ත භාග්‍ය ඇති හෙයින්) භගවත් නම්වූ සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන්වහන්සේ; ආලවියං[1], (ආලකමන්දා නම් දිව්‍යපුරය සේ සකල නගරාර්ඝශ්‍රී සමෘද්ධින් භාසුරවූ අලව් නම් පුරප්‍රවරයට ගාවුත ප්‍රමාණ තන්හි වූ හෙයින්) අලව් නුවර සමීපයෙහිවූ; ආලවකස්ස යක්ඛස්ස, (ඉන්ද්‍ර සොම අග්නි වාරුණ්‍ය භාරද්වාජ ප්‍රජාපත්‍යාදී අෂ්ට විංශති යක්ෂ සෙනාධිපතීන්[2] අතුරෙන්) ආලවක යක්ෂ සෙනාධිපතිහුගේ; භවනෙ, (න්‍යග්‍රොධ වෘක්ෂසමීපස්ථවූ භූමියෙහි පිහිටියාවූ [illegible] ඇති සුවර්ණමය දිව්‍ය) විමානයෙහි; විහරති, (ආ[illegible] රජ්ජුරුවන්ගේ පුත්‍රවූ අලව් රාජකුමාරයාහට අනුග්‍රහ පිණිස එක්සැටවිසිගව්වක් ප්‍රමාණ මාර්ගයෙහි වැඩ ආලවකයාගේ මංගල දිව්‍යරත්න පර්‍ය්‍යඞ්කාරූඪව තරුණ රවිකිරණයෙන් දිලිහෙන කනකගිරි පර්වතයක් සේ බබලමින්) වැඩවාසයකර වදාරණ සේක.

---

1 "ආලවි" නම්වූ නගර ප්‍රවරයට ගවුවක් ප්‍රමාණ හෙයින් ආලවියයි සමහර පොත්හි පෙණේ.

2 "[illegible]තීන්ට අනතගීතවූ" සමහර.

මෙහි නිදාන සහිත භාවය මෙසේ දතයුතු.

**කෙසේද යත්?**

අප බුදුන් දවස අලව්රට අලව්නුවර අලව් නම් රජ්ජුරු කෙනෙක්[1] රාජ්‍යයකරනසේක. ඒ රජ්ජුරුවෝ තමන්ගේ නානා ප්‍රකාර සුරඟනන්බඳු වරඟනන්ගේ නෘත්‍ය ගීත වාදිත ශෘඞ්ගාරාදිවූ අනෙකප්‍රකාර උපභොග පරිභොග සම්පත් හැර සූර වීරබල පරාක්‍රම ප්‍රාප්ත අනෙක ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයා[2] පිරිවරා ගෙන සොරුන් ප්‍රතිබාහනයකරනු සඳහාද, සතුරු රදුන් වලකනුසඳහාද, ශුඹපුරුදුකරනු සඳහාද, කුසීත භාවය දුරුකරනු සඳහාද, සත් සත් දවසින් මුවදඩයමෙහි වඩනාසේක.[3] එසේ වැඩ එක්දවසක් බලසෙනඟ ගෙන තොටුපත්හි සඳා යමෙක් සිටි දෙසින් මුවෙක් පැනගියේ වීනම් ඕහටම ඒ මුවා විදීම භාර යයි කතිකා කරනසේක. එකල්හි රජ්ජුරුවන් සිටි තැනින්ම මුවා පැන ගියේය. රජ්ජුරුවෝද තමන් කළ ප්‍රතිඥාව සඳහන් කොට දුන්න ගෙන මුවා පස්සෙහි තුන්යොදුනක් තැන් ලුහුබඳවා පැන්නූසේක. ඒ එනිමෘග තෙමේද තුන්යොදුන් තැන් දිවගොස් කලාන්තව දියට වැද සිටියේය. රජ්ජුරුවෝ මුවා විද මරා දෙකඩ කොට කපා තමහට මාංශයෙන් ප්‍රයෝජන නැතත් මුවා විදිනට නොහැකිවූසේකැයි අමාත්‍යයන් විසින් කියනලද නින්දාවෙන් මිදෙනුපිණිස මුවා කදබැඳගෙන එන්සේක් නුවරට ගව්වක් පමණ තන්හි ඉතා ඝනප්‍රභාර බහල නීලපත්‍ර සාඛාවිටපයෙන් සමලඞ්කෘතවූ මහත් න්‍යග්‍රොධ වෘක්ෂයක් දැක විඩා සංසිඳුවාගෙන යෙමියි සිතා ඒ නුග රුක සෙවනට පැමිණියේය.[4] ඒ නුගරුක් ආලවක නම් යක්ෂ තෙම වෙසමුණි රජ්ජුරුවන්ගෙන් වරලදින් හිරමුදුන් කල්හි ඒ රුක් සෙවනට වන් වන් සතුන් අනුභව කෙරෙමින් වෙසෙයි. එසේ හෙයින් හෙතෙමේ ගසමුලට වන් රජ්ජුරුවන් දැක සතුටුව අත අල්වා ගත්තේය. එකල්හි රජ්ජුරුවෝ ඔහු යක්ෂයා බව දැන

1 "රාජ්‍යයකරන්නහු තමන්ගේ" සමහර.

2 "පරාක්‍රමයෙන් සමන්විතවූ නොයෙක් අමාත්‍ය සමූහයා" සමහර.

3 "මුව දඩයන් පිණිස යන්නාහ. එක්දවසක් එසේ මුවදඩ ගොස් බලසෙනඟ කොටුපත්වල සිටුවා යමෙක් සිටිතැනින් මුවා පැන ගියේ නම් ඕහටම ඒ කතිකා කළාහ, එකල්හි රජ්ජුරුවන් සිටිතැනින්" සමහර.

4 "වැඩිසේක" සමහර.

රාජ ධෛර්‍ය්‍ය උපදවා සිට මා කුමට අල්වාගනිද්දැයි විචාළේය. ඇසී මාගේ මේ රුක්සෙවනට වන් වන් සතුන් අනුභව කරනසේ වෙස මුණි රජ්ජුරුවන්ගෙන් වරම් ලද්දෙමි. එසේහෙයින් තොපත් අනුභවකරනු පිණිස අල්වාගතිමි කීයේය. එසේ වීනම් මේ මුවා කා මා හරුවයි කීසේක. එවිට යක්‍ෂ තෙම කියනුයේ මහරජ තොපි කුමක් කියව්ද තොප කෑ කල්හි[1] මුවා කොයියේද තොපත් මුවත් දෙන්නම කමියි? කීයේය එවිට රජ්ජුරුවෝ කියනසේක් පින් වත්වූ යක්‍ෂය! මම් මේ රට රජකෙරෙමි, තොපට දවස දවස මිනි සෙකු හා බත්තලියක් එවමි, මා හරුවයි කීයේය. මහරජ තොපි රජ ඉසුරෙන් ප්‍රමාදව මා සිහිනොකෙරෙති, මම මාගේ භවනයට නොපැමිණිනුන් නොගිවිස්සතුන් කන්නට වර නොලද්දෙමි. එබැවින් තොප නොහරිමි කීයේය. එසේ වීනම් පින්වත! මම තොපට දෙන බලි කර්‍මාන්තය නුදුන් දවසෙක රජගෙට ගොස් මා අල්වා ගෙන කවයි ප්‍රතිඥාදී ඔහු අතින් ගැලවී නුවරට අභිමුඛව ගියේය. එකල්හි සැදවුරු බැඳගෙන සිටි බලසෙනග දුරින් එන රජ්ජුරුවන් දැක වහා පෙරමගට දිවගොස් වැඳ වැතිර කිමෙක්ද දෙවයන් වහන්ස! සවල්පවූ අයසක් නිසා මෙසේ කරවදෑලේ ඉතා නපුරයි කියමින් රජ්ජුරුවන් පිරිවරා ගත්තෝය. රජ්ජුරුවෝද තමන් කළ වික්‍රමය කියා මහත්වූ රාජානුභාවයෙන්දිලියෙමින් නුවරට ගොස් පෙරබත අනුභවකොට නගරාරක්‍ෂාවෙහි නියුක්තවූ නගර ගුප්තික නම් අමාත්‍යයා කැඳවා එපවත් කීයේය. ඒ අසා ඇමති තෙමේ භයපත්ව කියන්නේ කිමෙක්ද? ස්වාමිනි, මෙතෙක් කල් දෙමි කියා කල් නිමකළ සේක්දැයි විචාළේය. එසේ කාලයක් නියමකළේ නැතැයි කීසේක. දෙවයන් වහන්ස! වූ දෙයට වඩා කළ [illegible] පුරුෂ, අමනුෂ්‍යයෝ නම් නියමකළ පමණක්කල් [illegible] මස් [illegible]නකි නොලබති, කල් නියම නොකළකල මෙරට [illegible] වෙයි, එනකුදුවුවත් දැන් කුමක් කරමෝදැයි පශ්චාත්තාප වීමෙන් ප්‍රයෝජන නැත, තුබවහන්සේ සෝක නොකර නොනැවී රාජ්‍ය සම්පත් විඳ වදාළ මැනව, මම ඊට සුදුස්සක් කෙරෙමි කියා රජ්ජුරුවන් අස්වසාලා ඒ අමාත්‍ය තෙම එදා අලුයම නැගී සිට

1. "මුවා අනික් කාටද, සමහර. මෙසේ ඇතැම් තැනෙක සමහර පොත්වල වචන පෙණෙත නමුදු අටුවාවටද ඉන් විරුද්ධ යක් නැති බැවින් ඒ ප්‍රකාර වචන හැර වෙනස් වචන පමණක් මෙතැන් පටන් මේ ක්‍රමයෙන් ලකුණුකර පෙන්වනු ලැබේ.

බන්ධනාගාර චාරයම් ගොස් මේ දඬගෙයි වරදට පැමිණියන් අතු රෙන් ගැලවෙනු කැමති කෙනෙක් වහා නික්ම එවයි නියෝගකළ කල්හි යමෙක් පළමු කොට නික්මුනේ වීනම් ඔහු තමාගේ ගෙට කැඳවා ගෙන ගොස් නහවා බත් අනුභව කරවා එම්බල පුරුෂය! අපගේ කිසියම් කටයුත්තෙක් ඇත, මේ බත් තලිය අසවල් නුග රුක සමීපයටගෙනදීයවයි හරණේය, හෙතෙම ඒ ගෙන නුගරුක සමීපයට වන් විගසම යක්ෂයාගේ ආනුභාවයෙන් ඔහුගේ හිසකේ පටන් ගෙන සකල ශරීරය වෙඬරු පිඩක් සේ හුණුවන්නේය, ආලවකයා භයානක වේසයෙන් සිට කරු මුරු යන අනුකරණ පවත්වමින් මූලාල ඛණ්ඩනයක් සෙසින් ඒ පුරුෂයා අනුභවකරන් නේය. බත් ගෙන්වා ගෙන ගිය රාජපුරුෂයෝ ඒ දැක භයින් තැතිගෙන වෙවුලා නුවරට අවුත් තම තමන්ගේ මිත්‍රයන්ට කීවාහුය. එතැන් පටන් රජ්ජුරුවෝ සොරුන් අල්වා යකෙකුට බිලි දෙනසේකැයි කියා අලව්රට ප්‍රසිඬව ගොස් යක්ෂයා කෙරෙහි භයින් සොරකම් කරන කෙනෙක් නැත. අඬදබර කරන කෙනෙකුත් නැත්තේය. එසේ හෙයින් දඬගෙය හිස්ව ගියේය. එකල්හි නගරගුප්තික නම් අමාත්‍යතෙම රජහට එපවත් දන්වා සොරුන් අසුකරනු පිණිස නොයෙක් රන් රුවන් වස්ත්‍රාභරණ වීථියෙහි ඒ ඒ තැන දැම්මවූහ. ඒ වස්තු ගන්නා තබා පසින් පාගන කෙනෙකුන් නැත්තේය. රජ්ජුරුවෝ සොරුන් නොලැබ එපවත් අමාත්‍යයන්ට කීහ. අමාත්‍යයෝද කථාකොට තම තමන්ගේ කුල පිළිවෙළින් එක එක මහලු මිනිසුන් ගෙන දෙමිහ, ඔවුනු ස්වභාවයෙනම මරණයට කල් බල බලා ඉඳිනාහු නොවැද්දැයි කීවාහුය. රජ්ජුරුවෝ එබස් අසා අමාත්‍යවරුණි, නෙපි අපගේ මුත්තණුවන් මුත්තණියන් කිරිමවුන් රජ්ජුරුවන් වහන්සේ යකෙකුට අල්වා බිලිදෙනසේකැයි කියා මට වෛරබඳිති, එසේ හෙයින් ඒ නොකැමැත්තෙමි ප්‍රතික්ෂෙප කෙළේය. එසේ වීනම් දෙවයන් වහන්ස! දෙමවුපියන් කෙරෙහි කිසි සෙනහයක් නැත්තාවූ උත්තානිවසයනයකරන අජාතබුද්ධික ළදරුවන් දී යවම්හයිකියා රජ්ජුරුවන් ගිවිස්වා එතැන්පටන් බාලකුමාරයන් ගෙන ගොස් යක්ෂයාට දෙති, එපවත් ප්‍රසිඬව මුළුනුවර ඇලළී ගොස් දරුවන් ඇති ස්ත්‍රීහු යක්ෂයා හා බඹබරින් යන්නා සේ දරුවන් වඩාගෙන අන් රටවල යෙති, ගැබිණීහුද රන් රටවල ගොස් දරුවන් වදා වඩිනය කොට ගෙන එත්, එසේ හෙයින් සියලු අලව්රට දරුවන් ගෙන් හිස්විය, මෙසේ එකලට දොළොස් අවුරුද්දක් අතික්‍රාන්ත විය, ඉක්බිත්තෙන් එක් දවසක් අමාත්‍යයෝ සියලු අලව්රට විමසා ළදරු කෙනෙකුන් නොලදින් රජගෙට ගොස් දේවයන්

වහන්ස! සියලු අලව්රට විමසුම්හ. නුඹවහන්සේගේ ඇතුළු රජගෙහි හිඳිනා ආලවක කුමාරයන් වහන්සේ ඇර වෙන ළදරු කෙනෙක් නැතැයි කීවාහුය. රජ්ජුරුවෝ ඒ අසා ලය සැකියා මහත්වූ වික්ෂෙපයට පැමිණ අමාත්‍යවරුණි! ඒ මාගේ එකම ඇසක් වැනිවූ අලව් කුමාර තෙම මා නැති දවසෙක ඔටුනු පැළඳ දශරාජ ධර්මයෙන් රාජ්‍යය කෙරෙමින් මේ සියලු රට රකියි. එසේද වුවත් අද අලව් යක්හට දෙන බිලි නුදුනහොත් අදම අප හැම කා මරයි; දිවි ඇතිකල දරුවන් ලදහැක්කේය. එසේ හෙයින් යව ගොසින් ඔහු ද දී යවා මා දිවි රකුවයි කීයේය. එවේලාවට අලව් රාජදේවි තොමෝ කුමරුවා සිනිඳු දුහුල් සළුවකට වඩා ඔරහොවාගෙණ සුරතල් කියමින් උන්සේක. ඇමතිවරු රාජ නියෝගයෙන් අවුත් මෑනියන් හඬව හඬවා කුමාරයන් උදුරා ගෙන සැටදහසක් කිරිමවුන් හා සොළොස් දහසක් කිසෝවරු ලෙහි අත් සප සපා ඉස අත්බැඳ මහ හඬින් හඬ හඬා තින්දදී සෙට දවස් ආලවක නම් යක්‍ෂයාට මේ කුමාරයා බිල්ලට දෙම්හයි කියා කුමාරයා හැරගෙන ගියෝය. එදවස් සහරාමර නයනරසායන කමනීයන්ත ශරීර කාන්තියෙන් මුලුලොව බබුලුවා දහම්රසයෙන් තුන්ලොව උතුරුවන තිලෝගුරුබුදුරජාණන්වහන්ගේ තිස්යොදුනකින් මත්තෙහි සැවැත් නුවර සමීපයෙහි ජේතවනාරාමයෙහි පිහිටියාවූ ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත කනක රජත මණිතාරකායෙන් විචිත්‍ර විතාන ඇති නානා ප්‍රභාසමුදය සමුජ්වලිත අලංකෘතවූ ශ්‍රීමහාසුගන්ධ ගන්ධකුටියෙහි වැඩවසනසේක් අළුයම් වේලෙහි නැගීසිට මහා කරුණා සමාපත්තියට සමවැද නැවත අද කවරක්හු මාගෙන් බණ අසා අමාමහ නිවන්දකිද්දෙ හෝයි කවරෙක්සරණසීලයෙහි පිහිටද්දෙ හෝයි, කවරෙක් මා කෙරෙහි මහණව ත්‍රිවිධ ශික්‍ෂාව සම්පාදනය කෙරෙද්දෙ හෝයි බුඩ චක්‍ෂුසින් ලොව බලා වදාරණසේක්; අලව් රාජකුමාරයාගේ අනාගාමිඵල ප්‍රාප්තියට හේතු සම්පත් ඇති බවද අලව් යක්‍ෂයාගේ ශ්‍රොතාපත්තිඵල ප්‍රාප්තියට උපනිශ්‍රය සම්පත් ඇසි බවද ඔවුන් දෙදෙන උදෙසා වදාරණ බණින් සුවාසූදහසක් දෙනා අමාමහ නිවන් දක්නා බවද යන මේ සියල්ල දිවැසින් දැක එදවස් පහන්වූ කලැ පෙරවරු කළමනා බුඩකෘත්‍යයන් කොට නිමවා පස්වරු වේලෙහි කලුවර දෙපෝ දවස්හි කාරුණා රමණීය ප්‍රනාඑවූ භාග්‍යවතුන් වහන්සේ පාසිවුරු ගෙන එකලාවම සැවැත් නුවර දෙව්රම පටන් එක් සියවිසිගව්වක් පමණ මගගෙවා මීකිසාන සහහන්සාක්මෙන් ශ්‍රීපාද ගමනින් සූර්‍ය්‍ය අස්තංගතවන්වේලාවට ආලවකයාගේ භවනවාරයට වැඩිසේක. එදවස් ආලවකයා හිමාල වනයෙහි දේවසමාගමට ගියේය. එසඳ ආලවකයාගේ ගේ දොර

රක්නා ගද්‍රභ නම් යක්‍ෂයෙක් බුදුන්කරා එළඹ වැඳ මෑට ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මේ විකාලයෙහි මෙතැනට වැඩ වදාළේ කුමටදෝ හෝයි විචාළේය, සර්වඥයන් වහන්සේ ඒ අසා එසේය, ගද්‍රභය කළමනා දෙයකට ආම්හ, ඉදින් තෝ කැමැත්තෙහිවීනම් අද එක් රැයක් මේ ආලවක විමානයෙහි වසනු කැමැත්තෙමියි වදාළසේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මාගේ ඊට නොකැමැත්තෙක් නැත, එතකුදු වුවත් අපගේ මේ ආලවක නම් යක් සෙනෙවිරත්තෙම ඉතා කර්කශය, පරුෂය, මාතෘ පිතෘන්ට පවා අභිවාදනාදිය නොකරන්නේය, මා දන්නාමෙතෙක් මේ විමන පින් කමකට සැරසුවා හුදුටිමි, මිනීමස් කනසල කටකොනකින් වැගිරිගිය ලෙහෙයෙන් මේ බිමතෙමී තිබෙනසැටි බලාවදාළමැනව, රටක් පුරාණන මිනිසුන් කා නැතිකෙළේය. ස්වාමීනි! ඔහුගේ අඹුවෝත් ඇතුළු විමනෙහි වෙසෙති. තුඹ වහන්සේගේ බුදුගුණත් ඔහු නොදන්නේය. ස්වාමීනි, ඒනිසා තුඹ මෙහි වැඩසිටීමට මම නොකැමැත්තෙමියි සැලකෙළේය, එවිට විවිධ විචිත්‍ර ප්‍රභා ප්‍රබන්ධ බන්ධුර කාන්ත්‍යාදී භොගඇති බුදුහු වදාරණසේක්, එසේය ගද්‍රභය! ඔහුගේ කර්කශ ස්වභාවය මමත් දනිමි, එහින් මට වන අනතුරයෙක්නැත, මම බෝධිසත්ත්ව අවස්ථාවේ පටන් මහානුභාව සම්පන්නයන් සොරෙන් අග්‍රවූ වසවර්තීමාරයාටත් සරු නොකෙළෙමි, දැන් බුදුව තුන්ලෝ මුදුන්පත්වූකල යකෙකුටත් සරු කෙළෙම්ද? ඉදින් තෝ කැමැත්තෙහි වීනම් අද මෙහි වසම්හයි වදාළසේක. දෙවෙනිවරත් ගද්‍රභ නම් යක්‍ෂතෙම කියනුයේ ස්වාමීනි ආලවකයා ගින් නෙත් රත්වූ යකඩබලක් වැන්නේය, මොහු මවුපියෝය කියා හෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝය කියා හෝ මේ යහපත්වූ කුශල ධර්මයෙක කියා හෝ ඔහු නොදන්නේය, මෙතැනට පැමිණි සත්ත්වයන් මරා කයි, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ චිත්ත වික්‍ෂේපයකොට උමතුකරවයි හෘදය පළයි, දෙකකුල් ගෙන ඉරාපියා පරසමුද්‍රයට හෝ පරසක්වළට දමා ගසයි, එසේ හෙයින් ස්වාමීනි, තුඹ වහන්සේ මෙහි වැඩ විසීමට මම නොකැමැත්තෙමි යයි සැලකෙළේය. දෙවෙනිවරද සර්වමාරවරණ කෙසරීන්ද්‍රායමානවූ සද්ධර්මවර චක්‍රවර්ති ස්වාමිවූ සර්වඥ රාජෝත්තමයාණන්වහන්සේ වදාරණසේක්, ගද්‍රභයආලවකයාගේ එබඳුවූ නපුරු ගුණය තටවඩා මම දනිමි, මකුණුදූල් පුළුන් ගෙන යන සුලඟ මහමෙර වැද නවතින්නාසේ අලවියකනු මාකරාපැමිණ නදමන් බදී නවතියි, තෝ නොඅදහා නම් ආලවකයා ආකුල දුක්ක හැකිකේය, ප්‍රයෝජනයක් නැත්නම් කෙසඟක් පමණ කැඩූන් ආයතන පසින් තිස්යොදුන් මාර්ග ගෙවා නිෂ්ප්‍රයෝජ

කයේ ආවෙම් නොවෙම්, ගද්‍රභය මම ආයේ මේ විමානවම්ය, අනික් තැනකට නොවෙයි, ඉදින් තට නොබැරි වීනම් අද එක්රැයක් මේ විමන වසම්හයි වදාළසේක. ස්වාමීනි, මට නොබැරිය එතකුදුවුවත් ඒ යක්ෂ තෙම තෝ මට නොකියා මාගේ විමනට [illegible]න්ට අනුදත් තෝ ඇයිදැයි කියා ඒකාන්තයෙන්ම මා මරයි, එසේ හෙයින් ස්වාමිනි ඔහු කරා ගොස් කියම්දැයි විචාළේය. එබසට බුදුහු වදාරණසේක් ගද්‍රභය තෝ ගොස් කැමති ලෙසක කියව, ඔහු දක්නා පිණිස වේද මම මෙතෙක් තැන් ආයෙම් යයි වදාළසේක එසේ වීනම් ස්වාමිනි නුඹවහන්සේම දන වදාළ මැනවයි කියා නමස්කාර කොට යක්හට හයින් තැතිගෙන විමානයෙහි දෙර නොහැරම හිමවත්අභිමුඛව ගියේය. භක්තිභාරාවනත සුරාසුරවර මකුට මණි කිරණසිසිර නීරපාරිජෘම්භිතපාදපද්මඇති සර්වඥරාජොත්තමයාණන් වහන්සේ ඒ විමානයෙහි දෙර එළිපතට ශ්‍රීපාදය දිගු කළසේක, එකල්හි තමන් වහන්සේ කරා බෝධිසත්ව භූමියෙහිදී ආ යාචකයන් දක කිසිකලෙකත් දෙර නොපියා දින්දුන් කුශල ධර්මයෙන් එකෙණෙහි ඒවිමානයෙහි දෙරතෙමේම හැරී ගියේය. ඒවිමානයද න්‍යග්‍රොධමූල සමීපයෙහි පිහිටියේය සුරක්ෂිතවූ සත්රුවන්ප්‍රාකාරයෙන්වටකරනලද්දේය, සුසංවිහිතවූදොරටුඅටල ඇත්තේය, මස්තකයෙහි ලෙලදෙන රන්දලින් වසනලද උසින් තුන් යොදුන් ස්වර්ණමය කරඬුවක් වැනිවූයේය, ඉතා මනොඥවූ ඒ දිව්‍ය විමානයට ස්වයං විවෘතවූ දෙරින් වැඩ ආලවකයා උතුම් මගුල් දවස්හි යම් අස්නෙක හිඳ මහත්වූ දිව්‍ය ශ්‍රී සම්පත් විඳිද, ඒ දිව්‍යරත්න පර්‍ය්‍යඞ්කය මස්තකයෙහි ස්වර්ණවර්ණවූ බුදුරැස් විහිදුවා හරිමින් ඝනදුරුමුදුනෙහි බබලන ලහිරුමඬලට නිශ්‍රීකකරමින් අනොපමෙය්‍යවූ බුඩවිලාශයෙන් ඒ විමානයෙහි හිරු දහස් සඳ දහස් නැංගාසේ එකාලොකකොට වැඩහුන්සේක. ඒආලොකයදක ආලවකයාගේ යක්ෂාඞ්ගනාවෝ අනේ අපගේ විමානය ගිනිගත්නියා ඈ හෝ යි වහා දිව අවුත් ස්වර්ණවර්ණ බුඩරශ්මීන් විරාජමානවූ බුදුන් දක නමස්කාර කොට බුදුන් පිරිවරා විෂ්මපත්ව සිටියෝය. එකල ශ්‍රී විශුඩ භගවත් අතීත් සම්‍යක් සම්බුඩ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ ඒ දිව්‍ය ස්ත්‍රීන්ට තෙපි පෙර දන්දී සිල් රැක පුදන්නට නිසි මව්පිය ගුරුවරයන්ට හා බුදු පසේබුදු මහරහතුන්ට වැඳ පුදා මෙසේ මේබඳුවූ දිව්‍ය සම්පතට පැමිණියෝය, එසේ හෙයින් මතුත් මෙසේම සම්පත් ලබනු පිණිස දනුත් එසේම පින්කරව, ඔවුනොවුන් කෙරෙහි ඊර්ෂ්‍යාක්‍රොධ නොකරව යනාදින් සිලට නිසි

බණවදාරණ කල්හි, ඒ යක්ෂාංගනාවෝ පෙර නොඇසූ විසිතුරු බණ අසා කුල්මත්ව ගී කියන්නවුන්සේ සියදහස් ගණන් සාධු කාර පවත්වමින් බණ අසති. බුද්ධාචාර බුද්ධානන්තඃකරණ සුබෝධන නන්දන පරාර්ථප්‍රසාදක පරම කාරුණිකර වීරත්වාදි ගුණයෙන් විරාජමානවූ ශ්‍රී සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ බ්‍රහ්මඝෝෂවිහිදුවා මධුරස්වරයෙන් ඒ අමරස්ත්‍රීන්ගේ සාධුකාරශබ්දය මැඩපවත්වා බණවදාරමින් මෙසේ කාල් ගිනිගත් මහමෙරසේ බබලමින් ආලවකයාගේ මඞ්ගල දිව්‍යරත්න පර්‍ය්‍යංකාරූඪව වැඩ වාසයකර වදාරණ සේක, එසේ හෙයින් "එකංසමයං භගවා ආලවියං විහරති ආලවකස්ස යක්ඛස්ස භවනෙ"යි කියන ලදී.

අථ ඛො ආලවකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච.

අථඛො, ඉක්බිත්තෙන් නොහොත් ආලවකයාගේ දිව්‍යරත්න පර්‍ය්‍යංකාරූඪව එසේ වැඩවාසයකරන කල්හි වනාහී; ආලවකො යක්ඛො, ආලවකනම් යක්ෂ සේනාධිපතිතෙම; භගවා, (භාග්‍යවන්තතාදි ගුණගණානුයොගයෙන් යෙදුනු හෙයින්) භගවත් නම්වූ අප සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ; යෙන, යම් තැනෙක්හි (වැඩවාසයකරනසේක්) ද; තෙන, ඒ ස්ථානයට; උපසංකමි. (ක්‍රොධාග්නියෙන් දිලිහී දිලිහී) එළඹියේය; උපසංකමිත්වා, (එසේ) සමීපයට එළඹ; භගවන්තං, (ත්‍රිභුවනෛකතිලකවූ) භාග්‍යවතුන් වහන්සේට; එතං, (ශ්‍රමණ ව්‍යවහාරවූ) මේ වචනයෙක්; අවොච, කීයේය.

ඒආලවකයක්හු කොතැන්හීසිටආයේදකුමක්කොළේදකුමක් කීදයත්, ආලවක නම් යක්ෂතෙම හිමාල වනයෙහි දෙව්පිරිස් මැද හුන්තැනට යටකී ලෙසින් ගද්‍රභයා නැමි නැමී කොස් කට අරින් වසාගෙන මා නොකිවයි මට උදහස්නොවන්න ස්වාමීනි නුඹවහන්සේගේ විමානයෙහි බුදුහු අවුත් වැඩහිඳිනාසේකැයි කීයේය. එපවත් ඇසූ ආලවක යක්ෂසේනාධිපතිතෙම මාවැනි වික්‍රමවත්න පුරුෂයෙකු සිටිනා විමානයෙහි ශ්‍රමණයෝ වැද හිඳීම සුදුස්සෙක් නොවෙයි. සිංහයන් වසන ගල්ගුහාවෙක කැනහිලෙක් වෙසේදැයි කියා පුරුෂාභිමානයෙන් මහත්වූ ලජ්ජාවට පැමිණ, ගද්‍රභය මේ පිරිස් මැද නින්දිතවචන කියා මට ලජ්ජානොකරවයි රතැස් ඔරවා බලා තෝ නොදෙඩා හිඳුවයි මම ගොසින් ආ රිසි හරිම් කියා හුන්නේය. එකල සාතාගිර හෙමවත යන යක්ෂසේනාධිපතීහුදෙදෙන එදා උදය දෙව්රමට ගොස් බුදුන් වැඳ බණ අසා නැවත තමන් විමන් සමුහු අවුත් දෙවසමාගමට යම්හයි කියා සපිරිවරින් නානා විරාග

යානා නැගී අහසින්යෙහි, අහස්හිද හැමතන්හි යක්ෂයන්ට මාර්ගය
ඇත්තේ නොවෙයි, අහසසිටි විමන්පිරාහැරී මාර්ගය ඇතිනැතින්ම
යක්ෂමාර්ගය වෙයි, ආලවකයාගේ විමානය භූමියෙහි පිහිටි හෙයින්
ඒ විමනට උඩින් අහස්හි යකුන් යන මාර්ගයෙක්විය, ඔහු දෙදෙන
ඒ ප්‍රදේශයට පැමිණ සීනයෙන් ඇතුන් දුටුවක් පය නොනැගෙන්
නාසේ ඒ විමානය මස්තකයෙන් යන්නට අසමර්ථවූහ. කුමක්
හෙයින්ද යත් බුදුහු යම් තැනෙක වැඩහිඳිනාසේක් නම් එතැන්හි
අහසින් භවාග්‍රය දක්වාද කිසිවෙක්හට යන්නට නොහැකි වෙයි,
එහෙයින් ඒ යක්ෂ සේනාධිපතියෝ දෙදෙනාද එතැනින් යානොහී
මේ කිමෙක්දැයි ආවර්ජනා කරන්නාහු බුදුන්දැක අහසදැමූ කැටක්
සේ බැස වැඳවැටී බණඅසාප්‍රදක්ෂිණාකොටස්වාමිනිඅපිදෙවසමාගම
ට යම්හසි කියා අවසර ගෙන රත්නත්‍රයට ප්‍රසංශාකොට ගියෝය.
ආලවකයා ඒ යක්ෂ සේනාධිපතිවරුන් දෙදෙනා දැක මෙහි හුන
මැනවයි අවකාශ දීලා හුන්නේය, ඒ දෙදෙනා ආලවකයාහට
කියන්නෝ ආලවකය තොපට වූයේ මහත්වූ ලාභයෙක, අපගේ
බුදුහු තොපගේ විමානයෙහි වැඩ වෙසෙති, යව ගොසින් බුදුන්ට
උපස්ථාන කොට පින් පුරවානණ්ණවයි කීහ. ඒ අසා ආලවකයා
ගින්නෙහි බහාලූ ලුණුරැසක් සේ අභ්‍යන්තරයෙහි උපන්නාවූ
ක්‍රොධයෙන් තට තට යන අනුකරණ ඇතිවූ හෘදයෙන් යුක්තව
තොප කියන ඒ බුදුහු නම් කවුරුද බුදුකෙනෙක් මම නොදනිමි
කිසි භයක් චකිතයක් නැතුව මාගේ ගෙට ගියේ කුමන බුදු
කෙනෙක්දැයිකීයේය. එබස්අසා සාතාගිර,හෙමවතදෙදෙනකියන්
නාහු එම්බා ආලවක සේනාධිපතියෙනි තොප අප බුදුන් නොහඳු
නනනියාවදැයි විචාළාහුය. ආලවකයාක්‍රෝධාග්නින් දිලිහී මම දන්
නා බුදුකෙනෙක්නැතැයි කීයේය. එවිට එබසට සාතාගිර හෙමවත
දෙදෙන කියන්නාහු ඈයි ආලවකයෙනි තෙපි උමතුව දෙඩන
නියාද තෙපි කියන බස් කාටත් හැගේද? නොහැගේමය; තාගේ
කීම අපට නොරිසිය, අපගේ හිමිපාණෝ තුසිතභවනයෙහි සෙවත
කෙතු නම් දිව්‍ය රාජත්ව දිව්‍යසම්පත් විඳ වෘරණකාල දසදහසක්
සක්වළ ශක්‍ර බ්‍රහ්මාදී දෙවියෝ එකම තුසිත නම් දෙව් ලොවට
පැමිණ අපගේ ඒ ලොකස්වාමීන්වහන්සේට දොහොත්මුදුන්දී සිට
"කාලොයං තෙ මහාවීර" යනාදීන් බුදුවීමට ආරාධනා කළ කල්හි
පඤ්චමහාවිලොකනාවසානයෙහි දෙවියන්ට සමුදී දෙව්ලොවින්
චුතව මිනිස්ලොව සුඬොදනරජ්ජුරුවන් නිසා මහමායාදේවීන්ගේ
කුසපිළිසිඳගත්දා උන්වහන්සේගේ ගුණානුභාවයෙන් ජලපොළො
ව අවසන්කොට ඇති මේ මහා පෘථිවිය සතරාවසනහශූරාව වශ

යෙන් කුඹල්සකක්සේ භ්‍රමණය වෙමින් කම්පාවූවාය, එදා තාගේ විමානය නොසෙල්වීද ජලපොළොවට මුල්ඇද බැසපීද, ආලවක යෙනි උන්වහන්සේ ලුම්බිනී නම් උයනෙහිදී මවුකුසින් ලොව පහළවූද, මිනිස් කිලුටු හරණ පිණිස මහබඹු අතට කිහිව ඔහු අතින් සිව්වරම් රජුන් අතට ඔහු අතින් ඇමතියන් අතට ඇමති යන් අතින් බිමට වැඩ පොළොව පළාගන පැණනැඟී සත්බුම් පියුම්පිට වැඩසිට බැලූ බැලූ දිග කම්පා කරවමින් දසදිශාවන් බලා පියුම් පිපීන් උතුරු දිගට සත්පියවරක් වැඩ තුන්ලොව් වෙවු-ලුවා වැඩසිටිකල්හි දසදහසක් සක්වල ශක්‍ර බ්‍රහ්මාදී දෙවියෝ එකපැහැර දෑහොත් මුදුන්දී සිට ස්වාමිනි තුඹවහන්සේට සමකෙ නෙක්වත් වැඩි කෙනෙක්වත් ශ්‍රෙෂ්ඨතර කෙනෙක්වත් තුන්ලෝ-වම නැතැයි දැන්වූ කල්හි එ: තපුල් අසා වදරා "අග්ගොහමස්මි ලොකස්ස, ජෙට්ඨොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස" යනාදීන් උපන් ඇසිල්ලෙහිම දසදහසක් සක්වලට ඇසෙනසේ අභීත කෙසරසිංහනාද පැවැත්වූද ආලවකය තාගේදෙකන් බිහිරි ව ගියේද එදා තෝ තාගේ මේසමඬුගම් නොකියාහුන්නේ ඇයිද? තවද ඒ උතුමන් වහන්සේ උපන්දා ශ්‍රී ශරීරයෙන් නිකුත් රශ්මි යෙන් තුන්ලොවපුරා ඉතිරගොස් ලොකාන්තරික මහාන්තරකයෙහි පවා කිරු දහස් සඳ දහස් නැංගාසේ එකාලොකවූ කල තාගේ ගෙට ඒ එළිය නොවැටුණේද එසේ නැත තෝ නිදාපීද, ආලවකය එදා නොයෙක් වර්ණ මලින් සියලුම අහස්තලය විසිතුරු මල් වියන නක්සේ සැදී ගියේය, සියලු පොළෝතලය මල් යහනක් මෙන් සැදී ගියේය, සියලු සමුද්‍රජලය පිට පස්පියුම්පිහිටියේය, සියලු වන වෘක්ෂ ලතා පර්වතාදීහු මුල පටන් අග දක්වා විසිතුරුවූ නන් කුසු මෙන් සැදීගියේය, තවද ආලවකය එදා දෙවියෝ සතුටින් වස්වාලූ පරසතු මඳාරාදීවූ දිව්‍යපුෂ්පයන් තාගේ ගේ දොර නොවැස්සාහුද, එදා තෝ තාගේ ඇතුළුගෙටවැද පිඹුරෙකුසේ නිදාපීද, එදා අපගේ ශක්‍රදිව්‍යරාජයන්වහන්සේ බුදුසිරිදරාබොන්නාසේ දෙව්ලොවපුරා පිඹින එක්සිය විසිරියන් විජයුත්තර නම් ශංඛය තුඩතබා පිඹිබා තෝ නොඇසූ තට කුමක්වීද, ආලවකය අපගේ ස්වාමිදරුවාණන් වහන්සේ මවුකුස පිළිසිඳගත් ඇසිල්ලෙහිම උන්වහන්සේගේ කුශලානුභාවයෙන් ජාත්‍යන්ධයෝ ඇස් ලදින් අහෝ සැපය අහෝ සැපය කිය කියා නැටූහ, ගොළුවෝ ගී කියන්ට පටන්ගත්තාහ, බිහිරෝ කන්ලද්දාහ, පිල්ලු දෙපා ලදින් යොදුන් ගණන් දිවන්ට පටන්ගත්තාහ, සියලු බන්ධනාගාරවල් සිඳීගියේය, සියලුනඩගාවෝ උඩුනංබලා ගියාහ. හස්තීහු කුඤ්චනාද කළෝය, අශ්වයෝ හෙෂා රව කළෝය, සිංහයෝ උස් ගල් නැගී සත්වයෙනි ලොවට මහත්

වැඩසිරුවූ මානුෂ්‍ය සිංහයෙක් උපදියි කියන්නාසේ සියලු වනය එක්නින්නාද කොට සිංහනාද කළෝය. ඔවුනොවුන්ම සතුරුවූ තිරිසන් සත්හු සතුටින් ඔවුනොවුන් මූණ බැලූහ. දිවියන් හා මෘගයෝ සතුටින් එකතැන්ව ක්‍රීඩාකළහ. බකමූහුණන් හා කවුඩුවෝ ඔවුනොවුන් සතුටුව මූණ බැලූහ, බළලුන් හා මීයෝ සමඟිවූහ, නයින් හා ගුරුළෝ සමඟිවූහ. තවද ආලවකයෙනි, ඒ පුරුෂෝත්තමයන්වහන්සේ මවුකුසින් බිහිවූ නොබෝ දවසකින් අනෝමා නදියේදී මහණව ඉණ තුබූත කිලුටු සළුසහල අහසට දැමූ කල්හි තමාගේ සවාමිහට සළුපාවාදී තමන් කිලුටු සළුසහල හිසතබාගෙන යන රදවකුසේ සුද්ධාවාස බ්‍රහ්මලොකයෙහි වාසය කරන්නාවූ අනාගාමී මහානුභාව සම්පන්නවූ සහම්පතී මහා බ්‍රහ්මරාජ තෙම ඒ සළුසහළ හිසතබාගෙන ගොස් පුද පවත්වන්නේය, කේසකලාපය දක්වා අහසට දැමූකල්හි දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙම හිසතබාගෙන ගොස් පුද්පවත්වන්නේය, ගිහිගෙයි වසන කල කාම සම්පත් අනුභව කරමින් ඇඳගත සිරි සළුසහල හා කෙසකලාපය පවා මෙසේ රාජාධිරාජයන් විසින් පූජ්‍යවූ කල ඒ සිංහපුරුෂයාණන් වහන්සේගේ සර්වලොකශ්‍රෙෂ්ඨ භාවය කියනුම කවරේද? වෙනත් නොකී බුදුගුණ බොහොම ඇත, එහෙයින් ආලවකයෙනි අපි තොපට වැඩවන නිසා කියම්හ. යව, ගොසින් තුන්ලොවට තිලකයක් වැනිවූ බුදුන් වැඳ පුදා පින් පුරාගනුවයි කීහ. එවිට ආලවකයා කියන්නේ සාතාගිරයෙනි තෙපි කියන්නේ බල ඔහු පමණටමය, තොපගේ අභියුක්තිකම් තොප පමණටමය, මාගේ විමනට ගියවුන්ට කරනු කියන සැටි මම දන්නෙමි කීයේය. ආලවකය එසේ නොකියව අප බුදුන්ගේ බල තාත් ඇතුලත්කොටිමය; උන්වහන්සේ මවුකුස පිළිසිඳගත්දා බිහිවූදා බුදුවූදා දම්සක් පැවැත්වූදා උන්වහන්සේගේ ගුණ තේජසින් දසදහසක් සක්වළ අවීචිමහ නරකවල් ඇතුළුවූ තෙළොස් ලක්ෂ සැටදහසක් පමණ නරකවල ගිනි නිවී හිමපිඬක් අමා පිඬක් සේ සිහිල්විය; එකි කපක් මුළුල්ලෙහි පාදගින්නෙන් දදා දුක් අනුභව කරන නිරිසත්හු යහපත්වූ සුවපහස් ලදින් ඔවුනොවුන් දැක කොල මේ කුමන විස්මයෙක්ද, අද අපි නරක දුකින් මිදීගියම්හ, "අහෝසාධු අහෝසාධු"යි කිය කියා එකපැහැර සාධුකාර පැවැත්වූහ. තවද ගව්ගණන් යොදුන් ගණන් උස මහතැති ගිනිගෙන දිලියෙන ප්‍රෙතයෝ තමන් කළ පවින් මහගංගා කවලා වන් උගුරු නොමිගන නොහී කල්පයක් මුළුල්ලෙහි බත් නො

ලදින් පැන් නොලදින්, "අහොදුක්ඛං අහොදුක්ඛං" කියකියා දුක් අනුභව කරන්නාහු දිවපහස් ලදින් බත් ලදින් පැන් ලදින් නොල අපි ප්‍රෙත දුකින් මිදී ගියම්හ, අහෝ සැපය අහෝ සැපය කීයකියා නටාපුහ, ආලවකය මෙවැනි නොසිතිය හැකි තැනැත්තන්ට පවා සැප දුන්නේ අප බුදුන්ගේ බුදු බල නොවේද? තවද ආලවකය අපබුදුන් බුදුවනද, තුන්ලොව දෙව් බඹපිරිස් පිරිවරා විදුරසුන් අරා මාගේ සම් මස් ඇට නහර වියලීසුණුවිසුණුවගියේනමුදු බුදුව මිස මේ පලඟ නොහරිම්හි අධිෂ්ඨාන කොට බුදුවීමට වැඩහුන්කල්හි එපවත්දත් වසවර්තිමාරයා සිද්ධාර්ථකුමාරයා අද මාගේ ආඥාව ඉක්මවා බුදුවන්ට විදුරසුන්අරා හුන්නේය, වරෙව් යම්හ ඔහු දෙකකුලගෙන පරසක්වළ ගසම්හ, බුදුවන්නට උන් රිසි පලවම්හයි කියා දශබිම්බර මාරසේනාව ගෙන බෝමැඩකරා පැමිණි කල්හි සක්වළපුරා බුදුමගුලට රැස්ව සිටි දිව්‍යබ්‍රහ්ම සේනාව මරණ භයින් තැතිගෙන වෙවුලා මේ සක්වළ රඳගත නොහී පරසක්වළ දිවපුහ ආලවකය තෝත් එදා තාගේ අඹුවනුන් සිහිනොකොට පරසක්වළ දිව් බවට අපි සාක්ෂි දනුම්හ, අපගේ ස්වාමිදරුවාණෝ එදා තනිවම මර පිරිස් මැද වැඩ හිඳ—

> එතෙසබ්බෙ ගහෙත්වාන චුණ්ණේතුං අචඡරියං මම
> අත්ථිථාම බලංමය්හං, පාණ ඝාතො නවට්ටති.
> ඉමස්සගණ්ඩුප්පාදස්ස ආයුධෙන බලෙන කිං
> මය්හං තෙන පාණෙන සල්ලාපොපි න යුජ්ජති.[1]

(යනු හෙයින්) මේ සියලු මාරසෙනාව හසුකොටගෙන සුණුවිසුණු කරන්ට මට (බැරි) ආශ්චර්යයක් මෙන් නොසිතමි. මදකුත් සරුවක්ද නොකරමි, එසේ ථාමසංඛ්‍යාත බලත් මට ඇත්තේය, ධ්‍යාන බල ඥාන කාය බලයෙන්ම එසේ කරන්ටද පොහොසත්මි එතකුදු වුවත් ප්‍රාණඝාතකොට පෙර බුදුවූ කෙනෙක් නැත, (එහෙසින්) ප්‍රාණඝාත (කිරීම) මට නොවන්නේය, (මාගේ ශරීර බල හා මා පිරූ පාරමිතාවන්ගේ බල බැලූ කල) ගණ්ඩුප්පාදයෙකු වැනිවූ මේ මාරයා (කරන සටන) ට ආයුධයෙන් හා බලයෙන් ප්‍රයෝජන කවරේද, (ගැඩවිල් පණුවෙකු වැනි පාපිවූ) මේ මාරයා හා සමග කථාසල්ලාපයකුදු මට නොවටනේයයි සිතා වදාරා, දාන ශීල

---

[1] මෙහි මෙලෙස පෙණෙන නමුත් වෙනපොත්හි පෙණෙන්නේ බුදුවීමට විදුරසුන්අරා වැඩහුන් අප උතුමාණෝ මර දෙව්පුත් සමග කථාකළ බවයි.

නෛෂ්ක්‍රම්‍ය ප්‍රඥා වීර්‍ය්‍ය ක්‍ෂාන්ති සත්‍යාධිෂ්ඨාන මෛත්‍රී උපෙක්‍ෂා ලක්‍ෂණ යන දශපාරමිතා බලයෙන් ඒ මරුන් තෘණලවයක් සේත් සරු නොකොට ජයගෙන බුදුවූසේක. ඒ ක්‍ෂණයෙහි සකල ලෝක වාසීවූ ශක්‍ර බ්‍රහ්මාදී දෙවියෝ පැරද දිවන්නාවූ සපරිවාර මාරයා දැක තම තමන් ගිය තැනින් මේ සක්වළට දිව අවුත් අපගේ සර්වඥයන් වහන්සේට දෑහොත් මුදුන්දී තුන්ලොව [illegible]වුලුවා ජය නාද පැවැත්වූහ, ආලවකය එදා තෝ මිනීමස් කෑමෙහි ගිජුව සිටිනැතිවීද, තවද ආලවකය අප බුදුහු බුදුවූ නොබෝදවසකින් ගණ්ඩම්බ නම් වෘක්‍ෂමූලයෙහිදී යමාමහ පෙළහර දක්වා යුග ධූරු මැඬගෙන තුන්පියවරින් සුරපුර නැගී තුන්ලොව විස්ම පත්කරවා විජම්බණ දෙසූදා මිහිකත දම්තඳින් පිරිතීබෙන බුදුකඳ උසුලම්සී කියා සොම්නසින් සාධුකාර දෙන්නියක සේ කම්පාව ගියාග. එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් උසඇති සිත් පිත් නැති මහමෙරපවා අත්ලෙහිනටනඅත්බඹරක්සේ නටාගියා තෝ නුදුටුවීද, එදා ආලවකය තාගේ දෙකන් මැකී ගියේද, දෙඇස් කණව ගියේ දැයි කීවාහුය. ආලවකයා ආශ්චර්‍ය්‍යමත්වූ මෙබඳු බුදුමහිම අසාත් ක්‍රෝධයෙන්දිලිහී මෝහයෙන්මුළාව මම ඇසූදෙයෙකුත් නැත දුටු දෙයකුත් නැතැයි කීයේය. එවිට සාතාගිරාදී දෙදෙන කියන්නෝ එම්බල ආලවකය හේ තෝ දුටුයේ හෝ නුදුටුයේ හෝ තාගේ දැකී මෙන් කවර ප්‍රයෝජනයෙක්ද, දැක හෝ නොදැක හෝ අපගේ බුදු රජාණන්වහන්සේට තෝ කුමක්කරසිද? ආලවකය තෝ අපබුදුන් නියාවට මහමෙර ලඟ තුබූ අබ ඇටක් වැන්නෙහිය, ත්‍රිමද්ගලිත උතුම් හස්තිරාජයන්හු සමීපයෙහි සිටි ගොරකයෙකු වැන්නෙහිය, සිංහරාජයක්හු සමීපයෙහි සිටි මහළු කැනහිලෙකු වැන්නෙහිය, ගුරුළුරජක්හු සමීපයෙහි සිටි පටුවූ තටු ඇති වටුකුරුල්ලෙකු වැන්නෙහිය, වෘෂභරාජයක්හු සමීපයෙහි සිටි ලෙලදෙන මොල්ලි ඇති ගවවස්සක්හු වැන්නෙහිය, චක්‍රවර්ති රජ්ජුරුවන් ලඟ සිටි චණ්ඩාල කොල්ලෙකු වැනිවූය, එසේදවුවත් තටම කරුණාකොට අප බුදුහු තාගේ විමානයට වැඩිසේක. තා සේ තම වැඩකැමැත් තෙක් නටින් ඇද්ද, යව ගොසින් තට කැමතිවීනම් වැඳ පුදා පීන් පුරවා ගණුව, එසේ තට නොකැමති නම් තට කැමැත්තක්කොට තට වඩා තෙළ සුවහස් ගුණයෙන් අනූසස් ඇති වසවත්මරු සේ වෙහෙස විඳ ගණුවයි කීහ. ඉක්බිත්තෙන් ආලවකයා දණ්ඩෙන් ගැසූ සර්පයෙකු සේ ක්‍රෝධයෙන් දිලිහිදිලිහී හුනස්නෙන් නැගී රත් ගල් මුදුනෙහි වම්පයින් සිට සාතාගිරයෙනි දුන් මඳ වීගසකින් තොපගේ බුදුන්ගේ මහානුභාව හෝ මාගේ මහානුභාව හෝ බල

එයි කියා සැටයොදුන් කෛලාසකූට පර්වතයට දකුණුපස විළඹින් හැන්නේය. ඒ පර්වතය මහත්වූ යකුලකින් පහරලත් රත්කළ යවටක්මෙන් දෙදරා පපර්කා සංඛ්‍යාත ගල්පතුරු විසිදගියේය. ආලවකයා කෛලාසකූට පර්වත මස්තකයෙහි සිට සෙතහඬ දහස් සුවහස් එකවිට ගැසුවාසේ මමය ආලවකයයි කියා හඬගැසීය, ඒශබ්දය දසදහසක් යොදුන් දඹදිව පතලවූයේය. මේ ආදිවූ ශබ්ද සතරෙක්මුලුමහත්දඹදිවපතලවූයේය. ඒකවරේදයත්?අපමහබෝසත්හු කුසරජකල "අහං කුසො" යි හඬගැසූ ශබ්දයද, විධුරජාතකයෙහි පුණ්ණක නම් යක්ෂසෙනාධිපතිතෙම ධනංජය කොරව්‍ය රජ්ජුරුවන් හා දූකෙළ දිනා අත්පොළසන්දී "මම දිනාගියෙමිය" යි හඬගැසූ ශබ්දයද, මහාකණ්හජාතකයෙහි මහාකාලසුනඛයාගේ ශබ්දයද මේ ආලවකයාගේ ශබ්දයද යන මේශබ්දසතර මුලුමහත් දඹදිව පතලවිය. යම්සේ මුතුසොයන්නවුන් මැණික්දුටුද ගනා හරණසේ අපි මෙතන්හි ඒ මහාකණ්හජාතකය මදක් සංක්ෂෙප කොට දක්වම්හ— හේ කෙසේද යත්?

සංසාරයට හා පස්මරුන්ට හාස්‍යොත්පාදකළාවූ කාශ්‍යපනම් ත්‍රෛලොක්‍යෛක නායකවූ සර්වඥයන්වහන්සේ විසිරියන් බුදුබඳින් යුක්තව විසිදහසක් අවුරුදු මුලුල්ලෙහි විසිදහසක් මහරහතන් පිරිවරා තුන්ලෝ බබුලුවමින් වැඩහිඳ, කුසල් මුහුකළ දෙව් මිනිසුන් අමාමහ නිවන් දක්වා කුසල් නුමුහුකළ දෙව් මිනිසුන්ට මතු බුදුවන ගෞතම බුදුන් දකින්වයි අප බුදුන් දක්නට මාර්ගය දක්වා සියලු බුද්ධකෘත්‍යයන් කොට නිමවා මරණ කාටත් නියම බව හඟවන්නාසේ අනුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළසේක. ඒ බුදුන්ට සම්මුඛී භූතවූ බුද්ධානුබුද්ධ මහාශ්‍රාවකයන් වහන්සේලාත් ඒ නොබෝ කලකින් සමන් වහන්සේලා පතා ආවාවූ අමාමහ නිවන්පුර පැමිණිසේක්ලාය. ඉන්පසු ඒ ඒ ප්‍රස්ථාවට පැමිණි අභාවිතකාය හා අභාවිත චිත්තය අභාවිත ශීලය අභාවිත ප්‍රඥාඇති ආචාර්ය උපාධ්‍යායවූ ථෙරානුථෙර පෘථග්ජනයන් වහන්සේලාගේ ප්‍රමාද දොෂයෙන් "එකො අලජ්ජී අලජ්ජී සතම්පි සහස්සම්පි සතසහස්සම්පි කරොති" යනු හෙයින් එක් අලජ්ජියෙක් අලජ්ජී සියයක්දු දහසක්දු ලක්ෂයක්දු කරන්නේය. එසේ හෙයින් දුෂ්ඨානුගතියට ගොස් බොහෝ කලක් පැවත ආවාවූ ශාසනය ක්‍රම ක්‍රමයෙන් පිරිහී ගොස් බුදුන් විසින් එපාකර වදාරණ ලද එක්විසි අන්වෙසනය කෙරෙමින් භික්ෂුණින්වහන්සේලා හා සමග වරදට පැමිණෙමින් දරුවන් දූකොට භික්ෂූන්වහන්සේලා තමන් වහන්සේලාගේ උපසම්පදා සීලය හැර ගිහියන් සරිවම වාසය

කරණසේක. භික්ෂුණීන් වහන්සේත් තමන්ගේ භික්ෂුණී ධර්මය හැරියෝය, උපාසකවරුත් තමන්ගේ උපාසක ධර්මය හැරියෝය, උපාසිකාවරුත් තමන්ගේ උපාසිකා ධර්මය හැරියෝය, බ්‍රාහ්මණයෝත් තමන්ගේ බ්‍රාහ්මණධර්මය හැරියෝය, අමාත්‍යයෝත් තමන්ගේ අමාත්‍ය ධර්මය හැරියෝය, සියලු මනුෂ්‍යයෝත් දශකුශල් ධර්මයන් හැර දස අකුශල ධර්මයන්ම කෙරෙති. එසමයෙහි නැසුන සත්වකෙනෙක් ඇත්නම් නරකයෙහිම උපදිති. දිව්‍යලොකයෙහි උපදිනා කෙනෙක් නැත, ඒ කාරණාව ශක්‍රදේවේන්ද්‍රයෝ දැක අපගේ කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ ශාසනය පිරිහෙයි, අප වැනි ශ්‍රද්ධා වීර්‍ය්‍ය ප්‍රඥා කෘපා පරාක්‍රමවත් දිව්‍යරාජයන් බලා සිටියදී ශාසනය පිරිහීම සුදුසු නොවෙයි. මා විසින් මනුෂ්‍යයෝ භයගන්වා හික්මවා ආයුෂය සිතා මාතලී දිව්‍යපුත්‍රයාම අශ් නාම්බක සමාන බලු වෙසක් ගන්වා ශක්‍රයෝ තෙමේම වැදිවෙසක් මවාගෙන එකියන බල්ලා යදමකින් පස්තැනකින් බැඳගෙන බල්ලා අතින් ගෙන බරණැස්නුවරට පැමිණි කල්හි ඒ බලු මහත් කොට ශබ්දකෙළේය. සියලු මනුෂ්‍යයෝ භය ගෙණ ඇතුළු නුවරට වැද උසීරත නම් රජ්ජුරුවන්ට එපවත් කීහ. රජ්ජුරුවෝ ඒ අසා එසේ වීනම් වාසල් දොරවල් අගුලු ලා ගණුව කියා වාසල් දොරවල් අගුලු ලවා ගත්හ. ශක්‍රයෝ තමන්ගේ ආනුභාවයෙන් දශ අටරියන් පමුර පැන ඇතුළු නුවරට වැද වීථියේ බල්ලා ඇරගෙන යන්ට වන්හ. සියලු මනුෂ්‍යයෝ භයින් තැතිගෙන දොරවල් අගුලු ලා ගත්හ. ඒ බල්ලා රජ්ජුරුවන් ලඟට ගොසින් මුළුමහත් දඹදිවට ඇසෙනසේ මහත් කොට බිරූ කල්හි රජ්ජුරුවන් ඇතුළුවූ සියලු මනුෂ්‍යයෝ භයින් වෙවුලා ත්‍රස්තවූහ. එකල්හි උසීරතනම් නරේන්ද්‍රතෙම මහත්වූ රාජධෛර්‍ය්‍ය උපදවා සිට කියන්නේ එම්බල වැදිපුත්‍රයාණෙනි! ඉතා කලුපැහැයක් හා ඇඹුල්කෙහෙල්ගෙඩි වැනි දත් ඇති තොපගේ මේ බල්ලා කුමක්නිසා ගෙන අවුද කුමක්නිසා මූ මුරගාන්නේදැයි විචාළේය. රජ්ජුරුවෙනි, මේ බල්ලා තමාගේ බඩසාය නිසා මුරගාන්නේ යයි කීහ. එකල රජ්ජුරුවෝ තමන්ගේ මුළුතැන් ඇතුළුවූ රජගෙයි සියල්ලවුන්ට ඉදිකළ බත් ගෙන්වා දුන්හ. ඒ සියල්ලම එක කටින් කා තවත් මුරගාන්නේය, එවිටත් රජ්ජුරුවෝ මූ මුරගාන්නේ කුමට දැයි විචාළේය. එවිටත් වැදිපුත්‍රයා කියන්නේ දේවයිනි! මූ මුරගාන්නේ බඩගිනි නිසා යයි කීහ. නැවතත් රජ්ජුරුවෝ ඇතුන් අසුන් ආදීන්ට ඉදිකළ බොහෝ බත් රැස්කොට දුන්කල්හි ඒත් එක කටින්ම කා තවත් මුරගාන්නේය, නැවතත් රජ්ජුරුවෝ මූ මුරගාන්නේ කුමටදැයි විචාළේය.

දෙවයෙනි! මූ මුරගාන්නේ බඩසාය බොහෝනිසා යයි කීහ.. රජ්ජු රුවෝ එවිටත් දෙළොස්යොදුන් බරණැස්නුවරවාසී සියළුමනුෂ්‍යා යින්ට ඉදික[illegible] බොහෝ බත් ගෙන්වා දුන් කල්හි ඒත් එකකටින්ම කාපියා තවත් මුරගාන්නේය. එකල මහ පිණැති රජ්ජුරුවෝ සිතනසේක් මේ බල්ලාට දුන් බත් තුන් කොටසම තුන්කටින් කා තවත් මුරගාන්නේය, ඒකාන්තයෙන්ම මේ බල්ලා බල්ලෙක් නොවන්නේය, මහත් තේජස් ඇති යක්ෂයෙකැයි සිතා එම්බල වැදිපුත්‍රයාණෙනි! තොපගේ බල්ලාට මෙතෙක් බත් කාත් බඩගිනි ඉවසාගත නොහී තවත් මුරගාන්නේ උෟරන් මුවන් ආදීන්ගේ මස් කන්මද, එසේ නැත, මිනිස් මස් කන්මදැයි විචාළේය, රජ්ජුරුවෙනි! උෟරන් මුවන් ආදීන්ගේ මසින් අපට කම් නැත, අපට වෛරිවූ දුස්සීලවූ මනුෂ්‍යයින්ගේ මස් කන්ට යයි කීයේය. ඔහු කවුරුදැයි විචාළ කල්හි, රජ්ජුරුවෙනි! මේ ලෝකයෙහි යම් කෙනෙක් සඟලසිවුරු පොරවා හිසකේකපා පාත්‍රයක් අතින්ගෙන අපිත් සඟහුයයි දෙරක්දොරක්පාසා භික්ෂාටනයකොට ඇපිසීසැම් වැපිරීම් ආදිය කරන ගිහින් වැනිව වෙසෙත් නම් එබඳු භික්ෂූන්ද භික්ෂුණීන් හා සමග අසඬ්ඝෙහි යෙදී (හැසිර) වසන්නා වූ අශික්ෂිත භික්ෂූන්ද, එසේම නොකටයුත්තෙහි යෙදී (හැසිරී) වසන භික්ෂුණීන්ද, එබඳු සාමණේරයන් හා සාමණේරීන්ද, යන මෙකී දුස්සීලයෝ අපගේ වෛරීහුය, ඔවුන් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද රජ්ජුරුවෙනි! බුදුන් විසින් නින්දාකොට හරනලද එක් විසි අනේසනයෙන් කුලදූසනය කොට ජීවත්වන භික්ෂුකෙනෙක් ඇද්ද, නොහොත් මිනිසුන්ගේ සිත්ගන්නාපිණිස දුවදඬු හුණදඬු බට කොස් පොල් පුවක් දෙසි දෙඩම් දුනුකේමල් සපුමල් පිච්චමල් මාරා සුණු නහන මුවසෝදන පැන්මැටි දැහැටිදඬු ආදිය දීමෙන් කුලදූසනය කරන භික්ෂුකෙණෙක් ඇද්ද, ලාභාසාවෙන් ගිහින්ගේ දරුවන් නලවා වැඩීමෙන්විසූ මුන්සේ ගිහින්ගේසිත්ගන්නාපිණිස සැබෑ මදකොට බොරු බොහෝ කොට කීමෙන් ගෙබින් පෘපිචි ශාස්ත්‍රාදී වූ ශාස්ත්‍ර කීමෙන්, කොත්වත් අරම් ආදියට මෙහෙවරට යාමෙන් පත්හසුන් පඩුරුගෙන දූතකමට යාමෙන් විවාහ මඟුල් සම්බන්ධයට කියමන් ගෙන ඔබිනොබ ඇවිදීමෙන් නොයෙක් කියමන් ගෙන එගෙයින් මෙගෙට, මෙගෙයින් එගෙට, එගමින් මෙගමට, මෙගමින් එගමට කියා ඇවිදිමින් ලාභාසාවෙන් අත්ලුස් ආදිය දීමෙන් දෙවීමෙන් සිවුපසය ලැබ නැවත ඔවුන්ට සංග්‍රහ කිරීමෙන්, වෙදකම්කිරීමෙන්, නැකැත් කීමෙන්, සාමුද්‍රිකාලක්ෂණ කීමෙන් ද යන මේ ආදිවූ බුදුන් විසින් නින්දාකොට හරනලද එක්විසි අනේසනයට ඇතුලත් නොයෙක් දේ දීමෙන් කිරීමෙන්

ගිහින්ගේ ශ්‍රද්ධාව නසා ජීවත්වන අලජ්ජීහුද නොනැ නොපැවරූ තැනින් හුසුදුසු ලෙස ඉල්වා කන තමා කෙරෙහි නැති ගුණ කියා ලොව රවටා කන, විසකන්නාසේ කුහක කල්පනාදියෙන් ජීවත් වන භික්ෂූහුද යන මෙකී සියල්ලෝම අපගේ වෛරීහුය, ඔවුන් හැම මේ බල්ලා ලවා කවා මරවම් කීහ, තවද රජ්ජුරුවෙනි, යම් භික්ෂුකෙනෙකුන් විසින් හෝ සාමණේරයෙකු විසින් හෝ ගෘහස්ථයෙකු විසින් හෝ බෙදාපිය නොහැක්කාවූ බෙදා පිවත් නොබෙදෙන්නාවූ සාංඝික වූ ආරාම ආරාම භූමි විහාර විහාර භූමි ඇඳ පුටු කිසිකොට්ට කුලිච්චම් ලොහොමය තාලි කටාරම් කුණ්ඩහට්ටි බුට්ටි කලස් කලගෙඩි වෑ පොරෝ කෙටේරි කැති උදලු නියන්කටු ජෝවැල් ගුණකණ පිදුරු මැටිවැටි වලන්දඬු දඬුභාජන යන මෙකී ගරු භාණ්ඩයන් ගිහීන්ට දෙමින් ආදරයෙන් ගින්නට දමන්නා සේ ලොවට මහත් අවැඩ කරන මහණකෙනෙක් ඇද්ද, ඒ සඟුන් අයත් දෙය සොරා දෙන ගන්නා අයත් අපගේ වෛරීහුය, එහෙයින් ඔවුහුත් මේ බල්ලා ලවා කවා මරවම් කීහ. තවද රජ්ජුරුවෙනි! යම් සත්වකෙනෙක් දෙමවුපියන්ගේ ගුණ නොසලකා ඔවුනට නින්දා කොට බනිද්ද, අත් පා මෙහෙවර නොකෙරේද්ද වන්දනමානන ගරුකාර සත්කාර සම්මාන නොකෙරෙද්ද, එසේම ගුරුවරයන්ට හෙළාදකිත්ද, ගුණ හුවණින් වැඩි සිටියන්ට භය දෙද්ද, එබඳු අයත් අපගේ වෛරීහුය, ඔවුනුත් මේ බල්ලා ලවා කවා මරවම් කීහ. තවද රජ්ජුරුවෙනි! යම්සත්වකෙනෙක් තමාගේ කුඩා මවුන් කෙරෙහි හෝ මහමවුන් කෙරෙහිද, නැඳිනියන් කෙරෙහිද, ගුරුන්ගේ බිරිඳ කෙරෙහිද, යහලුවන්ගේබිරිඳ කෙරෙහිද, දෝෂ කෙරෙත් නම් එබඳු අයත් අපගේ වෛරීහුය, ඔවුහුත් මේ බල්ලා ලවා කවා මරවම් කීහ. තවද රජ්ජුරුවෙනි! සිහියෙන් යෙදී ඇසුවමැනව, යම් රජකෙනෙක් හෝ ඇමතිකෙනෙක් හෝ පුරාතන අය පඬුරට වඩා අය පඬුරු ගනිද්ද, ගම්පහරණ සොරුන් සෙයින් නොබද්දේ අය ගැණීමෙන් ලෝකය වෙහෙසද්ද, පුරාතන තඹුපණත් වරදවා අහිමියන් හිමිකරවා හිමියන් අහිමි කෙරෙද්ද, "ඡන්දා දෝසා භයා මෝහා, යො ධම්මං අතිවත්තති, නිහීයති තස්ස යසො, කාලපක්ඛෙව චන්දිමා" (යනු හෙයින්) යමෙක් (තමහට හිත ඇතිව බන්ධු මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන් ප්‍රණීස ඇත්ත නැතිකොට නැත්ත ඇතිකොට ඡන්දයෙන් අගතියට යේද, යමෙක් තමහට අප්‍රියවූවන්හට පැමිණෙන යසලාභ සත්කාර දුක ඒ ඉවසිය නොහී එයින් පිරිහෙළා ද්වේෂයෙන් අගතියට යේද,) යමෙක් (මොහු රාජවල්ලභයාය, මොහු චණ්ඩයාය, ඵරුෂයාය, ඇත්තක් තමුත් කීයේ වීනම් මාගේ ජීවිතයට හෝ

අන්තරාය කෙරෙයි, යසසින් හෝ පිරිහෙලයි සිතා) භයාගතියට
යේද, යමෙක් (සුදුස්ස නුසුදුස්ස කළ දෙය කී දෙය අගමුල නො
දැන) මොහාගතියට යේද (මෙසේ) සතර අගතියට යන්නහුගේ
සියලු යසස් ඉසුරු කාලපක්ෂයෙහි චන්ද්‍රයා මෙන් පිරිහීමට යන්
නේය, මෙබඳු දුර්ජන අධර්මිෂ්ටයෝත් අපගේ වෛරීහුය, ඔවුහුත්
මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද රජ්ජුරුවෙනි! යම්
ස්ත්‍රියක් තොමෝ තමාගේ ස්වාමිපුරුෂයාට නොකීකරුව ගෘහ
රාක්ෂියක් සේ දත්කාපියා රවා බලාද, බස්පත් වරදවා කියාද,
ලුණුපැන් බීපුවන්ගේ පිපාසය නොසන්සිඳෙන්නා සේ පරපුරුෂ
යන් සේවනය කෙරේද, ස්වාමිපුරුෂයා නොයෙක් ආයාසයෙන්
රැස්කළ වස්තුව නැති කෙරේද, දෙවතා ස්ථානයෙහි තබා ආදර
කටයුතු ස්වාමිපුරුෂයාට අනාදර කෙරේද, එබඳු ස්ත්‍රීන් කෙරෙහි
මම බලවත් වෛර ඇත්තෙමි, ඔවුහුත් මේ බල්ලා ලවා කවා
මරවමි කීහ. තවද රජ්ජුරුවෙනි! යම් සත්ව කෙනෙක් පස්පව්
කෙරෙද්ද, දසඅකුසල් කෙරෙද්ද නොහොත් යම් ස්ත්‍රියක් හෝ
පුරුෂයෙක් හෝ සියලු සත්වයන් කෙරෙහි කරුණා මෛත්‍රියක්
නැතිව පර ප්‍රාණහිංසා වධ බන්ධනාදිය පිණිස දඬු මුගුරු ගත්
අත් ඇතිව ප්‍රාණීන් නසද්ද, ගෙයි හෝ දොර හෝ ගම හෝ
වල හෝ තුඹු අනුන් සන්තක වස්තුව ඔවුන් විසින් කයින් වචසින්
නොදෙන ලද්දේ බලාත්කාරයෙන් හෝ සොරකමින් හෝ
ගනිද්ද යම් පුරුෂයෙක් දෙමවුපිය භාතෘ භගිනි ආදී නෑයන්ගෙන්
ආරක්ෂාකරන ලද්දාවූ ස්ත්‍රීන් සමඟ හෝ යටත්පිරිසෙයින් මල්දමක්
කරපලඳවා මාගේ ස්ත්‍රීයයි නියමිත කරන ලද සස්වාමික ස්ත්‍රීන්
සේවනය කෙරේද, රජපිරිස් ජනපිරිස් නෑපිරිස් සභා ආදීවූ යම්
කිසි තැනකදී එම්බල පුරුෂය! තෝ දන්නාදෙයක් කියවයි සාක්ෂි
විචාළකල්හි තමා නොදන්නා දෙය දනිමි කියා හෝ දන්නා දෙය
නොදනිමියි කියා හෝ නුදුටුදෙය දුටුයෙමිකියා හෝ දුටුදෙය නුදු
ටුයෙමි කියා හෝ තමා උදෙසා හෝ අනුන් උදෙසා හෝ යම්කිසි
උපකාරයක් පිණිස හෝ අනුපකාරයක් පිණිස හෝ යමෙක්
දැන දැන බොරු කියද්ද, ඔවුනොවුන් භෙදකරනු පිණිස මෙහින්
යමක් අසා ඔවුන්ට කීමෙන් ඔවුන්ගෙන් යමෙක් අසා මොවුන්ට
කීමෙන් පෛශූන්‍ය සංඛ්‍යාත කේලාම් කියා යමෙක් ඔවුනොවුන්
භෙද කෙරේද, යම්වචනයක් කීකල ඇසුවන්ගේ ලෙහිඇනි උලක්
සේ දැනේද, සිත් කලකිරේද, සමාධිය බිඳේද, ක්‍රෝධ උපදීද,
වෛර උපදීද, අප්‍රිය උපදීද එබඳු ඵරුෂ වචන යමෙක් කියද්ද,
කටට ආවාක්ම දෙඩමින් ධර්ම විනයෙන් පිටත්වූ සම්ඵප්‍රලාප
සංඛ්‍යාතවූ වැඩ නැති බස් යමෙක් කියද්ද, අනුන්ගේ සම්පත් හා

ඓශ්වර්ය්‍ය දැක, අහෝ මෙබඳුවූ සම්පත් හා ඓශ්වර්ය්‍ය මෝහට කුමටද මට අයිති වීනම් ඉතා යෙහෙකැයි මෙසේ යමෙක් අධික ලොභ සංඛ්‍යාතවූ අභිධ්‍යා සිතද්ද, දුෂ්ටවූ සිතින් මේ සත්වයෝ වරදට පැමිණෙත්වයි විනාසවෙත්වයි නසිත්වයි යන ද්‍රොහ සිත් සංඛ්‍යාතවූ ව්‍යාපාදය යමෙක් සිතද්ද; මෙලොව නැත පරලොව නැත කුසල් නැත අකුසල් නැත එයින් වන සැප දුක්දෙක නැත මවු නැත පියා නැත දෙවියන් නැත බඹුන් නැත බුදුන් නැත දහම් නැත නිවන් නැත නිවන් සඳහා පිළිපදිනා මහණ බමුණු කෙනෙක් නැත කියා යමෙක් මිථ්‍යාදෘෂ්ටි ගනිද, මෙසේ දශ අකුශල කර්මයන් කරන සත්වයෝත් අපගේ වෛරීහුය, ඔවුන් ගැමත් මේ බල්ලා ලවා කවා මරවමි කියා, මෙසේවූ අසත්පුරුෂයන් සාරා බල්ලාමෙහෙයා කඩාකන්නාක්මෙන් දක්වා මනුෂ්‍යයන් භයගන්වා ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ වැදිවෙසය හැර අහස් මැද පුන්සඳ සෙයින් පෙණී ශක්‍රදෙවේන්ද්‍ර විලාසයෙන් සිට ඒ උසීරත නම් රජ්ජුරුවන්ට බණ කියා අවවාද අනුශාසනා කොට රජ්ජුරුවෙනි! බුඩශාසනය පසුබස්නා දැක පෙරලා ශාසනය වෘද්ධි වර්ධනය කරනු සඳහා ආම් කියා බොහෝ මනුෂ්‍යයන්ටද අවවාද අනුශාසනා කොට ශක්‍රදෙවේන්ද්‍රයෝ දිව්‍යලෝකයටම ගියසේක. එතැන් පටන් මනුෂ්‍යයෝ දන ශීලාදිවූ කුශල ධර්මයෙහි පිහිටා දිව්‍යලෝකයෙහි උපන්නාහුය. භික්ෂු භික්ෂුණී සාමණේර සාමණේරීහුද, ධර්මවිනයානුකූලව බුදුන් වදාළ ශාසන ප්‍රතිපත්ති නිර්මල කොට පූරණය කළාහුය, මෙසේ ශක්‍රදෙවේන්ද්‍රයන්ගේ අවවාදයෙන් දහසක් අවුරුදු ශාසනය නිර්මලව නිෂ්කල කව පැවැත්තේය. මෙසේ ඒ මහාකණ්හ ජාතකයෙහි කාශ්‍යප බුදුහුගේ ශාසනය පසුබස්නා දැක මහත්වූ සුනඛ වෙසක් මවාගෙන දෙව්ලොවින් මිනිස් ලොවට අවුත් පවුකරන හැම සතුන් මරා කා විනසමියි හඬගැසූ මාතලීනු නම් මෙකල අප බුදුන්ගේ [illegible] අනඳ මහ තෙරුන් වහන්සේමය, වැදිවෙසින් අවුත් සිට මිනිසුන් කරන පාප කර්මයන් උපායෙන් එපා කොට දෙව්ලොවට ගිය ඒ සක්දෙව් මහරජාණෝ නම් මෙකල මේ ආලවකයාගේ [illegible] යට වැඩමකර වදාළාවූ තුන්ලොවට තිලකවූ මාගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේය.

ඒ ආලවක යක්ෂ තෙමේද කෛලාසකූට පර්වත මස්තකයෙහි සිට එසේ හඬගැසූ ශබ්දය දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලෙහි දෝර දෝර ගැසූ ගෙනගඩ දහස් සුවහස් ගේ පැතිර ගියේය. තුන් දහසක් පමණ යොදුන් ඇති හිමාලයද කම්පාව ගියේයි. (නැවත

ෂතෙම) මේ මහණහු පිඹහරිමි කියා තමාගේ යක්ෂානුභාවයෙන් මහත්වූ සුලඟක් මවාලීය, ඒ සුලඟ සතර දිශාවෙන් නැඟී දෙගව් තුන්ගව් දෙයොදුන් තුන් යොදුන් පමණ ඇති පර්වතයන් කඩා බිඳගෙණ අහසට නැඟී ඊ ඊ ගැසී දුම්කඳනැගෙණ පර්වතයන් හා වනාන්තරයෙහි මහ රුක්මුලින් උදුරාගෙන අලව් නුවරට පැමිණ නොයෙක් ජීර්ණවූ හසති අශ්ව ශාලා සුණුවිසුණු කෙරෙමින් පලසෙවෙලි නන්පිටින් අහස්හි කොළවා හරිමින් පෘථිවිය බඳනාක් මෙන් ධූලි නඟාගෙන එන්නේය. එකල්හි බ්‍රහ්ම සුරාසුරොරග ගරුඬ මනුජ මහාගණීය මහානුභාව ඇති භාග්‍යවතුන් වහන්සේ මේ වාතයෙන් කුරු කුනුඹුවෙකුටවත් උපද්‍රවයෙක් නොවේවයි අධිෂ්ඨාන කොට වදාළසේක. ඒ ප්‍රචණ්ඩවූ වාතය බුදුන් කරා පැමිණ සිවුරු කොනකුදු සොල්වාලිය නොහී විඩාහැරී මට වැඩූ පවන්හැල්ලක්ව ගියේය. ඉක්බිත්තෙන් ආලවක යක්ෂතෙම ශ්‍රමණයා සුලං පහරින් ගොස් කවර සක්වළක වැටී ගියේදෝ හෝයි බලනුයේ උදයගිරි පර්වත මස්තකයෙන් පැනනැංගාවූ ලහිරු මඬලසේ දිලියෙමින් දිව්‍යරත්න පර්‍යඞ්කයෙහි වැඩහුන් ස්වාමිදරුවාණන් දැක දණ්ඩෙන් ගසන ලද නයෙකු සේ කිපී මේ මහණහු සැඩ වතුරේ ගලා මරමි සිතා කල්පාන්ත වර්ෂාවක් සේ මහත් වර්ෂාවක් වස්වාලීය. ඔහුගේ යක්ෂානුභාවයෙන් ඒ මේඝය මතුමත්තෙහි ශතපටල සහශ්‍රපටලාදී අනේක ප්‍රභේද ඇති වලාහකයෝ නැගී දසදිග මේඝගර්ජනාපතුරුවා අකුණු සෙණ විදුලිය ගසගසා තල්කඳ පොල්කඳසා වැසිපොද ඇති මහත්මහත් දියැප්සා බුබුළුඇති යොදුන්ගණන් උස පෙණපිඬුඇති ඒ සා මහත් ජලධාරා වේගයෙන් මහපොළොව සාරාගෙන දිවන්නාසේ නොයෙක් තුරු මුලිනුදුරා ගලාගෙන බුදුන් කරා පැමිණ ස්වාමිදරුවූ බුදුන්ගේ සිවුරෙහි පිනිබිඳකින් තෙමෙන පමණ තැනකුත් තෙමාලිය නොහී අන්තර්ධානව ගියේය. ඉක්බිත්තෙන් ආලවක යක්ෂතෙම ශ්‍රමණයා සැඩවතුරෙන් ගෙන ගොස් කවර මුහුදක වැටී ගියේදෝ හෝයි අද මාගේ ගමට ගිය රිසි පළා ගියේදෝ හෝයි බලනුයේ පක්ෂොපක්ලේශයන් කෙරෙන් විනිර්මුක්තවූ පූර්ණචන්ද්‍රයාගේ දිලිසෙන්නාවූ ස්වාමිදරුවාණන්ගේ ශ්‍රීමුඛමණ්ඩලය දැක නියපිට ප්‍රහාර ලත් මත්ත හස්තියෙකුසේ කිපී අද මොහු මිරිකා සුණුවිසුණුකොට හරිමි සිතා ගිනිගෙන දිලිහෙන මහත් පර්වත වර්ෂාවක් වස්වාලිය. ඒ ගිනිගෙන දිලියෙන යොදුන්ගණන් උස ඇති පර්වතයෝ ගලින් ගල වැදගන්නා හඬින් අහස් පොළෝදෙක දෙදුරුකෙරෙමින්බුදුන් කරා පැමිණ බුද්ධානුභාවයෙන් ඒ පර්වත වර්ෂාව මල්පඬු සේ බුදුන්

වට සැදී ගියේය. ඉක්බිත්තෙන් ආලවක යක්ෂ තෙම මේ කිමෙක් දෝ හෝයි ශ්‍රමණයා පර්වතයෙන් සුණු විසුණු ව ගියේ දෝ හෝයි මාගේ විමානයට වැදහිඳීමට ආරිසි පලා ගියේදෝ හෝයි බලනුයේ මාගේ ස්වාමිදරුවාණන්වහන්සේගේ රන්කැඩපතක්සේ දිලියෙන අසදෘශවූ ශ්‍රීමුඛමණ්ඩලය දැක ගින්නටදැමූ ලුණුසෙයින් කිපී මොහුගේ රන්වන්වූ ශරීරය විජ්ජුලතාවක් වැනිව ලෙලදෙන්නා තෙල ශරීරය හා කණ් නාසා කපාහරිමි සිතා ගිනිගෙන දිලියෙන මහත්වූ ආයුධවර්ෂාවක් වස්වාලිය. ඒ එකඅත මුවහත් දෑත මුවහත් ඇති කඩු සොටි අඩයටි තෝමරාදී අනේකවිධවූ ආයුධ වර්ෂාවෝ ආකාශයෙන් දිවඅවුත් බුදුන්කරා පැමිණ නාල සහිත මල්පූජාවක් සේ සැදී ගියාහුය. ඉක්බිත්තෙන් ආලවක යක්ෂතෙම ශ්‍රමණයාගේ මාංශ ශස්ත්‍රයෙන් කැපී වැගිර ගියේ දෝ හෝයි බලනුයේ මාගේ ස්වාමිදරුවාණන් වහන්සේගේ රන්පියුමක් බඳුවූ මූව පියුම් දැක ගින්නට පිදුරුදැමූවාසේ කිපී ශ්‍රමණයා දවා හළුකොට හරිමි සිතා හාත්පසින් ගිනිදැල් නැගී ඇවිලෙන ගිනි අඟුරු වර්ෂාවක් වස්වාලීය. ඒ ගිනිඅඟුරු වර්ෂාව අහසින් අවුත් බුදුන්ගේ ශ්‍රීපාද පද්මය මූලයෙහි පිදූ පද්මරාග මාණික්‍ය පූජාවක් සේ පෙළ පෙළ සැදී ගියේය. ඉක්බිත්තෙන් ආලවක යක්ෂතෙම ශ්‍රමණයා ගින්නෙන් දා අළුව ගියේ දෝ හෝයි මාගේ දිව්‍යරත්න පර්යඞ්කය මස්තකයෙහි හුන්න රසි පලාගියේ දෝ හෝයි සතුටින් බලනුයේ පර්වත මස්තකයෙක්හි බබළන ගිනිකඳක් සේ තමාගේ මඞ්ගල දිව්‍ය රත්න පර්යඞ්ක මස්තකයෙහි බුද්ධ තේජසින් දිලිසි දිලිසී වැඩහුන් බුදුන් දැක ගිනිගත් ලුණු සේ තට තට යන අනුකරණයෙන් දන්තකා ක්‍රෝධයෙන් කිපී ශ්‍රමණයා කලල්මඩ වර්ෂාවෙන් තම්බා හරිමි සිතා ගිනිගෙන දිලියෙන කලල්මඩ වර්ෂාවක් වස්වාලීය. ඒ වර්ෂාව බුදුන්කරා පැමිණ චන්දනකල්කයක් සේ සැදී ගියේය. ඉක්බිත්තෙන් ආලවක යක්ෂතෙම ශ්‍රමණයා කලල්මඩ ගින්නෙන් ඉදී ගිය දෝ හෝ යි බලනුයේ දූරගම්ණිරුවනක් සේ බබළන බුදුන් දැක ක්‍රෝධයෙන් කිපී ගිනිගෙන දිලියෙන මහත්වූ හුණු අළු වර්ෂාවක් වස්වාලීය. ඒ හුණුඅළු වර්ෂාව සර්වඥරාජොත්තමයාණන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි දිව්‍යසුගන්ධ චඳුන්සුණුසමූහයක් සේ බුද්ධපූජාවට පැමිණියේය ඉක්බිත්තෙන් ආලවක යක්ෂතෙම හුණුඅළු උෂ්ණයෙන් ශ්‍රමණයා හණ්මව දා මලේ දෝ හෝයි බලනුයේ සෞම්‍යගුණයෙන් යුත් පුන්සඳමඬලක්සේ වැඩහුන් බුදුන් දැක නැවතත් ගිනිදුටු ඉටි සේ කිපී ගිනිගෙන දිලියෙන හුණුවැලි වර්ෂාවක් වසවාලීය. ඒ ගිනිගෙන දිලියෙන හුණුවැලි වර්ෂාව

අහසින් අවුත් දශබලධාරීවූ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි පිඩු දිමුතු මුතුමාලාවක්සේ සැදීගියේය. නැවිතත් යක්‍ෂ තෙමේම ශ්‍රමණයාහට කුමක්විදෙහෝයි බලනුයේ හාත් පසින් මල් පිපී ගිය ශාලවෘක්‍ෂරාජයක්හුසේ ශොභාමත්ව වැඩහුන් බුදුන් දැක සුලං දුටු ගිනිකඳක් සේ කිපී මේ ශ්‍රමණයා භයගන්වා මුලාකොට එලවමි සිතා භයංකාරවූ චතුරාඞ්ගයන් යුත් ඝනාන්ධකාරයක් මවාලීය. ඒ කාලපක්‍ෂ චාතුර්දශිය ඝනවූ වනඛණ්ඩය මධ්‍යම රාත්‍රිය මේඝපටලය යන චතුරාඞ්ගයෙන් යුක්තවූ භයානකවූ ඒ අන්ධකාරය සර්වඥදිවාකරයාකරා පැමිණ හිරැදුටුඅඳුරක්සෙයින් බුදුරැස්කඳින් විධ්වංශනයව අන්තර්ධානව ගියේය. ඉක්බිත්තෙන් ආලවක යක්‍ෂතෙම කිමෙක්දෝ හෝයි ශ්‍රමණයා අන්ධකාරයෙන් මූර්ඡාව ගියේ දෝ හෝ යි නවම මාගේ දිව්‍ය රත්න පර්‍ය්‍යංකයෙහි හුන්නේ දෝ හෝයි බලනුයේ අහස්තල මධ්‍යයෙහි සහශ්‍ර රශ්මීන් විරාජමානවූ දිනරාජ සංඛ්‍යාත සූර්‍ය්‍ය දිව්‍යරාජයාට හිඳ කියමින්නාක් මෙන් බබලමින් දිව්‍යරත්න පර්‍ය්‍යංකයෙහි වැඩහුන් බුදුන් දැක නොසතුටුව අහෝ මම ප්‍රචණ්ඩවූ වාතයක්ද භයානකවූ මේඝයක්ද, ප්‍රබලවූ පර්වත වර්‍ෂාවක්ද තීක්‍ෂණවූ ශස්ත්‍ර වර්‍ෂාවක්ද, දීප්තිමත්වූ අඞ්ගාර වර්‍ෂාවක්ද, ක්‍ෂාරතරවූ අලු වර්‍ෂාවක්ද, ගිනිසිළුවැනි වැලි වර්‍ෂාවක්ද, එසේම කලල්මඩ වර්‍ෂාවක්ද, ඝෝරවූ ඝනාන්ධකාරයක්ද යන නවවිධ මහ වර්‍ෂාවක් වස්වා මහා යුද්ධයක් කොටත් මේ ශ්‍රමණයා හුන්තැනින් සොලවාලිය නුහුනුයෙමිය, මා කොතෙක් යුද්ධකළත් ඔහට පූජා පිණිසම වන්නේයයි ක්‍රොධාග්නිය නිම්වානත නොගී ඉන් දිලිහී හිස සල සලා දත් කකා රතැස් රවා බලා දුරුව සිටිනා තමාගේ යක්‍ෂ සිවුරඟ සෙනගද බලා කිපී කොළ තෙපි හැම මාගේ සූරවීරකම් සමත්කම් බලා සිටින නීයාවද, තෙල ශ්‍රමණයා වහා ගණුව අනුව සිඳුව බිඳුව බඳුව ගෙනව සුණුවිසුණු කරව පර්වතවල ගසව අප විමන් වැදහුන් පිසි කරව යානොදෙව කියා විධාන කොට එකෙණෙහිම මහ පොළොව පෙරලන්නාක්මෙන් නානාප්‍රකාර ආවුධදරූ භයානකවූ යක්‍ෂසේනාව හා සමග ඝොරවූ යක්හඬින් අහස්පොළෝදෙක බිහිරිකරවමින් සෙනක් වැද ගියා සේ තෙමේත් බුදුන් කරා ගියේය. එකෙණෙහි ඒ කර්කශ සවභාවඇති යක්‍ෂසේනාව හාත්පසින්වටලා ගෙන ශ්‍රමණයා ගණුව අනුව සිදුව බිඳුව විදුව බඳුව කිය කියා නොයෙක් හැර වර්‍ෂාවස්වා අනෙක ප්‍රකාර විකාරකොට බුදුන්ගේ හිස්මුදුනෙන් පනින්නාක් මෙන් සිතත්, එතකුදු උවත් ගිනිගෙන දිලියෙන ලොහකදකට ලංව ගනනොහෙන මැස්සන් සෙයින්

බුදුන්ට ලංවීය නොහී උඩුගංබලා පිහිනන්නන් සැඩ වතුරෙන් පටිගහට ගෙන යන්නා සේ බුදුන්ගේ මෛත්‍රී නමැති සැඩවතුරෙන් පරඞ්මුඛව බැහැර ගියෝය. එසේවුවද යම්සේ වසවර්තිමාරයා තුන්ලෝ වෙවුළුවමින් බෝමැඩ ආ වේලේම (ආ කෙණෙහිම) සටන්කොට පැරද ගියේය. ආලවකයා එසේ නොනැවති සර්වඥයන් වහන්සේ හා සමග අඞරාත්‍රියක් මුලුල්ලෙහි නොයෙක් ප්‍රකාර භය දක්වා අසදෘශවූ යුද්ධ කිරීමෙන් බුදුන් සොලවා ගත නොහැකිසි කෙනෙකුන් විසින් නොදිනිය හැකිවූ තමාගේ චේලායුධය සර්වඥයන් වහන්සේට දමාගසම්හි සිතීය. මේ චේලායුධය ඇතුළුවූ ආයුධපසෙක් ලොකයෙහි විද්‍යමානව ඇත්තාහුය, ඔහු කවුරුදයත්? ශක්‍රයාගේ වජ්‍රායුධය, වෛශ්‍රවණයාගේ ගදායුධය, යමයාගේ නයනායුධය, ආලවකයාගේ චේලායුධය, මාරයාගේ පාරාවලල්ලයි[1], ඉදින් ශක්‍රයෝ කිපී වජ්‍රායුධය මෙරමුදුනෙහි ගැසී නම් එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහමෙර විනිවිද කපාගෙන මෙරපල්ලෙන් නික්මයෙයි. වෙසමුණි රජ්ජුරුවෝ තමන් සෝවාන් වන්නට පළමුවෙන් කිපී හරනලද ඒ ගදායුධය නොයෙක් දහස්ගණන් යක්ෂයන්ගේ හිස්කපාගෙන නැවත හස්ත තලයටම එන්නේය, යමයා තමාගේ නයනායුධයෙන් කිපී රවා බැලූ කල නොයෙක් දහස්ගණන් කුම්භාණ්ඩයන් රත්වූයකඩලෙක ලූ තල සෙයින් පුපුරා නසිති, ආලවකයාගේ චේලායුධය මාරයාගේ චක්‍රායුධය හා සමාන ආනුභාව ඇත්තේය[2] ඉදින් ආලවකයා කිපී තමාගේ චේලායුධය අහසට දමී නම් දෙලොස් අවුරුද්දක් වැසි නොවස්නේය. ඉදින් පොළොවට දමී නම් සියලුම තෘණ වෘක්ෂලතාදිය වියළී සුණුවිසුණුව ගොස් දෙලොස් අවුරුද්දක් මුලුල්ලෙහි තෘණපතකුදු හටනොගන්නේය. ඉදින් සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇති මහාසමුද්‍රයට දමාගැසීනම් සියලුම සමුද්‍ර ජලය රත්වූ යකඩලෙහ ඉසි දියබින්දුවක් සේ වියළීනස්නේය.

---

1 මේ සන්නයෙහි අවිපසෙකැයි තිබෙතුදු “චත්තාරිකිර ආයුධානි ලොකෙ සෙට්ඨානි සක්කස්ස වජිරායුධං වෙස්සවණස්ස ගදායුධං යමස්ස නයනායුධං ආලවකස්ස දුස්සායුධන්ති” ශක්‍රයාගේ වජ්‍රායුධය, වෛශ්‍රවණයාගේ ගදායුධය, යමයාගේ නයනායුධය, ආලවකයාගේ චේලායුධයයි ආයුධ සතරක් වනාහි ලොකයෙහි ශ්‍රෙෂ්ඨයහයි අටුවාවෙහි පෙනේ.

2 මෙහි අන්තැනෙක මාරයාගේ “පාරාවලලලයි” පෙනෙතුදු ‘චක්‍රායුධය” වන නාමය අඨකථාදී පෙළ පොත්වල පෙනේ.

ඉදින් මහමෙර වැනි පර්වතයකට ගැසුවහොත් කඩ කඩ කොට කැපී වැගිර යන්නේය මෙසේ මහානුභාව සම්පන්නවූ වේලායුධය තමාගේ උත්තරීයව තුබූ තැනින් හැරගත්තේය. එකෙණෙහි බොහෝ සේ දසදහසක් සක්වළ ශක්‍රබ්‍රහ්මාදී දෙවියෝ අද අප බුදුහු ආලවකයා විනයනය කොට දමනයකර වදාරණ සේක. අද එහි විස්තර බණකුදු ඇත, අපිදු එතනට බණඅසන්ට යම්හයි වහ වහා දිවඅවුත් මේ මගුල් සක්වළ පුරා සක්වළ ගලින් ඉතිර බඹලොව දක්වා රැස්ව සිටගත්හ. ඇතැම් දෙවිකෙනෙක් යුද්ධ දක්නා පිණිසත් රැස්වූවාහුය, එසේ හෙයින් සියලුඅහස්තලය මල්පිරූ කරඬුවක් සේ සක්වළතල දක්වා දිව්‍ය බ්‍රහ්මයන්ගෙන් පිරීගියේය. ඒ ආලවක යක්‍ෂතෙම පරහිත නිරතවූ චිත්ත සන්තානයෙන් ප්‍රසන්න මෘදුතල ප්‍රතිභරිත සමස්තලෝක සන්නිවාස ඇති පුද්ගලවූ භාග්‍යවත් ලෝකස්වාමීන් වහන්සේගේ සමීපයෙහි අහස උඩ ඇවිද ඇවිද සිටි ශ්‍රමණයා කපාහරිම් සිතා තමාගේ වේලායුධය ප්‍රඥායුධවූ සර්වඥයන්වහන්සේට දමාගැසීය. ඒ වේලායුධය සෙනදහස් සුවහස් එකවිට ගැසුවාසේ භවාග්‍රය දක්වා ගුගුරුවා ගෙන ගොස් සියල අහස්තලය දුම්කඳ හා ගිනිකඳ පතුරුවමින් සියලු ලෝකය ඝොරනාදයෙන් එක් කොලාහල කෙරෙමින් අසනී චක්‍රයක් සේ දිලිහි දිලිහී දුරතික්‍රම චක්‍ර ඇති සර්වඥයන්වහන්සේ කරා පැමිණ ආලවකයාගේ දෘඪිවූ තදමත් බිඳහරණ පිණිස පාපිස්නා කඩක්ව ශ්‍රී සද්ධර්මවර චක්‍රවර්තීවූ ස්වාමිදරුවාණන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි වැටී ගියේය. ඒ දක දසදහසක් සක්වළින් රැස්වූ දෙවියෝ දෙඅත් මුදුන්දී ජිනේන්ද්‍රයාණන් වහන්සේට එකපැහැර සාධුකාර දෙමින් සිට අතින් අත පැහැර සිනාසී පියා ආලවකය තෝ සිංහවික්‍රම කෙරෙම් කියා සිංහරාජයක්හු කරා පැමිණි කැනහිල් බල්ලෙකුසේ අපගේ බුදුන් කරා පැමිණ අපබුදුන් ප්‍රචණ්ඩ වාතයෙන් පරසක්වළ ගැසූසේත් ඉතා යහපත සැඩවතුරෙන් උපුල්වාපී සේත් පර්වත වර්‍ෂාවෙන් සුණුවිසුණු කළ සේත් ආයුධ වර්‍ෂාවෙන් කපා හැරිය සේත් මඩ වර්‍ෂාවෙන් එරවාපු සේත් අලු වර්‍ෂාවෙන් තම්බා හැරිය සේත් වැලි වර්‍ෂාවෙන් යටකළ සේත්, අඟුරු වර්‍ෂාවෙන් දවාහැරියසේත්, අන්ධකාරයෙන් භයකළ සේත් ඉතා යහපත, ආලවකය මේ වික්‍රම තෝ කොයින් උගතිද කිය කියා ආලවකයා වෙහෙසන්ට පටන්ගත්හ.

එසඳ ආලවක යක්‍ෂතෙම, මහත්වූ ලජ්ජාවට පැමිණ බිඳීගිය අං ඇති ගොනෙකු සේද, දළබිඳුනු සර්පයෙකු සේද, තේජස් මදනැතිව මානධ්වජය ඉවත දමා, අහෝ මාගේ ආනුභාව සම්පන්නවූ

වේලාසුධය පවා මේ මහණහු මැඩපවත්වන්නට නොහැකිවිය. මීට කාරණ කිමෙක්දෝ අහෝයි පරීක්ෂා කරණුයේ මේ මහණතෙම මහත්වූ මෛත්‍රී විහරණයෙන් යුක්ත පුරුෂයෙක, මෝහට රොස් උපදවා මෛත්‍රීන් තොරකොට මිස විනාශයක් කළ නොහැක්කේයයි සිතා මෙසේ කීයේය, එසේ හෙයින් "අථඛො ආලවකො යක්ඛො යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං එතදවොච" යි කියන ලදී.

මෙහි අදහස නම්, මහණ තෙපි කුමක් පිණිස මා විසින් අනු නොදන්නා ලදුව මාගේ ගෙට වැද ගේහිමි පුරුෂයෙකු සේ කිසි භයක් ලජ්ජාවක් නැතිව මාගේ අඹුවන් පිරිවරා හුන්නෙහිද; මේ අදත්තාදාන පරිභොගය හා ස්ත්‍රී ස සංසර්ගය කිර්ම තොපගේ මහණකමට සුදුසු නොවෙයි, ඉදින් තෙපි ශ්‍රමණධර්මයෙහිපිහිටි කෙනෙක් නම් වහා මාගේ භවනයෙන් නික්ම යවයි, මෙසේ අසූචි ගෙන සඳමඬල පිරිමදනක්හුසේ නොයෙක් අනුතුරු තෙපුල් බෙණෙමින් "නික්ඛම සමණ" යනාදීක් කීයේය. "නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි, පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි" සමණ, ශ්‍රමණ (භවත් ගෞතම) ය; නික්ඛම ඉති, (නිසඳ ස්ථානයෙන්) නික්ම යවයි කීයේය. භගවා, (ශතපුණ්‍ය ලක්ෂණ ධරත්වාදී අනෙක ගුණගණාඪ්‍යයෙන් යුක්තවූ) භාග්‍යවතුන් වහන්සේ (ඒ අසා); ආවුසො, ආයුෂ්මත්වූ යක්ෂය; සාධු ඉති, යහපතැයි (ප්‍රියතෙපුල් බෙණෙමින්) නික්ඛමි, (දිව්‍යරත්න පර්‍යංකයෙන් නැගිට භවනයෙන් නික්මුණුසේක.

කිමෙක්ද ඔහු එසේ නික්මයනට කීකල්හි සර්වඥයන්වහන්සේ යක්ෂයාට භයින් නික්මුණුසේක්ද, එසේ නැත, යමෙක් තදවීනම් තදකමින් ඔහු ගික්මවාගත නොහැක්කේය, යම් සේ චණ්ඩවූ සුනඛයක්හුගේ නාසායෙහිපිත්කෝෂය බිඳපී කළ ප්‍රචණ්ඩවූයේද; කෑමදීමෙන් මෘදුකමින් කැමති මෘදුබසට කීකරුවේද, එසේහෙයින්ම මෘදුතාවෙන් ඔහු මෘදුවනසේ දැන, ඇත මැත යවයි ප්‍රිය තෙපුල් කියමින් එක වචනයෙන්ම ඔහුගේ තෙපුල් පිළිගෙන අසමසමවූ අසමධුරවූ දශබලධාරිවූ සර්වඥයන් වහන්සේ ඔහුගේ භවනයෙන් නික්ම වැඩිසේක. එකල්හි ආලවකතෙම සිතන්නේ අහෝ මේ ශ්‍රමණයා ඉතා කීකරු කෙනෙක, එක වචනයෙන්ම නික්මිණ, මෙසේ සුවසේ නික්මෙණ මහණහු හා සමග අකාරණයෙහි මම සකල රාත්‍රියමුලුල්ලෙහි යුඩකොට වෙහෙසුනෙමියි, මෘදුමොළොක් සිත් ඇතිව නැවතත් මෙසේ සිතීය, මෙපමණකින් දැනගත නො

හැක්ක, කිමෙක්දෝහෝයි මේමහණ සුවචකමින් නික්මිණිදෝහෝ ක්‍රෝධකමින් නික්මිණිදෝහෝයි ඒ විමසා බැලුව මැනවයි සිතා නැවතත් බවනයට ඇතුළත් වන්ට කියනුයේ; සමණ; ශ්‍රමණය; පවිස ඉති, (මාගේ භවනයට) ප්‍රවිෂ්ට වෙවයි කීයේය; භගවා, (ත්‍රිභුවනෛකප්‍රදීපායමානවූ) සර්වඥයන්වහන්සේ; ආවුසො, ඇවැත්නි; සාධු ඉති, යහපතකියා; පාවිසි, (ඔහුගේ සිත දූන ප්‍රියවචනයෙන් කථාකොට එක වචනයෙන්ම ඔහුගේ භවනයට) ප්‍රවිෂ්ටවූසේක. "දුතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි, පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි" දුතියම්පිඛො, දෙවෙනිවරද; ආලවකො යක්ඛො, ආලවක නම් යක්ෂතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, (නිසද්‍ය ස්ථානයෙන්) නික්ම යවයි; එතං, ශ්‍රමණ (ව්‍යවහාර) වචනයෙන් (නිෂ්ඨිත කොට); ආවොච, කීයේය; භගවා, (සුර නර නයන රසායනවූ) භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, (පින්වත්) ඇවැත්වූ යක්ෂය; සාධුඉති, යහපතැයි (ප්‍රිය නෙපුල් බෙණෙමින්); නික්ඛමි, (හුන් තැනින්) නික්මුණුසේක; (නැවතත්) සමණ, ශ්‍රමණය; පවිස ඉති, (ප්‍රවරවිමානය ඇතුළට) යවයි කීයේය; භගවා, (උපමා විෂයාතික්‍රාන්තවූ) භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, (පින්වත්) ඇවැත්වූ යක්ෂය; සාධු ඉති, යහපත කීයා; පාවිසි, (ප්‍රවර විමානයට) ප්‍රවිෂ්ටවූසේක. "තතියම්පිඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි; පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි" තතියම්පිඛො, තුන්වෙනිවරද; ආලවකො යක්ඛො, (කර්කශ ස්වාභාව ඇති ඒ) ආලවක නම් යක්ෂතෙම; භගවන්තං, (ප්‍රවරොදිත විපුල ශාක්‍ය කුල තිලකායමානවූ) සර්වඥයන් වහන්සේට; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, (මාගේ භවනයෙන්) නික්ම යවයි; එතං, මේ වචනය; අවොච, කීයේය; භගවා, (විපුලතර විමල කීර්ති සාගරවූ) බුද්ධරජාණන් වහන්සේ; ආවුසො, (පින්වත්) ඇවැත්නි; සාධු ඉති, යහපත කියා; නික්ඛමි, (භවනයෙන්) නික්මුණුසේක; (නැවතත්) සමණ, ශ්‍රමණය; පවිස ඉති, (භවනය ඇතුළට) ප්‍රවිෂ්ටවෙවයිකීයේය; භගවා; (වීර ධීර ගුණ ප්‍රවරාකරවූ) භාග්‍යවතුන්වහන්සේ; ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, යහපත කියා; පාවිසි, (විමාන ඇතුළට) වැඩවදාළසේක.

චතුත්ථම්පිඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති, නඛ්වාහංතං ආවුසො නික්ඛමිස්සාමි, යං තෙ කරණීයං තං කරොහීති.

චතුත්ථම්පි ඛො, සතරවෙනිවරද; ආලවකො යක්ඛො, ආලවක නම් යක්ෂතෙම; භගවන්තං, (කරුණාසීතලහෘදයානන්දකරවූ) භාග්‍ය වතුන්වහන්සේට; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, (නිසද්‍ය ස්ථාන යෙන්) නික්ම යවයි; එතං, මේ වචනය; අවොච, කීයේය.

(එකල්හි ශාක්‍යසිංහ කරුණානිධාන අසරණ සරණ සරණ ගත වජ්‍රපඤ්ජර පරදුක්ඛ දුක්ඛිත ත්‍රිභුවනෛකතිලකවූ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ වදාරණසේක්) ආවුසො, (පින්වත්) ඇවැත්වූ යක්ෂය; අහං, මම; නඛොනික්ඛමිස්සාමි, නොනික්මෙමි; තෙ, තා විසින්; යංකරණීයං, (අභිප්‍රායානුකූලවූ) කටයුතු යම් කෘත්‍යයක් ඇත්තේවීනම්; තං කරොහි ඉති, ඒ (තාගේ චිත්තාභිමතාර්ථයක්) කරවයි වදාළසේක.

ඒ ආලවකනම් යක්ෂතෙම මෙසේ නැවතනැවතත් කරුණාව මෙන් ප්‍රඥව ඇති භාග්‍යවත් සර්වඥයන් වහන්සේගේ සුවචභාවය පරීක්ෂා කරණු පිණිස දෙතුන්යලක් නික්ම යව මහණ මෙසේ විමන්ට වදුව මහණයි කීහ, බුදුහු ඔහුගේ අදහස් දැන එසේම කළසේක. ඉදින් එසේ නොකළසේක් වීනම් සවභාවයෙන්ම තද සිත්ඇති ඔහුගේ සිත ඉතා තදව ගොස් ධර්මදෙශනාව පිළිගන්නට අසමර්ථවන්නේය, එබැවින් යම්සේ මෑණියෝ හඬන්නාවූ පුතක්හට යම් යම් දෙයක් ඔහු කැමැත්තේද ඒ ඒ දෙය දී හෝ ඔහු කැමැති දෙයක් කිරීමෙන් හෝ සංසිඳුවා නලවාද, එසෙයින්ම භාග්‍යවතුන් වහන්සේ කෙලශ පීඩාවෙන් පීඩිතව කෙලෙස් හඬින් හඬන්නාවූ යක්ෂයා සංසිඳුවා නලවනු පිණිස යම් දෙයක් ඔහු කී ද එලෙසම කර වදාළසේක.

නවද යම්සේ කිරිමවු කිරිනොබොන දරුවෙකුට යම්කිසිදෙයක් දී නලවා කිරිපොවයිද, එසේම බුදුරජාණන්වහන්සේ යක් බිළිඳු හට ලොව්තුරා දහම් නමැති අමාකිරි පොවනු කැමතිව ඔහු කැමති දෙය කිරීමෙන් නලවා වදාළසේක. තවද යම්සේ ලබු වෙක්හි චතුමධුර පුරවනු කැමති පුරුෂයෙක් ලබුමද හැර අභ්‍යන්තරය ශුද්ධ කෙරේද, එසේම සර්වඥයන් වහන්සේ යක්ෂයාගේ සිත්හී ලොව්තුරා දහම් නමැති සිවුමිසුරු පුරවනු කැමතිව ඔහුගේ චිත්තාභ්‍යන්තරයෙහි ක්‍රෝධමල සෝදනු සඳහා තුන්යලක් නිෂ්ක්‍රමණය ප්‍රවෙශනය (පිටත්ව ඇතුළත්වීම) කර වදාරමින් යක්ෂයා මෘදුකර වදාළසේකැයි දතයුතු. එකල ආලවක යක්ෂයතෙම සිතනුයේ මේ මහණ ඉතා සුවච කෙනෙක, නික්මයවයි කී කල නික්ම

යෙහි ඇතුළට වදුවයි කී කල ඇතුළට වදියි. එහෙයින් ඉතා යෙහෙකැයි මේ ශ්‍රමණයා මෙලෙසම සකල රාත්‍රිය මුලුල්ලෙහි ඇවිදුවා කලාන්තකොට පියා දෙකකුල් ගෙන මුහුදින් එතර දමා, යසමියි පවිටුවූ සිතක් උපදවා සතරවෙනිවරත් නික්මයව මහණයි කීහ. එකල්හි පරසිත් දන්නා මාගේ ස්වාමිදරුවාණෝ ඔහුගේ විතර්කය දැන මම තාගේ වචනයට මේ විමානයෙන් නොනික්මෙමි, යමක් තා විසින් කොටහැකිද ඒ කරවයි වදාළසේක, එසේ හෙයින් "නඛ්වාහං තං ආවුසො නික්ඛාමිස්සාමි යං තෙ කරණීයං තං කරොහි" යි වදාරණ ලදී.

එකල්හි ආලවක යක්‍ෂතෙම සිතනුයේ අහෝ මම මහත් මෙර පලන විදුරට මෙලෙසැයි සිතන්නාක්හු මෙන් මහත් තදකම් ඇති මේ මහණ ඉතා මෘදු කෙනෙකැයි සිතිමි, බඹලොව උස මැනගණිතත් මොහුගේ පමණ නොදත හැක්කේය, මාගේ මහානුභාව සම්පන්න වේලායුධයත් මොහුගේ පාපිස්නා කඩක් කොළේය, මෙයින් මත්තෙහි කුමක් කෙරෙම් දෝ හෝයි පරීක්‍ෂා කරණුයේ කිසිවෙක්හු විසින් විසඳිය නොහැක්කාවූ අති ගම්භීර ප්‍රශ්නයක් විචාරමි සිතීය, ඒ ප්‍රශ්නය ඕහට කවරෙකු කෙරෙන් ඉගෙණීමට ආයේද යන මෙහි භාවය මෙසේ දතයුතු. කෙසේද යත්?

ආලවකයාගේ මවුපියෝ කාශ්‍යප බුදුන් ආශ්‍රය කොට ප්‍රශ්න අටකින් යුක්තවූ ගාථා දෙකක් අර්ථ හා සමග උගත්තාහුය. ඔව්හු ආලවකයා බාලකාලම ඒ ප්‍රශ්න අටම උගන්වා මළාහුය, කල්යාම කින් ආලවකයාහට එහි අර්ථ සිහිමදව ගොස් ගාථා දෙක පමණක් සිහිවැටෙයි. එකල්හි ඔහු අහෝ මාගේ පිතෘදායාද ප්‍රශ්නයෝ නොනසිත්වයි සිතා දැහිඟුලෙන් රන්පතෙක්හි ලියා තබාගෙන අහසින් යන්නාවූ ඉර්ධිමත් තාපස පරිබ්‍රාජකයන් තමන් විමන්පැමිණීවිට ඔවුන්අතින් ඒප්‍රශ්නයන් විචාරා කියාගත නොහෙන කල්හි මහා විනාශයට පමුණුවයි, කෙසේද යත් ඉර්ධි මත් තාපස පරිබ්‍රාජකයෝ අහසින්යෙමින් ආලවකයාගේ විමානය දැක මේ රන්විමනෙක්දෝ රිදීවිමනෙක්දෝ මැණික් විමනෙක්දෝ මිනිස්ලොව මෙවැනි විමනෙක් ආශ්චර්‍යනියාය, බැලුව මැනවැයි සිතා විමානයටවුත් තාපසයන් අතින් ඒ බුද්ධ විෂයවූ ප්‍රශ්නයක් විචාරා විසඳිය නොහැකිවූකල්හිමතුමාගේ විමනටඑනගමන් වලක් වමි සිතා චිත්තවික්ෂෙපාද නොයෙක් අනයව්‍යසනයට පමුණුවයි. අමනුෂ්‍යයෝවූකලි භයානකවූ රූපදැක්වීමෙන්ද, සියුම්වූ අනක් මවා මුඛයෙන් හෘදයට පොවා හෘදවස්තුව මර්දනයකිරීමෙන්(මිරිකී මෙන්)ද, මිනිසුන් උමතු කෙරෙති, මේ ආලවකයා වනාහි ඉර්ධි

මත් තාපසයෝ භයංකර රූපයට භය නොගනිතියි දැන තමාගේ සෘද්ධ්‍යානුභාවයෙන් සියුම්වූ ආත්මභාවයක් මවාගෙන තාපසවරුන්ගේ හෘදයට වැද හදවත පිරිමදියි. එකල්හි චිත්තසන්තතිය නොපවත්නේය, චිත්තයාගේ අසණ්ඨානයෙන් උමතුවෙති, එකල්හි මෙසේ උමතුවූ ඔවුන්ගේ ළය හෝ පලයි, දෙකකුල් ගෙන මුහුදින් එතර දමාගසයි, මේ කාරණයෙන් සර්වඥයන් වහන්සේටත් එසේම කෙරෙමිසිතා "පඤ්හංතං සමණපුච්ඡිස්සාමි" යනාදීන් කීයේය. පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි සචෙමෙ න ව්‍යාකරිස්සසි චිත්තං වා තෙ ඛිපිස්සාමි හදයං වා ඵාලෙස්සාමි පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපිස්සාමීති.

සමණ, ශ්‍රමණය; තං, තා අතින්; පඤ්හං පුච්ඡිස්සාමි, (අන් කෙනෙකුන් විසින් විසඳිය නොහැක්කාවූ) ප්‍රශ්නයක් විචාරමි; සචෙ, ඉදින්; මෙ, (මා විසින් විචාරණලද ඒ ගාම්භීරවූ ප්‍රශ්නය) මට; න ව්‍යාකරිස්සසි, (ප්‍රකාශකොට) නොකීයෙහි වීනම්; තෙ, තාගේ[1]; චිත්තං වා, සිත හෝ; ඛිපිස්සාමි, (වික්ෂෙපයෙන්) කීපෙමි හෙවත් පෙරලමි; හදයංවා, (තාගේ හෘදය වස්තුව) ලය හෝ; ඵාලෙස්සාමි, ප්‍රදාලනය කෙරෙමි (පලමි ; පාදෙසුවාගහෙත්වා, පාද වඥ්‍යු හෝ (ග්‍රහණයකොට) ගෙන; පාරගඞ්ගාය, (පරසමුද්‍රයට) සමුද්‍රයෙන් එතරට නොහොත් සරසක්වළ; ඛිපිස්සාමීති, දමන්නෙමියි කීයේය.

ඉක්බිති තමන්වහන්සේගේ ආනුභාව දක්වන බුදුරජාණන් වහන්සේ "නඛ්වාහන්තං ආවුසො" යනාදී පාඨය වදාළසේක. නඛ්වාහන්තං ආවුසො පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය යො මෙ චිත්තං වා ඛිපෙය්‍ය හදයං වා ඵාලෙය්‍ය පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපෙය්‍ය අපිච ත්වං ආවුසො පුච්ඡ යදාකංඛසීති.

ආවුසො; (පින්වත්වූ) ඇවැත් ආලවක යක්ෂය; සදෙවකෙ, (චතුර්මහාරාජිකාදී සවැදෑරුම්වූ කාමාවචර) දෙවියන් සහිතවූ; සමාරකෙ,[2] (සවන් කාමාවචරයාගේ වශයෙන්) මාරයා සහිතවූ;

---

1 චිත්තං වා ඛිපිස්සාමි, හෘදයවස්තුව මර්දනාදියෙන් චිත්තෝන්මාදය හෝ කෙරෙමි. සමහර

2 දෙවපුත්‍ර ක්ලේශාභි සංස්කාරස්කන්ධ මෘත්‍යුසංඛ්‍යාත පඤ්ච මාරයන් සහිතවූ, සමහර

සබ්‍රහ්මකෙ, (සකල රූපාවචර) බ්‍රහ්මයන් සහිතවූ; ලොකෙ, අවකාශ ලොකයෙහිද; සස්සමණබ්‍රාහ්මණියා, (ශාසන ප්‍රතිපක්ෂ) ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ; සදෙවමනුස්සාය, (රජදරුවෝය තිසෝවරුය යන සම්මුති) දෙවියන් හා (අවශෙෂ) මනුෂ්‍යයන් සහිතවූ; පජාය, සත්ත්වලොකයෙහිද; යො, (මේ සමස්තලොකයෙහි) යම් සත්ත්වයෙක්තෙම; මෙ, මාගේ; චිත්තංවාඛිපෙය්‍ය, චිත්තනාත් පාටනය හෝ කෙරේද (සිත හෝ පෙරලාද); හදයංවා ඵාලෙය්‍ය, හෘදයවස්තුව හෝ ප්‍රදාරණය කෙරේද (ලය හෝ පළාද); පාදෙසුවා ගහෙත්වා, පාදවන්දය (ග්‍රහණය කොට) ගෙන; පාරගඞ්ගාය ඛිපෙය්‍ය, සමුද්‍රයාගේ පරතෙරට නොහොත් පරසක්වළට දමාද; තං, එසේවූ සතෙකු; අහං, මම; නපොපස්සාමි, නොදක්මියි (වදාර ප්‍රශ්න විචාරීමෙහි උත්සාහ උපදවන බුදුහු); අපිච, වැලිදු (එතකුදුවුවත්); ත්වං, තෝ වූකලි; ආවුසො, (පින්වත්වූ) ඇවැත් යක්ෂය; යදි, ඉදින්; ආකඞ්ඛසි, කැමැත්තෙහි වීනම්; පුච්ඡ, විචාර; (විචාරව ප්‍රශ්න විසර්ජනය මටභාරයයි) ඉති, මෙසේ වදාළසේක; (නොහොත්) යං, යමක් (විචාරන්ට); ආකඞ්ඛසි, කැමැත්තෙහිද; තං, ඒ සියල්ල; පුච්ඡ, විචාර; තව විසඳමියි සර්වඥ ප්‍රවාරණයෙන් පැවරූසේක.

මෙහි "සදෙවකෙ" යන්නෙහි අභිප්‍රායනම් එම්බා ආලවකයෙනි තෙපි තබා තොපමත් රජව සිටි චාතුර්මහාරාජිකය තාවතිංසය යාමය තුසිතය නිර්මාණරතිය යන පඤ්චකාම ස්වර්ගයෙහි දෙවියන් අතරත් මාගේ චිත්තනාත් පාටනය කරන්නට සමර්ථ කෙනෙක් නැත්තේයයි වදාළ නියාවය, එකල්හි එදා දශසහශ්‍රි ලොකධාතු වෙන් රැස්ව සිටි දෙවියන්ගෙන් ඇතැම් දෙවතා කෙනෙකුන්ට මෙබඳු විමතියෙක් උපන, කිමෙක්දෝ භාග්‍යවතුන් වහන්සේ දෙව ශබ්දයෙන් දෙවියන් බණවා වදාළසේක. වසවර්තිමාරයා තෙමේ මහානුභාව ඇත්තේය, සදෙව්ලොවට ඊශ්වරය, සදෙව්ලොව දෙවියන් මැඩපවත්නේය, පසමිතුරන් නසන ලද්දේය, අධර්මයට කැමැත්තේය, කෲරවූ කර්මාන්ත ඇත්තේය, ඒ මාරතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ චිත්තනාත්පාටනාදියක් කරන්නට සමර්ථවන නියාදෝ හෝයි කියා ඔවුන්ට උපන් විමති විනොදනය කරනු පිණිස, සමාරකෙ යනුවෙන් වදාළසේක, එකල්හි සමහර දෙවතා කෙනෙකුන්ට කිමෙක්දෝ මහාබ්‍රහ්මතෙම මහානුභාව ඇත්තේය, එකාංගුලියෙන් දහසක් සක්වළ එකාලොක කෙරෙමින් දසඟිල්ලෙන් දශසහශ්‍රි ලොකධාතුව එකාලොක කෙරෙති, නිරන්තරවූ ධ්‍යාන සමාපත්ති සැප විඳිති, එබඳුවූ මහාබ්‍රහ්මතෙම

බුදුන්ගේ විජෙතාත්පාටනය නොකෙරේදැයි කියා කුකුසෙක් උපන්නේය, ඔවුන්ගේ කුකුස් විනෝදනය කරනු පිණිස "සබ්‍රහ්මකෙ" යනුවෙන් වදාළසේක. තවද එදා රැස්වූ දෙවියන් අතුරෙන් ඇතැම් දෙවතාකෙනෙකුන්ට මෙබඳු විමතියෙක් උපන මේ භාග්‍යවත්තෙම මිනිස් කෙනෙක, තවත් ලොකයෙහි ශාසනයට ප්‍රතිපක්ෂවූ (පසමිතුරුවූ) මහත් මන්ත්‍රාදි බල ඇත්තාවූ බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත, ඔවුනු බුදුන්ගේ විජෙතාත් පැටිනය කරන්නට සමර්ථ නොවෙද්දැයි කියා උපන් විමතිප්‍රහාණය කරනු පිණිස, සස්සමණ බ්‍රාහමණියා, යනුදු වදාරා නැවතත් සාමාන්‍යවූ, පජාය සදෙව මනුස්සාය, යන්නෙන් සියලු දෙව් මිනිස් ගරුඩ ගාන්ධර්ව නාග සුපර්ණ යක්ෂ රාක්ෂස සුරාසුර සිද්ධ විද්‍යාධරාදි සකල ප්‍රජාවන් අතුරෙහිත් එබඳු පුද්ගලයෙකු නැති බව හඟවනු පිණිසත් මේ ප්‍රශ්නය ඇසීමෙහි ප්‍රශ්න ජනනය කරවමින් විචාරා ආලවකයයි වදාළසේක. අහෝ මහාපෘථිවියසේ විපුලතා ඇති අපබුදුරජාණන්වහන්සේගේසාධාරණගුණයක්ඇසුවමැනව, මෙසේ තමන් වහන්සේගේ ලය පළමි යනාදින් ක්‍රෑරතර වචන කියා මරන්නටම උත්සාහකරන ආලවකයා කෙරෙහිද සේරිවාණිජ ජාතකයෙහි රන්තලිය නිසා බැඳි වෛරයෙන් පස්කපක් මුලුල්ලෙහි ධර්මපාලජාතකාදී නොයෙක්ජාතියෙහි තමන්වහන්සේ නසන්නට වධකර උත්සාහකොට අවුත් දූන් බුදුවූ ජාතියෙහිත් තමන් වහන්සේට නැවීමෙන් ලඟ පැවිදිවත් පෙර වෛරයෙන් යෙදී බුදුගුණ සලකා ගත නොහී තමන් මරා බුද්ධරාජ්‍යය ගණිමි සිතා තමන් විද මරා හෙලනසේ දුනුවායන් යෙදීමෙන්ද ගිජ්ඣකූට පර්වතයෙහි එකලාව සක්මන් කරන්තාවූ තමන් වහන්සේගේ හිසට ගල් පෙරළීම් ආදිවූ අනෙකප්‍රකාර ක්‍රෑර විධ ප්‍රයොගයෙඳු දෙව්දත් නම් මහ තෙරහු කෙරෙහිද ගුරුන් බස් ගෙන ඇඟිලි මාලාවෙන් ගුරුන් පුදමි සිතා දුටුදුටුවන්ගේ ඇඟිලි කපමින් ගොන ගොතා අංගුලිමාල යක්ෂයෙකැයි ප්‍රසිද්ධව දඹදිව් විනාශ කෙරෙමින් ඇවිදිනා කල්හි එක් දිනෙක ඔවුන්ගේ වැදූ මෑණියන්ගේ අනකපා අපාය භාගීවන බව දත් භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ඔහු දුකින් මුදනු පිණිස ඔහු කෙරෙහිම කාරුණාවෙන් ඔහු කරා වැඩමදාල තමන්වහන්සේ දක නුදුව මහණ නුදුව මහණැයි කිය කියා සුගත් ඇඟිලි කපන්නට ලුහුබැඳ දිවගත් අංගුලිමාල නම් මහ සොර්හු කෙරෙහිද, පාපමිත්‍රවූ අඥාන දෙවදත්තයාගේ සංසර්ග දෝෂයෙන් අජාත ශත්‍රු නම් නරේන්ද්‍රතෙම නාලාගිරි නම් ගජේන්ද්‍රයා සුරා සොළොස් කලයක් පොවා මත් කොට තමන් පෙරමගට ඇරිය කල්හි ඇත්රජ එදා රා මදින්

මත්ව ඇත්ගලබිඳ සුණුවිසුණුකොටපියා යදම් හා රැහැන් මකුණු ගුය විපාරවත් සරු නොකොට කඩාගෙන දුවු දුවු ගවමහිසා දීන් හා මිනිසුන් හැක මරා රිදී කඳක් වැනි සෙවත දහනයන් රත්පැහැ කෙරෙමින් අලාතචක්‍රවත් රතැස් බමව බමවා කප් ගින්නක්සේ භයංකාර රූපයෙන් සෙනහඬක්සේ දහස්ගණන් හඬගසා ගුගුරාපියා රජගහනුවර පෙරලෙනනාසේ එකකොලා හලකෙරෙමින් තමන්වහන්සේ හැනමරනට පැන්නූ (දිවආවාවූ) ධනපාල නම් නාලාගිරිහු කෙරෙහිද, සාරාසංඛ්‍ය කල්පලක්‍ෂයක් මුලුල්ලෙහි තමන්වහන්සේගේ බුඩරාජ්‍යය සාදදීමට අන්‍ය නොනාපකාර සහායව ප්‍රාණාධික ප්‍රේමයෙන් සියලු උපකාර කෙරෙමින් ආවාවූ යසෝධරා දේවී තමන්ට දකොට වැදූ කල්පලක්‍ෂයක් මුලුල්ලෙහි තමන් වහන්සේට පුත් වන්නට ප්‍රාර්ථනාකොට අවුත් ඖරසපුත්‍රවූ රාහුල නම් පුත්රුවන කෙරෙහිද, යන මේ සියල්ලන් කෙරෙහි එකාකාරවූ කාරුණා මෛත්‍රියක් ඇතිසේක්මය, මේ සත්‍ය වචනය හෙතුකොට ගෙන මෙතැන්හි ශ්‍රී සද්ධර්ම ශ්‍රවණයපිණිස පැමිණියාවූ ශුඩ ශ්‍රඩාවනන නරනාරිජනයාට උභය ලොකාර්ථ සිංසිඞි සංඛ්‍යාත ජයමඞ්ගල්‍යයක් වේවා. එසේ හෙයින් කියනලදී.

වධකෙ දෙවදත්තම්හි චොරෙ අංගුලිමාලකෙ,
ධනපාලෙ රාහුලෙචෙව සබ්බත්‍ථසමමානසො.

මෙසේ අනන්‍යසාධාරණවූ අනනත ගුණ ඇති බුදුන්ගේ රහ නොදන ආලවකයා ලයපළම කියා ප්‍රලාප මැන දෙඩවන කල තදමන් ගජකුම්බ පළන රන්අකුස්සක් වැනිවූ සර්වඥයන් වහන්සේ ඔහුගේ ඒනොදැනුම බස්අසා යම්හෙයකින් බුදුවරයන්ටදුන් ලාභයකට හෝ බුදුන්ගේ ජීවිතයට හෝ සර්වඥතාඥානයට හෝ ව්‍යාම ප්‍රභාමණ්ඩලයට හෝ කිසිකෙනෙකුන් විසින් අන්තරායක් නොකල හැකිවේද, එහෙයින් ඔහට තමන් වහන්සෙගේ සාධාරණවූ බුඩානුභාවය දක්වමින්, එම්බල ආලවකය ඒ මාගේ චිත්තවික්‍ෂෙපය කොට උමතු කරවන්ට හෝ හෘදය පලන්ට හෝ දෙකකුල් ගෙන මුහුදින් එතර ගසන්ට හෝ සමර්ථයෙකු තුන්ලොවම නැති බව මාගේ සර්වඥතාඥානයෙන් දකිම, ඉදින් තො යම් ප්‍රශ්නයක් අසනු කැමැත්තෙහි වීනම් ඒ අසාගනුවය කියා ශ්‍රමණ බ්‍රාහ්මණ දෙව මාර බ්‍රහ්මාදී සකලක්හටන අවිෂයවූ සර්වඥ ප්‍රවාරණයෙන් පවරා වදාළසේක; ඒ එසේම, අහෝ මෙසේ දුඃඛය සමුදය නිරොධය මාර්ග්‍ය යන චතුරාර්‍ය්‍යසත්‍යධර්මාදී සකලඥෙය මණ්ඩලය තමන්වහන්සේගේ ශ්‍රීහස්තතලයෙහි සුංකන රෙඛාවක් මෙන් දුන සර්වලොකාග්‍ර පුද්ගලව වැඩසිට සර්වඥ ප්‍රවාරණයෙන් පැවරීම ආශ්චර්‍ය්‍යයෙක නොවෙයි, කුමක් හෙයින්ද යත්? තමන වහන්සේ බොධිසත්ව භූමියෙහිදී ප්‍රදෙශික ඥානයෙහි සිට සකලෙක

බරණැස් රජහුගේ පුරෝහිතයන් නිසා බ්‍රාහ්මණදේවින් කුස ඉපිද ජොතිපාල කුමාරයාය යන නමින් ප්‍රසිද්ධව සියලු ධනුශිල්පයෙහි කෙළපැමිණ බරණැස් රජහට ශිල්ප දක්වන දිනයෙහි බරණැස් නම් රජ්ජුරුවෝ පුත ජොතිපාල කුමාරයෙනි ශිල්ප දක්වයි කී කල්හි ක්‍ෂණවෙධිය, වාලවෙධිය, ශබ්දවෙධිය, ශරවෙධිය යන ධනුර්ධරයෝ සතර දෙනෙක් සතරදිග හිඳුවා එකෙකුට තිස්දහස බැගින් එක්ලක්‍ෂ විසිදහසක් හීගස් දෙවා මහබෝසතාණෝ විදුරු එබූ නාරාචයක් අතින් ගෙන ඔවුන් මැද හිඳ ධනුර්ධර වරුණි තෙපි මා එකවිටම විද්ද මැනවැයි කීසේක. ධනුර්ධරයෝ එ අසා දෙවයෙනි ජොතිපාල කුමාර තෙම මතු ලොවට බොහෝ වැඩ ඇති කෙණෙක, ඉතා තරුණයෝය, එසේ හෙයින් අපි නොවිදුම්හයි කීහ. ජොතිපාල කුමාරයෝ එබස් අසා ධනුර්ධර වරුණි තෙපි මාගේ ව්‍යක්තකම් නොදනිති, තෙපි තොපගේ ඇතිතාක් සමර්ථකමින් මා එකවිටම විද හෙළුව මැනව, මම ගේ වැද්ද නොදෙමි කියා නාරාචය නියපිට කෙළවමින් රක්තවස්ත්‍ර විලසිතව අසුරහටයෙකුසේ හිඳ ධනුර්ධරයෝ සතර දෙන විදි ශර සතර නාරාචයෙන් රැකපියා පගිලියෙන් පගිලිය නොවරදවා සතර මූණත් ඔවුන් දිශාවට යොමුකොට බැලූසේක. දෙවෙනි වර විදිශර සතරත් එසේම රැකපීසේක. මෙම ක්‍රමයෙන් ධනුර්ධරයෝ ක්‍ෂණ ක්‍ෂණයෙහි විදිශරයන් නාරාචයෙන් රැක හෙලමින් බොයි වේදිකාවක් බඳුන්තාක්හුසේ රාසිකොට සඳ එක්ලක්‍ෂ විසිදහසක් පමණ හැම හීගස්ම නිමාවට ගිය කල්හි, හීගස් රාසිය මුදුනට නැගී ධනුර්ධරයන් මුහුන බලා එහින් බිමට පැන බරණැස් රජුන් පැදසිටිසේක. ඒ දැක ප්‍රසන්නවූ බරණැස් රජ්ජුරුවෝ පුත ජොතිපාල කුමාරයෙනි මෙ කිනම් ශාස්ත්‍රයෙක්දැයි විචාළසේක. දෙවයෙනි මේ ශරභඞ්ග නමැයි කීසේක. එසේ වීනම් තෙපි අද පටන් ශරභඞ්ග නමැයි වදුරා අනිකුදු ශිල්පයක් දක්වයි කීසේක. මහබෝසතාණෝ යහපතැයිකියා ධනුර්ධරයින් සතරදෙනා සතර දිග සිටුවා ඒ මැද හිඳ ධනුර්ධරවරුනි තොපි තිස්දහසක් තිස්දහසක් හීගස් විද මා හෙලනට අසමර්ථවූහ. මම එක හීගසින් තොපි සතරදෙනම විදහෙලම් කීසේක. ධනුර්ධරයෝ භයපත්ව ස්වාමිනි අප නොවිදුව මැනවයි කීහ, මහබෝසතාණෝ ඒ අසා කෙසෙල් කඳ සතරක් සතරදිග හිඳුවා හීගසක් ගෙන පගිලියෙහි රත්හුයක් බැඳපියා කෙසෙල් කඳකට විදපීසේය. කෙසෙල්කඳ සතර විදගෙන නැවත හස්තතලයටම හීගස ආයේය, පිරිත් හුයක් ඇද්දක්මෙන් හුල්හුය පෙණෙයි, එපවත්දුටු මහජනයෝ ඔල්වර හඬගසමින් සැණකෙළි කෙළහූහ. එසේ මහබෝසතාණෝ දිළඹ

භාගය මුලුල්ලෙහි අසදෘශවූ නොයෙක් ශිල්ප දක්වා එදවස් අස
ලොස් කෙළක් වස්තු පුද ලැබූසේක. ඒ ආශ්චර්යය දුටු බරණැස්
රජ්ජුරුවෝද පුත ජොතිපාල සරභඞ්ග කුමාරයෙනි තොපට අද
මුලු මහත් දඹදිවට සෙනෙවිරත් තනතුරු දෙනු කැමැත්තෙමි,
දූන් සවස්ව ගියේය. සෙට උදය දෙමි යව ගෙට ගොස් ඉස් සෝද
නහාපියා දැළිරැවුළු අඬ්දන් තබා උදය එන්නේයයි කියා එදවසට
ලක්ෂයක් වැටුප් දී යවූසේක. මහබෝසතාණෝද යහපතැයි කියා
නොයෙක් සපිරිවරින් ගෙදොරට පැමිණ දැළිරැවුළු අන්දන් තබා
ඉස් සෝද නහාපියා නොයෙක් රසයෙන් යුක්තවූ ආහාර අනුභව
කොට ශ්‍රී යහනාවෙහි සයනය කොට පශ්චිමයාමයෙහි නැඟිට
ශ්‍රීයහන් මස්තකයෙහි බඹපයඞ්කයෙන් හිඳ මා උගත් ශාස්ත්‍රයෙහි
ප්‍රයෝජනය කවරේදැයි සලකණුයේ ධනුශිල්පයෙන් වික්‍රම දක්වා
යුඬකොට සතුරන් නසා පළමු කොට ප්‍රාණඝාතය සිඹවෙයි, මධ්‍ය
යෙහි ප්‍රසන්නවූ රජදරුවන් විසින්ද දුන් ස්ථානාන්තර ප්‍රාප්තව
රූපශබ්දාදි අනෙකප්‍රකාරවූ පඤ්චකාම සම්පත් විඳීමෙක් වෙයි,
අන්තයෙහි මිය නරකයෙහි වැටී සතර අපායෙහි මහත්වූ දුක් අනු
භවකිරීම වන්නේය, අහෝ මට මෙබඳු අනර්ථදායකවූ සෙනෙවි
රත් කමින් කම කිම්දැයි හයපත්ව ඉස ගිනි ගත්තාසේ සිතා
එදවස් රෑ සොරා ගොස් කණිඨක නම් වනප්‍රදෙශයෙහි ගොධාවරී
නම් ගංතෙරට පැමිණිසේක. සක්දෙව් මහරජානෝ එපවත් දැන
විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා ජොතිපාල නම් කුමාරතෙම ගෘහා-
භිනිෂ්ක්‍රමණය කොට ගොධාවරී නම් ගංතෙර වෙසෙයි, තෙපි
ගොසින් පන්සලක් තනා එවයි කීයේය. විශ්වකර්මයා ගොධාවරී
නම් ගංතෙරට ගොස් ගව්වක් ප්‍රමාණතැන් පන්සලක් මවා තවුස්
පිරිකර සදාගියේය. මහබෝසතාණෝ එකපදික මාර්ගයෙන් ගොස්
පන්සලට වැද[1] තවුස්පිරිකර දැක සක්දෙව් මා තපසට ආ නියාව
දන්නේවනැයි සිතා හන්සළුව ගලවා වැහැරි සිවුරුහැඳ පොරවා
අඳුන් දිවිසම එකාංශයෙහි බහා දළමඬුලුව බැඳ තවුස් පිරිකර
නගා සැරයටියක් අතින් ගෙන පර්ණශාලාවෙන් නික්ම සක්මන්
මළුවටවැද කීපවිටක් ඇත මෑත සක්මන්කොට තවුස් වෙශයෙන්
වනය හොබවමින් කිසුණු පිරියම්කොට පැවිදිවූ සත්වැනි දවස්
පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවාගෙන වන මුල් ඵලාහාරයෙන්
යැපෙමින් හුදකලාවම ධ්‍යානක්‍රීඩාවෙන්දවස් යවනසේක. එකල්හි

---

1 ශක්‍රයා මවා ආ නියාව දන්නේයයි සිතා තවුස් පිරිකර හැඳ
තවුස් වෙස් ගෙන නුවරට ගොස් කිසුණු පිරියම් කොට – පොත්

කිසියම් කටයුත්තක් නිසා බරණැස් වැසි වැද්දෙක් ඒ වනයට පැමිණ මහ බෝසතුන් දැක හැඳිනගෙන නුවරට ගොස් පුරොහිත බ්‍රාහ්මණයාහට කීහ. පුරොහිතයා බරණැස් රජහට කීය. බරණැස් රජ එවිට ම පුතු ගෙනෙමැයි කියා සිවුරඟ සෙනඟ සමගින් නික්මිණ. මහබෝසතාණෝ ඔවුන් එන පෙරමගට ගොස් අහස්හි වැඩහිඳ ධර්මදෙශනාකොට ඔවුන් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි කරවා ගත්සේක. මෙසේ ජොතිපාල කුමාරයන් හා බරණැස් රජ්ජුරුවෝ පැවිදිවූහයි යනු අසා දඹදිව්තලෙහි බොහෝ සෙයින් ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීහු තම තමන්ගේ නොයෙක් පිරිස් ගෙන ගොස් බොධිසත්ත්වයන් ලඟ පැවිදිවූහ. ඔවුන් අතුරෙන් යම් කෙනෙකුන්ට කාමවිතර්කාදියක් උපන්නේ වී නම් මහ බෝසතාණෝ ඔවුන් ඉදිරියෙහි අහස්හි පෙණී හිඳ පින්වත්නි මෙබඳුවූ මනුෂ්‍යත්වභාවයක් හා ප්‍රව්‍රජ්‍යාවක් ලත් තැන කෙලෙශවසඟවූවාහු නම් කෙපි කෙසේ සංසාර දුක් නසාද සනමොක් සිරි ලබාද යනාදීන් ධර්මදෙශනා කොට නිසුණු පිරියම් දෙසනසේක. ක්‍රමයෙන් පිරිස වැඩෙත් දෙව්ලොප් ගව්වක් පන්සල හා වන ප්‍රදෙශය ඉඩ නැත්තෙන් තමන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයන් සතරදෙනෙකුට වරින් වර සතර වරක් නොයෙක් දහස් ගණන් පිරිස් දී ඒ ඒ දෙශාන්තරයෙහි පහසු තැන්වලට යවා තමන් වහන්සේ පස්වැනි පිරිස ගෙන එහිම වාසය කරනසේක. ඒ ඍෂිවරයන් අතුරෙන් කිසවච්ඡ නම් තවුසාණෝ බොධිසත්ත්වයන් පිළිවිස කුම්භවතී නම් නුවර දණ්ඩකී රජ්ජුරුවන්ගේ සෙනෙවිරදුන් උපාසකකොට ගෙන රාජොද්‍යානයෙහි වාසය කරණසේක. එකල්හි දණ්ඩකී රජ්ජුරුවෝ තමන්ගේ නුවර වෛශ්‍යාවගේ අපරාධයකට ඈ වෛශ්‍යා තනතුරෙන් පිරිහෙළූසේක. ඕතොමෝ ඒ ඒ තැන ඇවිදිමින් උයනට පැමිණ කිසවච්ඡ තාපසයන් දැක අහෝ මේ දික් නියපොතු ලෝම ජටාමඬුලු ඇති කාලකන්නි කූට ජටිලයෙක, මොහුගේ ශරීරයෙහි පාපප්‍රවාහයකොට ඉස්සෝදා නාගෙමි සිතා දැහැටිකා කෙළ හා සමග තාපසයන්ගේ ඇඟට දමාහියාය, එදවස් රජ්ජුරුවෝ ඈ සිහිකොට පළමු ස්ථානාන්තරය දුන්හ, ඒ තැනැත්තී කාලකන්නියාගේ ශරීරයෙහි පාප ප්‍රවාහය කොට මේ යසස් ලද්දෙමි සිතුවාය. ඒ කීපදවසකින් පුරොහිතයාත් ස්ථානාන්තරයෙන් පිරිහෙළූසේක, ඔහු වෛශ්‍යාව අතින් පින්වතිය තීගේ ස්ථානාන්තරය කෙසේ ලද්දීදැයි විචාළේය. ඈ තොමෝ මඟුලුයක වසන කාලකන්නියාහට පාපප්‍රවාහයකොට ලද්දෙමි කීවාය, පුරොහිතයාත් එසේම පාප ප්‍රවාහය කෙළේය. එදවස් රජ්ජුරුවෝත්

උඹ සිකිකොට පුරොහිත තනතුරු දුන්සේක. ඒ මහාමූඪ පුරොහිතයාත් ශෛවශාවයේම සිතාගත්තේය. එකල්හි රජහුගේ පසල් දනව්වක් කුපිතවිය, රජ එවිට සිවුරඟ සෙනඟ ගෙන යුද්ධයට නික්මිණ. එකල්හි මොහයෙන් මූඪවූ පුරොහිතයාත් රජහට ස්වාමීනි නුඹවහන්සේ යුද්ධයෙන් ජය කැමතිසේක් වීනම් මඟුලුයන උසන කාලකණ්ණි තාපසයාහට පාප ප්‍රවාහයකොට වැඩියමැනව එසේ කළ කල අපට ජයෙක් වෙති කීයේය. රජ සැබවයි සිතා සිවුරඟ සෙනඟ සමඟින් උයන බලා ගොසින් දැහැටි කා කෙල හා සමඟ දැහැටි දඬු තාපසයන්ගේ ඇඟ හා ජටාවෙහි දමා පාප ප්‍රවාහය කොට ගියාහුය. තාපසයන්ට උපස්ථාන කළ සෙනෙවිරත් එපවත් අසා අහෝ රටක් නැසූ නියායයි සනිකා ගොස් දැහැටි මිස සෑමින් නොදුකා දැහැටි පිරා සෑමින් ගෙන නහවා වඩා හිඳුවා ස්වාමීනි නුඹවහන්සේට අපරාධ කම් කළ මේ රට කුමක්වේදැයි විචාලේය. උපාසකය අපගෙන් වන කිසි වරදෙක් නැත, දෙවියෝ කිපී මේ රට නසති, තෙපි අන්රටකට යවයි කීසේක. එසඳ සෙනෙවිරත් වහා ගොස් රජහට කීහ. එපවත් නොගෙන යුද්ධයට ගොස් ජයගෙන සියනුවරට පැමිණියේය, සෙනෙවිරත් තෙම තමාගේ අඹුදරුවන් හා වස්තුව ගෙන අන් රටකට ගියේය. ශරභඞ්ග නම් ශාස්තෲන් වහන්සේත් ඒ රට නැසීයන බව දිවැසින් දැකලා ලදරු ඍෂීන් දෙන්නෙකු යවා කිසවච්ඡ නම් තාපසයන් යානාවක නංවා අහසින් ගෙන්වා ගත්සේක. දණ්ඩකී රජ්ජුරුවෝ යුද්ධයෙන් ජයත් අපට වීයයි සතුටුව නුවරට පැමිණි කල්හි දෙවතාවෝ කිපී වැසිවැස්වූහ. පසුව දිවමල් වැස්වූහ. ඉන් සතුටුවූ මනුෂ්‍යයෝ අප රජතුමාණෝ කූට ජටිලයාහට පාප ප්‍රවාහය කළ ගුණයෙන් යුද්ධයත් අපට ජයවිය, එපමණකුත් නොවෙයි දිවමල් වැසිත් වස්නේයයි සැණකෙලි කෙළිමින් සැමදෙනම පව් සමාදන්වූවිට දිවමල් මත්තෙහි මසුරන් වැස්වූහ, මසුරන්මත්තෙහි කහවනුවැස්වූහ, කහවණුමත්තෙහි දිව්‍යාභරණ වැසවූහ, එකල මනුෂ්‍යයෝ සතුටුව සැණකෙළි කෙළිමින් දිව්‍යාභරණ මසුරන් කහවණු දිවමල් අවුලා පළඳිමින් ගැට පොට්ටනි බඳින්ට පටන් ගත්තෝය, එයින් මත්තෙහි ගිනිගෙන දිලියෙන නොයෙක් ආයුධ පතිත ගිනිඅඟුරු වැස්සක් වැසිකල සත්වයන් විනාශව ගියේය. නැවත සැටරියන් පමණ උසපුරා වැලි වැසිපීය, සැටයොදුන් රාජ්‍යය විනාශව ගියේය. මේ බව සිංහලු දඹදිව ප්‍රසිද්ධව ගියේය, එකල්හි රාජ්‍යයට සමීප දෙශවාසීවූ කාලිඞ්ගය අටක්කශ භීමරථය යන රජදරුවෝ තුන්දෙන සිතන්නාහු පෙර බරණැස් නුවර කලාබු රජ්ජුරුවෝය, කලිඟුරට නාලිකෙර රජ්

පුරුවෝය, මහිංසකනම් රට අර්ජුන නම් රජ්ජුරුවෝය යන තුන් රජකෙනෙකුන් තාපසවරුන්ට මහත්ව හිංසා පීඩා කොට මහත්වූ විනාසයට පැමිණියෝය, මෙකල දණ්ඩකී රජ්ජුරුවෝ කිසවච්ඡ තාපසයන්ට පාපප්‍රවාහයකොට පිරිස් හා සමග විනාසවීය මොවුන් උපන් තැන් සරභඞ්ග ශාස්තෲන් වහන්සේ විනා වෙන දන්නෝ කවුරුදැයි සිතා නොයෙක් සේනාව හා සමගින් තම තමන්ගේ රටින් නික්ම ගොස් අතුරු ගමදී ඔවුනොවුන් දැක සාථාකොට තම තමන් සිතාගත් කරුණ ඒකාකාරවූ සේම එක රථයකට නැගී අන් රට වාසීන් පිරිවරා ගොධාවරී නම් ගංතෙරට පැමිණියෝය.

එකල්හි සක්දෙව් මහරජාණෝත් ප්‍රශ්න සතරක් සිතා සියලු දෙව් මිනිසුන් අතුරෙහි මේ ප්‍රශ්න විසදන්නෝ සරභඞ්ග ශාස්තෲන් වහන්සේ විනා කවුරුදැයි කියා දෙදෙව්ලොව දෙවියන් පිරිවරා ගොධාවරී නම් ගංතෙරට පැමිණියේක. කිසවච්ඡ තාපසයන්වහන්සේත් දුහැපිදඹුකඩින් යටවූ වෙදනාවෙන්ම කාලක්‍රියා කොට බඹලොව උපන්සේක. එකල ලක්ෂගණන් ඍෂිවරයන් වහන්සේත් රුස්ව සඳුන් දරසෑයක් කොට කිසවච්ඡ තාපසයන් ආදාහනය කලාහුය, ඒ ආදාහන භූමියම හාත්පසන් දේතිස්ගවුවක් පමණ තන්හී පරසතු මදාරාදිවූ දිව්මල් දෙවියෝ දනක් පමණ වැස්වූහ. එකල්හි සකල සුරනර කර්ණරසායනවූ ධර්මදෙශනා ඇති සරභඞ්ග ශාස්තෲන්වහන්සේ නොයෙක් ලක්ෂගණන් ඍෂිවරයන් පිරිවරා විසල්මහ මලුවෙහි වැඩසිටිසේක. එසඳ යටකී රජ දරුවෝ සතරදෙන නොයෙක් දෙව් මිනිසුන් පිරිවරා බෝසතුන් කරා එළඹ පසග පිහිටුවා වැඳ එකත්පසෙක සිටියාහුය, ඔවුන් අතුරෙන් ශක්‍රදෙවේන්ද්‍රයෝ තමන් සිතා ගිය ප්‍රශ්න සතරත් රජ දරුවන් සිතා ගිය ප්‍රශ්නත් තෙමේම අසනු කැමැතිව දොහොත් මුදුන්දී සිට ස්වාමීනි ජොතිපාල සරභඞ්ග ශාස්තෲන් වහන්ස අප සිත උපන් ප්‍රශ්නයක් අසම්හයි ආරාධනා කලේය. එපවත් අසා ඒ මාගේ ත්‍රිලෝගුරු සරභඞ්ග ශාස්තෲන් වහන්සේ අසා ශක්‍ර යයි කියා සර්වඥ ප්‍රවාරණයෙන් පවරා වදාළසේක. එවිට ශක්‍රයෝ දොහොත් මුදුනන්දී ස්වාමීනි කාලාබුරජය, නාලිකෙර රජය, අර්ජුන රජය, දණ්ඩකී රජය යන රජදරුවෝ සතර දෙනා තාපස වරුන්ට හිංසා පීඩාකොට මහත්වූ ව්‍යසනයට පැමිණ කොතනක උපන්නාහුදැයි විචාළේය, මහරජාණෙනි ඒ කාලාබු රජ කෂාන්ති වාදී තාපසයන් වහන්සේගේ දෙපා දෙඅත් දෙකන් නාසා

සාප්පවා මුළුඹින් ලය පැහැර සත් පියවරක් නොයනනෙක්ම පොළොව පැලී අවීචි නම් මහානරකයෙහි වැටී කපක් මහදුක් අනුභවකරන්නේයයි වදාරා පෘථිවිය ප්‍රදළනය කොට අවීචි නම් මහ නරකය දක්වා වදාළසේක. එයින් රජදරුවන් ඇතුළුවූ සියල්ලන්ගේ ශංකා විනොදනය කෙරෙමින් නවද සක්දෙව් මහරජාණෙනි ඒ නාළිකෙර නම් රජ කාලිඟු රට අධර්මයෙන් රජ කෙරෙයි. එසමයෙහි පන්සියයක් තාපසයන් වහන්සේ හිමව් පියසින් අවුත් ඒ නුවර සිඟා වළඳමින් ධර්මිෂ්ට නම් උයනෙහි වැස බොහෝ ජනයාහට ධර්මදෙශනා කෙරෙති, රජ එපවත් අසා මමත් බණ අසමියි ධර්මිෂ්ට නම් උයනට ගියේය. තාපසයන් වහන්සේලා රජ්ජුරුවන් සමග පිළිසඳර කථාකොට රජ්ජුරුවෙනි ධර්මයෙන් රාජ්‍යය කරනසේක්දැයි විචාළේය. රජ එවිට කිපී මේ කූට ජටිලයෝ මෙතෙක් දවස් මාගේ අගුණ පිරිස් මැද කීයේවනැයි සිතා ක්‍රොධකොට සෙට මාගෙන් දනයි නිමන්ත්‍රණය කොට තුමූ ගෙට ගොස් මිනිසුන්ට කියා පරණ නානා යොවලින් අසූචි ගෙන්වා බඳුන් පුරා තබවා උදය තාපසයන් වහන්සේ ආවිට පාත්‍රාගෙන අසූචි පුරා මා දුන් මේ දන් නො කෑ කල ජීව නිස්සක් කෙරෙමි කීයේය. තාපසයන්වහන්සේලා මුවෙන් නොබැණ සිටසේක්ලාය. එවිට අධර්මිෂ්ට රජ්ජුරුවෝ මෝල්ගස් තබි මුගුරු ගෙන පන්සියයක් තාපසවරුන්ගේ හිස් තළා සඳ බිඳ කීණබල්ලන් ලවා කවා මරවාපූහ. ඒ පාපකර්මයෙන් පොළොව පැළී නාලිකෙර නම් රජ සූන්ඛ නම් මහා නරකයෙහි වැටී ගියේය. ගිණිගෙන දිලියෙන ඔහුගේ ශරීරය තුන්ගව් උස ඇත්තේය. ඇතුන් සා බඹ ඇතිවිය, ගිණිගෙන දිලියෙන සුනඛයෝ ඔහු ලුහුබැඳ යපොළොවෙහි හෙලා මහ හඬින් හඬව හඬවා කටපුරා මස් කඩ කඩා අනුභව කරති. සරභඞ්ග ශාස්තෲන් වහන්සේ පොළොව දෙකක් කොට පලා ඒ නරකය දක්වා ලූ සේක, දෙව්ලොව දෙවියෝය ලක්ෂ ගණන් ඍෂිවරයෝය යන සියල්ලෝම ඒ දුසා මහත්වූ භයට පැමිණියෝය. ඒ නරකය යපතින් වසා අනතර්ධාන කළසේක. නවද සක්දෙව් මහ රජාණෙනි මහිංස නම් රට අර්ජුන නම් රජ්ජුරුවෝ වනයට මුවදඩයමට ගොස් පලාපල කෙලු නෙලා කරගසා සිටි අංගුරස නම් තාපසයන් දුක වනයෙහි මුවදඩයම් නොදෙන්නේ මොහුයයි කිපී විස පෙවූ හීයකින් විද හෙළීය, තාපසයෝ ගසින් වැටී හුලක ඇනී කාලක්‍රියා කළහ. එකෙණෙහි මහපොළොවපැලී අර්ජුනනම් රජ්ජුරුවෝ සත්තිසුල නම් මහ නරකයෙහි වැටුනේය, ඔහුගේ, ගිනිගෙන දිලීගෙන

ශරීරය තුන්ගවුවෙයි, ඔහට වධ කරන යමපල්හු ගිනිගෙන දිලියෙන ආයුධයෙන් ඇන ඇන ගිනිගෙන් දිලියෙන අය පතින බට නංවති, මහහඬින් හඬ හඬා ගින්නෙන් දද පතින මස්තකයෙහි සිටි කල්හි මහත්වූ වාතයෙක් නගා අධොශිර්ෂ කොට එයින් බිම හෙලයි, බිම ගිනිගෙන දිලියෙන යපොලොවින් ගිනිගෙන දිලිහෙන තාඹතල්කඳසා අය සූල නැගී වැමෙන්නාහුය, හිස ඇනි කඳින් නික්මෙන්නාහුය. එකල්හි ගින්නෙන් දැයෙයි. අර්ජුන නම් රජ්ජුරුවන් ඇතුළුවූ බොහෝදෙන මෙසේ සංඝාතිසල නම් මහානරකයෙහි වින්ද නොහැක්කාවූ බැලිය නොහැක්කාවූ සිතිය නොහැක්කාවූ මහත් දුක් අනුභව කරන්නාහුය. මහබෝසතාණෝ පොළොව විවෘතකොට මහජනයාට ඒ නරකය දක්වා භයපත්කොට පෙරසේම අන්තර්ධාන කළසේක. තවද සක්දෙව් මහරජාණෝ දණ්ඩකී රජ කිස වච්ඡ තාපසයන්ට පීඩා කොට තමාගේ සේනාව සහිතවූ නුවරත් නසාගත කප හමගත් ද පටන් ගිනිගෙන තිබෙන සියක් යොදුන් දිගපුළුල ගැඹුර ඇති උණුඅලු නරකයෙහි වැටී පැසෙති. ඔහුගේ ශීර්ෂමස්තකය මහත්වූ ගිනිපුපුරුඇති කරකයෙහිවැටී දැවී නස්නෝයයි කියා ඒ නරකයත් පොළොව විවෘත කොට මහජනයාට දක්වා පෙරසෙසින්ම අනතර්ධාන කළසේක. මෙසේ භීමරථාදි රජදරුවන් තුන්දෙන සිතා ගිය ප්‍රශ්න විසඳ වදාළ කල ප්‍රසන්නවූ සක්දෙව්රජ තමන් සිතා ගිය ප්‍රශ්නත් විචාලේය, ඒ සියල්ලම අහස් මැද පුන්සඳ ගෙනහැර දක්වන්නාසේ විසඳා වදාළසේක. ඒ ධර්මදෙශනාව ඇසූ රජ්ජුරුවන් තුන්දෙනාගේ කෙලෙශයන් තදඞ්ග ප්‍රහාණවශයෙන්ද අනිත්‍යය දුඃඛය අනාත්මය යනාදී වශයෙන්ද තුනීව ගොස් තමතමන්ගේ පිරිස්සමගින් මහබෝසතාණන් ලඟ පැවිදිවූහ. සක්දෙව් මහරජාණෝද දෙදෙව්ලොව් දෙවියන් සමග ස්තුති පූජා කෙරෙමින් මහසතාණන් වැඳ අවසර ගෙන දෙව්ලොවට ගියහ. ඒ ලක්ෂ ගණන් ඍෂිවරයන් වහන්සේලා කොපිරිහුනාවූ ධ්‍යානයෙන් බඹලොව උපන්නාහුය, ඒ ඍෂිවරයන් වහන්සේලා දැක වැඳපුදා දානශීලාදි කුසල් කළාහු දෙව්ලොව උපන්නාහුය, මෙසේ සනරාමර ලොකස්වාමිවූ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ බොධිසත්ව භූමියෙහිදී ප්‍රදේශික ඥාණයෙහිසිට සර්වඥප්‍රවාරණයකොට ශක්‍රාදී බොහෝ දිව්‍යමනුෂ්‍යයන් ඇසූ ප්‍රශ්න විසඳා ධර්මදෙශනා කළ කල දූත් බුදුවහිද ආලවකයාහට සර්වඥ ප්‍රවාරණයෙන් ප්‍රවාරණයකළේ ආශ්චර්ය්‍ය නොවෙයි, අහෝ තවත් සම්භව ජාතකයෙහිදී සත්අවුරුදු වයස්හි

වැලිතෙළිමින් හිඳ ප්‍රශ්න විසඳුයේ ආශ්චර්ය්‍ය නියාමයක්මය. හේ කෙසේදැයි යතහොත්? එක්කලෙක කුරුරට ඉඳිපත්නුවර ධනංජය කෞරව්‍ය නම් රජ්ජුරුවෝ ධර්මයෙන් රාජ්‍යය කරනසේක් එක්දවසෙක ධර්මයාග නම් ප්‍රශ්නයක් සිතා තමන්ගේ සුචිරත නම් පුරෝහිත බ්‍රාහ්මණයා අස්නෙක හිඳුවා ආචාර්ය්‍යයෙනි ධර්මයාග නම් ප්‍රශ්නය විසඳව මැනවැයි ආරාධනා කළසේක. බමුණු ඒ අසා දෙවයෙනි මේ ප්‍රශ්නය බුදුකෙනෙකුන්ගෙන් හෝ බෝධිසත්ව කෙනෙකුන්ගෙන් හෝ විචාළ යුතුය, කිම මට නොහැක්කේය. ඉදින් කියතහොත් බරණැස්නුවරරජහුගේ අග්‍රපුරෝහිත ධුරයෙහි පිහිටි විධුර පණ්ඩිතයෝ මහමුහුදසේ ගැඹුරුවූ නුවණැත්තාහ එසේ හෙයින් ඔහු කියතිති කීයේය. එසේ වීනම් ආචාර්ය්‍යයෙනි නෙපිම ගොස් විධුර පණ්ඩිතයන්ට ආරාධනාකොට ප්‍රශ්නය විසඳූ කල්හි ඒ අර්ථය මේ රත්රන් පත්‍රයෙහි ලියාගෙන එන්නේයයි ලක්ෂයක් වටනා රන්පතක් හා මෙසින් ධර්මපූජා කරන්නේයයි කියා පසළොස් දහසක් ජාම්බොනද සවර්ණයන් හා නොයෙක් පඬුරු පාක්කුඩම් දෙමින් නොයෙක් සේනා සමූර්ධියෙන් යැවූසේය. සුචිරත නම් බ්‍රාහ්මණයාණෝද මුළුමහත් දඹදිව ප්‍රසිද්ධවූ සියලු පණ්ඩිතවරුන් විමසමින් බරණැස්නුවර විධුරපණ්ඩිතයන් කරා එළඹ සබඳ විධුරපණ්ඩිතයෙනි අපගේ රජ්ජුරුවන්වහන්සේ නොප අතින් ධර්මයාග නම් ප්‍රශ්නයක් අසනු පිණිස ධර්මපූජාවට නොයෙක් පඬුරු පාක්කුඩම් හා සමග පසළොස් දහසක් ජාම්බොනද සවර්ණයන්ද දී මේ රන්පතෙහි ප්‍රශ්නය විසඳූ සැටි ලියා ගන එන්නේයයි මා එවූසේක. එසේ හෙයින් ප්‍රශ්නය විසඳුව මැනවැයි කීයේයි ඒ අසා විධුරපණ්ඩිතයෝ කියනුයේ බ්‍රාහ්මණෝත්තමයාණෙනි මම නොයෙක් ජනයාගේ යුක්ති අයුක්ති විනිශ්චය කෙරෙමි, එහෙයින් මාගේ සිත එකඟ නැත මාගේ හද්‍රක නම් පුත්‍ර කෙනෙක් ඇත, ඔහු පණ්ඩිතයෝය, මහා සමුද්‍රයට වඩා ගැඹුරුවූ නුවණැත්තෝය, හෙතෙම මේ ප්‍රශ්නය තෝරා කියන්නට සමර්ථය ඔබ ගොස් ඇසුව මැනවැයි කී හෙයින් ඔහු සමීපයට ගොස් විචාළේය. එකල්හි ඔහු කියන්නේ ආචාර්ය්‍යයෙනි මට පෙර නුවණ ඇතත් දැන් නුවණ නැත්තේය, පරදාර සේවනයකිරීමෙහි මාගේ සිතඇලී ඉතා බැඳීගියේය, යම්සේ මහත් මුවමස් කදක් ගෙනයන පුරුෂයෙක් ගොයෙකු දැක මස් කද දමා ගොයා ලුහුබඳනාසේ මාගේ ගෙයි යහපත් රූපශ්‍රීන් ඇති බිරිඳ ඉඳදී පරස්ත්‍රීන් සේවනය කෙරෙමි, එහෙයින් මාගේ නුවණ අනුවණ විය. මාගේ මලණුවෝ සඤ්ජය කුමාරයෝ මහමෙරසේ නිශ්චලවූ බුද්ධි ඇත්තේය, ඔහු අතින් විචාරන්නේයයි කී හෙයින් සඤ්ජය කුමාරයන් කරා ගොස් විචාළේය.

එකල්හි ඔහු කියන්නේ ආචාර්යයෙනි මමත් දවස්පතා පරදර සේවනය කෙරෙමි. එසේ කරන්නේත් මහත්වූ දතිමෝරුන් හා කිඹුලන් ඇති පුළුල්වූ ගඟක් පිහිනා ගොස් රෑ පරදර සේවනය කොට උදය පිහිනා මෙගොඩඑමි, මෙසේ නුනුවණකම් කරන ඒ මාගේ ශදරමැද උදය සවස යන එන ගමන මරුමුඛයට වදනාක් මෙන්විය, ආචාර්යයෙනි එහෙයින් මාගේ සිතට භයට ඉතා විය වුල, මේ පැණය විසඳිය නොහැක්කෙමි, මාගේ මලනුවෝ සත් ඇවිරිදි සම්භව කුමාරයෝ විදුරුසේ මහත් නුවණැත්තෝය ඔහු අතින් අසා ගනුවයි කීයේය. ඒ අසා බ්‍රාහ්මණයා කියන්නේ පින්වත නෙපි තුන්දෙනෙකුට කියාගත නුහුනු මේ ප්‍රශ්නය මුඛයෙන් කිරි සුවඳ වැහෙන කුමාර තෙම කෙසේ කියාද තොප වැන්නවුන් කියාලන ප්‍රශ්නයෙක් නොවෙයි. නුපුළුවන් බව නොකියා තන්දෙඩීමෙන් කමකිම්දැයි කීයේය. ආචාර්යයෙනි එසේ නොකියව අප හැමට වඩා සම්භව කුමාරතෙම ගුණනුවණින් අගතැන් පැමිණියේය, තරුපරයා දිලියෙන පුන්සඳසෙයින් හැම නුවණැත්තන්ම මැඩපවත්වා බබලති, ගනඅඳුරෙහි බබලන ගිනිකඳක් වැන්නේය, බාල නුමුත් ඔහුගේ ගුණ නුවණ කිය නොහැක්කේය වහා ගොස් ඇසුව මැනවයි කීයේය. එවේලාවට සම්භව කුමාර තෙම වැලි දෙහොතක් අතින් ගෙන ඉණ තුබූ කඩ කරට දමා වීථියෙහි කොල්ලන් සමග වැලිකෙළ සිටිනාසේක, සුචීරත නම් පුරෝහිත බ්‍රාහමණ තෙමේද කී සලකුණෙන් එතනට පැමිණ රූසිරෙන් ගුණ නුවණින් දැන හැඳින එකත්පසෙක සිටියේය. මහ බෝසතාණෝ ඔහු දැක කුමක් පිරිස ආ කෙනෙක්දැයි විචාළසේක. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ පුත සම්භව කුමාරයෙනි ඉඳිපත්නුවර අපගේ ධනඤ්ජය කෝරව්‍ය රජ්ජුරුවෝ මා අතින් ධර්මයාග නම් ප්‍රශ්නයක් ඇසූසේක, මම ඒ ප්‍රශ්නය කියනොහී මුළු මහත් දඹදිව පණ්ඩිතවරුන් විමසා නුඹ පියාණන් විධුර පණ්ඩිතයන්ද භද්‍රකාර සඤ්ජය යන නුඹගේ භාතෘන් දෙන්නාද විචාළෙමි. ඔව්හු හැම කීයනොහෙති, එහෙයින් හිමියාණෙනි නුඹවහන්සේ අතින් විචාරණු පිණිස ආයෙමි, මෙහින් ඇත ගමනෙක් නැත හිමියාණෙනි ධර්මයාග නම් ප්‍රශ්නය විසඳුව මැනවයි කියා ආරාධනා කළේය, එවිට මහබෝසතාණෝ ඒ අසා අහෝ මේ බ්‍රාහ්මණ තෙම මා පණ්ඩිත කෙනෙකැයි සිතා මේ ප්‍රශ්නය අසනු පිණිස මා කරා ආයේය, එහෙයින් මම ඥානවෘඩයෙමියි මහබෝසත්හු මහත්වූ ලජ්ජාවට පැමිණ හිරිඔතප් උපදවා අතතුබූ වැලි බිමදමා කරතුබූ රෙදිකඩ ඉන හැඳගෙන වැලිගොඩ මුදුනෙහි බඩපර්‍යඞ්කයෙන් වැඩහිඳ ;—

තගඝතෙ අහම්ඛක්ඛිස්සං යථාපි කුසලො තථා
රාජාචබො තං ජානාති යදි තාහසිවානවාති.

යනාදීන් සර්වඥප්‍රවාරණයෙන් ප්‍රවාරණයකොට ප්‍රශ්නය විසඳී මෙන් ධර්මදෙශනා කරන කල්හි ඒ ශබ්දය දෙලොස් යොදුන් බරණැස් නුවර මුළුල්ලෙහිම ඇසී ගියේය, එකල්හි අහෝ මේ කුමන විශ්මයෙක්ද, සම්භව කුමාරතෙම බුදුව ගියේදෝහෝයි සිතා රජ යුවරජ සෙනෙවිරත් ආදීහු වහා රැස්වූහ. මහබෝසතාණෝ අසම්භීත කේසර සිංහරාජ පොතකයෙකුසේ ඒ අසා මහත්වූ රජ පිරිස් මැද හිඳ නිර්භීතව සිංහනාද කරන්නේ එම්බා සුචිරත නම් පුරොහිත බ්‍රාහ්මණ පණ්ඩිතොත්තමයාණෙනි ධර්මයාග ප්‍රශ්නය නම් මෙලොවත් රූපශබ්දාදිවූ පඤ්චකාම සම්පත් නිරවද්‍ය ලෙස අනුභව කොට පරලොවත් ස්වර්ගලොකොත්පත්තිය පිණිස පිළිපදනා ප්‍රතිපත්ති නම් වෙයි, එසේ හෙයින් තොපගේ රජ්ජුරුවන් වහන්සේට මෙසේ කියව, රජ්ජුරුවෙනි දානශීලාදිවූ සුචරිත ධර්මයෙහි අප්‍රමාදවිය යුතුයි, අධ්‍යාත්මිකවූ පඤ්චස්කන්ධය ඇතිව නැති වන හෙයින් අනිත්‍ය වන්නේය, සියලු සංස්කාර ධර්මයෝ කෙසෙල් කඳක්සේ නිස්සාරයහ, ස්ථිරව නොපවත්නා බැවින් පෙන පිඬක් වැන්නේය, තමා කැමැතිසේ නොපවත්නා හෙයින් විශ්වාස නොකළ හැක්කේය. තමා කැමති දෙයක් නොලැබෙන බැවින් හැම ලෙසින්ම දුක්වන්නේය යනාදීන් යමෙක් මේ ත්‍රිවිධලක්ෂණය නුවණැසින් දුටුයේ වීනම් හෙතෙම මදකින් සසර නොරඳ නිවන් පුරය කරා දිවේමය, තවද කාම ක්‍රෝධාදිය දුරුකොට අධ්‍යාත්මිකවූ සිතම සිරිසිඳු කටයුතුය, සකල සත්ත්වයන් තමා වැනි කොට සිතා මෛත්‍රී කටයුතුය, දශරාජධර්මය පිරියයුතුය, දශ කුසල ධර්මයෙහි හැසිරියයුතුය, මිථ්‍යාදෘෂ්ටි නොගතයුතුය, දානප්‍රිය වචන අර්ථචර්‍ය්‍යා සමානාත්මතාය යන සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කටයුතුය, මෙබඳුවූ රාජ්‍යශ්‍රී සම්පත්තියට පැමිණි වූ පූර්ව කුසල ධර්මයට ප්‍රත්‍යුපකාර කරන්නාක්මෙන් එම කුසල ධර්මයම වර්ධනය කළ මැනව; මෙසේ පවතිනා රජතෙම පුරසඳ සෙයින් ලොව සතුටු කොට බබලන්නේය. ආයු කෙළවර ස්වර්ග ලොක පදප්‍රාප්ත වන්නේයයි වදාරා ධර්මයාග නම් ප්‍රශ්නයෙහි අර්ථනම් මේය, මෙසේ දක්වයි නොයෙක් ලෙසින් ධර්මදෙශනා කොට වදාළසේක. එකල්හි මහජනයෝ සතුටුව ඔල්වරහඬ ගසමින් අත්පොලසන් දෙමින් පිළිහිණ සිසාරා නටවමින් දහස් ගණන් සාධුකාර පැවැත්තූහ. මහජනයා විසින් ශලවාදමනලද හන්පලන් වස්ත්‍රාභරණයෙන් කෙළගණන් වස්තු රැස්වූයේය.

බරණැස් නුවර රජ්ජුරුවෝද සතුටුව නොයෙක් යශස් හා තනතුරු දුන්සේක්මය. සුචිරත නම් බ්‍රාහ්මණයෝද පසළොස් දහසක් ජාම්බෝනද සුවර්ණාදියෙන් පූජාකොට ප්‍රශ්නය විසඳූසැටි රන්පතෙහි ලියාගෙන ඉදිපත් නුවරට ගොස් ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ට දැක්වීය. රජ්ජුරුවෝ ඒ ධර්මයවූ පරිද්දෙන් පිළිපැද තමන්ගේ පිරිවර පිරිස සමග දෙව්ලොව උපන්නේය. මෙසේ සත්හැවිරිදි වයස්හි වැලිකෙළිමින් සිඳ සර්වඥ ප්‍රවාරණයෙන් ප්‍රවාරණය කොට සර්වඥ විලාසයෙන් ප්‍රශ්න විසඳීමෙන් ධර්මදෙශනා කළ කල දූන් මේ ලොව්තුරා බුදුව වැඩසිට ආලවකයා හට සර්වඥ ප්‍රවාරණයෙන් පවරා වදාළ බව ආශ්චර්ය නොවෙතත් තමන්වහන්සේ තුන්ලොවට අග්‍ර බව හඟවමින් "නබවා හන්තං ආවුසො" යනාදී පාඨය වදාරා සර්වඥ ප්‍රවාරණයෙන් පැවරූ) ඉක්බිති; ආලවකො යක්ඛො, ආලවක නම් යක්ෂ සේනාධිපති තෙම; භගවන්තං, (සනරාමර ලොකයාහට අග්‍රවූ භාග්‍ය ඇති) බුදුරජාණන් වහන්සේම; ගාථාය, "කිංසූධ" යනාදී සතර පද ගාථායෙන්; අජ්ඣභාසි, (තමා විචාරණ ප්‍රශ්න) කීයේය. විචාළේයයි සේයි.

කිංසූධවිත්තං පුරිසස්සසෙට්ඨං කිංසුසුචිණ්ණං සුඛමාවහාති
කිංසුහවෙ සාධුතරං රසානං කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨං

ඉධ, මේ ලොකයෙහි; පුරිසස්ස, පුරුෂයාහට; කිංසුවිත්තං (තුෂ්ඨිජනනාර්ථයෙන්විත්තනාම්වූ) කවරනම් වස්තුවෙක්; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨද හෙවත් උතුම්ද; සුචිණ්ණං, මනාකොට පුරුදුකරනලද; කිංසු, කවර නම් සුචරිත ධර්මයෙක්; සුඛං, (කායික චෛතසික) සුඛය; ආවහාති, එලවාද හෙඩිත් ඓහලෞකික පාරලෞකික සම්පත්තිය ප්‍රදානය කෙරේද; හවෙ, එකාන්තයෙන්; රසානං, (ෂඩ්විධ) රසයන් අතුරෙන් හෙවත් මධුර තිකතාදිවූද අවශෙෂවූද රසයයි සලකන ධර්මයන් අතුරෙන්; කිංසු, කවර නම් රසයෙක්; සාධුතරං, අතිශයින් මනොඥද; කථං, කවර ප්‍රකාරයකින්; ජීවිනං, ජීවත්වන්නාහුගේ; ජීවිං, ජීවිකාවෘත්තිය; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨයයි; ආහු, (බුඩාදී ආර්යයෝ) කියද්දැයි යනමේ ප්‍රශ්නසතර විචාළේය; අපබුදුරජාණන්වහන්සේ ඒ බුඩවිෂයවූ ප්‍රශ්නයන් අසා ඉක්බිති කාශ්‍යප සර්වඥයන් වහන්සේ විසින් යම්සේ විසඳා වදාළසේක් නම් ඒ නයින්ම ඔහට විසඳා වදාරණසේක් "සද්ධිධවිත්තං" යනාදී මේ ගාථාව වදාළසේක.

සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
සච්චං හවෙ සාධුතරං රසානං පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨං

ඉධ, මේ ලොකයෙහි; පුරිසස්ස, පුරුෂයාහට හෙවත් උත්කෘෂ්ට පරිච්ඡෙද දෙශනාව හෙයින් ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාත සකල සත්ත්වයාහට; සද්ධා, ශ්‍රද්ධා තොමෝ හෙවත් ආගම අධිගම ඔකප්පන සම්පසාදන සම්පක්ඛන්ධන සඞ්ඛ්‍යාතවූ ලෞකික ලොකොත්තර ශ්‍රද්ධාතොමෝ; සෙට්ඨංවිත්තං, (ප්‍රීතිජනකවූ) ශ්‍රෙෂ්ඨවස්තුවෙක හෙවත් ලොකයෙහි හිරණ්‍ය සුවර්ණාදි වස්තුව නොයෙක් උපභොග පරිභොග සැපය සාධා දෙමින් සාපිපාසාදි දුක් නසාද, දරිද්‍රභාවය දුරුකොට ලොකසන්තතිය සාදද්ද එසේ හෙයින්ම ශ්‍රද්ධා නමැති වස්තුවත් නොයෙක් දිව්‍යමනුෂ්‍යසම්පත් සාදදෙමින් කෙළවර නිර්වාණ සම්පත් සාදදෙන උදාරතර වස්තුවෙක; සුචිණ්ණො ධම්මො, මනාකොට පුරුදු කරන ලද්දවූ (දාන සීල භාවනාදි කුසල) ධර්මය තෙම; සුඛංආවහාති, (ලෞකික ලොකොත්තර සම්පත්තිය ප්‍රදානය කරන්නේය හෙවත් සොණසිටු රට්ඨපාල සිටුපුත්‍රාදීන්ට මෙන් මානුසික සැපද ශක්‍රාදීන්ට මෙන් දිව්‍යසැපද කෙළවර මහා පදුම කුමාරාදීන්ට මෙන් නිර්වාණ) සැපද සිද්ධකර දෙන්නේය; රසානං, (ෂඩ්විධරස මූලරසාදී) රසයන් අතුරෙන්; සච්චං සත්‍යවචන නමැති රසය; හවෙ, එකාන්තයෙන්; සාධුතරං, අතිශයින්ම අමෘත රසයෙක් නම් වන්නේය; පඤ්ඤාජීවිං, ප්‍රඥාවෙන් ජීවත්වන්නාහුගේ; ජීවිතං, (අකුසලජීවිකාදීන් වෙන්ව) ජීවත්වීම; සෙට්ඨංආහු, (බුද්ධාදි ආර්‍ය්‍යයන් විසින්) ශ්‍රෙෂ්ඨයයි කියා වදාරණ ලද්දේය හෙවත් යම් ගෘහවාසයෙන් යුක්ත පුද්ගල තෙම ප්‍රාණඝාතාදීන් වැලකී සම්‍යක් කර්මාන්තාදියට පමුණුව ගෙන සරණාගමන සීල සමාදාන දාන සංවිභාග කිරීම පොහොය පෙහෙවස් විසීමාදි ගෘහස්ථ ප්‍රතිපදාමෙන් යුක්තව වෙසේද, මහණවූව විපිළිසර නොවන්නාහු සීලයෙහි පිහිටා එයින් මතොත්තරි ත්‍රයොදශ ධූත ගුණය චිත්ත විසුද්ධි ආදිවූ ප්‍රභෙද ඇති ප්‍රව්‍රජිත ප්‍රතිපත්තියෙන් යුක්තව මාර්ග ප්‍රඥාවෙන් සිත් ගෙන ජීවත්වේද, ඔහුගේ ඒ නුවණින් ජීවත්වීම ශ්‍රෙෂ්ඨයයි කියාද බුද්ධාදි ආර්‍ය්‍යයන් විසින් ප්‍රශස්තයෝයයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ චතුර්විධ ප්‍රශ්නයෝ විසඳා වදාළ කල්හි ඒ ප්‍රශ්නයන් අසා ප්‍රසන්නවූ ආලවක නම් යක්ෂ තෙම තමහට ප්‍රගුණකරවූ සෙසු ප්‍රශ්න සතරත් අසනු කැමතිව "කථංසු තරතිඔඝං" යනාදි ගාථාව සැලකළේය.

කථංසු තරති ඔඝං කථංසු තරති අණ්ණවං
කථංසු දුක්ඛං අච්චෙති කථංසු පරිසුජ්ඣති.

ඔඝං, (දෘෂ්ටෞඝය භවෞඝය කාමෞඝය අවිද්‍යෞඝය යන චතුර්විධ) ඔඝයෙන්; කථංසු, කවර ප්‍රකාරයකින්; තරති, එතර වේද; කථංසු, කවර ප්‍රකාරයකින්; අණ්ණවං, (සංසාර මහා) අර්ණවයෙන්; තරති, එතරවේද; කථංසු, කවර ප්‍රකාරයකින්; දුක්ඛං, (අප්‍රිය සම්ප්‍රයෝගාදි සියලු සංසාර) දුඃඛයන්; අච්චෙති පහකෙරේද; කථංසු, කවර ප්‍රකාරයකින්; පරිසුජ්ඣති, (රාග ද්වෙෂාදි මලාපගමනයෙන්) පිරිසිදු වන්නේදැයි ආලවකයා විචාළ මේ ප්‍රශ්න සතරත් විසඳ වදාරණ සර්වඥයන් වහන්සේ "සද්ධාය තරති ඔඝං" යනාදී මේ ගාථාව වදාළසේක.

සද්ධාය තරති ඔඝං අප්පමාදෙන අණ්ණවං
විරියෙන දුක්ඛං අච්චෙති පඤ්ඤාය පරිසුජ්ඣති.

සද්ධාය, (ශ්‍රොතාපත්ති මාර්ගයට ආසන්න කාරණවූ) ශ්‍රද්ධාව කාරණකොටගෙන; ඔඝං තරති, දෘෂ්ටෞඝයෙන් එතරව (සෝ-වාන් මාර්ගඵල ප්‍රාප්ත වන්නේය); අප්පමාදෙන, අප්‍රමාදතාවයෙන් හෙවත් සෝවාන් මාර්ගඵල ප්‍රාප්තව සිට ද්විතීය මාර්ගයෙන් සින්දයුතු වූ අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුසල ධර්මයන්ගේ භාවනාකිරීම සංඛ්‍යාතවූ අප්‍රමාදයෙන්; අණ්ණවං තරති, (ද්විතීය මාර්ගඵල ප්‍රාප්තයා විසින් වරක් මිනිස් ලොව ඉපදීම තබා සෝවාන් ඵලයෙන් නොසිඳුනාවූ භවෞඝයට කාරණවූ සෙසු අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය කිරීමෙන් භවෞඝ සංඛ්‍යාතවූ සංසාර මහා) අර්ණවයෙන් එතරව (සකෘදාගාමි මාර්ගඵල ප්‍රාප්ත වන්නේය); විරියෙන, (සකෘදාගාමිහු විසින් තෘතිය මාර්ගය සඳහා පටන් ගන්නාලද) වීර්ය කාරණකොට ගෙන; දුක්ඛං අච්චෙති, දුක් කරන්නේය හෙවත් සකෘදාගාමි ඵලයෙන් අතික්‍රාන්ත නොවූ වස්තුකාම ක්ලේශකාමයන්ගේ ප්‍රහාණය පිණිස කාම විරාග භාවනාකොට කාමෞඝ සංඛ්‍යාතවූ සර්වදුඃඛයන් අතික්‍රාන්ත කොට අනාගාමි මාර්ගඵල ප්‍රාප්ත වන්නේය; පඤ්ඤාය, (අනාගාමි තෙමේ පහවූ කාමපඞ්කයෙන් ශුද්ධවූ විදර්ශනාමාර්ග) ප්‍රඥාව කාරණකොට ගෙන; පරිසුජ්ඣති, (ඒකාන්ත පරිශුද්ධවූ චතුර්ථමාර්ග ප්‍රඥාවට පමුණුවන අනාගාමි මාර්ගයෙන් අප්‍රහීණවූ අවිද්‍යෞඝ සංඛ්‍යාතවූ අවිද්‍යා මලාපගමයෙන්) පිරිසිදුවූ අර්හත් මාර්ගඵල ප්‍රාප්ත වන්නේයයි; මෙසේ බුදුරජාණන්වහන්සේ මේ ගාථාවෙන් අර්හත්ඵලය කුළුගෙන වදාළ කල්හි ඒ මහපිණැති ආලවක නම් යක්ෂසෙනෙවිරත්තෙම මේ සතර මහමුහුද පිණා ගොඩනැගී යක්හුසේ සංසාර මහාසාගරයෙන් ගොඩනැගී දහසක් නයින් ප්‍රති

මණිබිතවූ සෝවාන්ඵලයෙහි සිට බුදුරජාණන් වහන්සේම අනඳ මහතෙරුන්වහන්සේ මෙන් භක්ති උපදවා බුදුන් වදාළ ඒ ප්‍රශ්නපද යම තෙන තමාගේ නුවණින් ලෞකික ලොකොත්තර දෙකින් මිශ්‍රවූ ප්‍රශ්නයන් අසන්නේ "කථංසු ලභතෙ පඤ්ඤං" යන මේ සපද ගාථාව සැලකළේය.

කථංසු ලභතෙ පඤ්ඤං කථංසු වින්දතෙ ධනං
කථංසු කිත්තිං පප්පොති කථං මිත්තානි ගන්ථති
අස්මා ලොකා පරංලොකං කථංපෙච්ච න සොචති.

කථංසු, කවර ප්‍රකාරයෙකින් (පැවති සත්ත්වතෙම); පඤ්ඤං ලභතෙ, ප්‍රඥව ලබන්නේද; ධනං, (මුක්තාමාණික්‍ය හිරණ්‍ය සවර්ණාදි) ධනය; කථංසු වින්දතෙ, කෙසේනම් ලබන්නේද; කිත්තිං, (ඒ ඒ තන්හි ගුණ කථන වශයෙන් පවත්නා) කීර්තියම; කථංසු, පප්පොති, කවර ප්‍රකාරයකින් පැමිණේද; කථං, කවර ප්‍රකාරයෙකින්; මිත්තානි ගන්ථති, මිත්‍රයන් ග්‍රථිත කෙරේද; අස්මාලොකා පරංලොකං, මෙලොවින් පරලොවින්; කථං, කවර ප්‍රකාරයෙකින් හෙවත්; පෙච්ච, පරලෙව්හිදී; නසොචති, සොක නොකරේදැයි මෙසේ යක්ෂ සේනාධිපතිහු විසින් විචාරණලද ප්‍රශ්නයන් විසඳු වදාරණ සර්වඥයන් වහන්සේ "සද්දහානො" යනාදී ගාථාව වදාළ සේක.

සද්දහානො අරහතං ධම්මං නිබ්බාණපත්තියා
සුස්සූසා ලභතෙ පඤ්ඤං අප්පමත්තො විචක්ඛණො.

පතිරූපකාරී ධුරවා උට්ඨාතා වින්දතෙ ධනං
සච්චෙන කිත්තිං පප්පොති දදං මිත්තානි ගන්ථති.

විචක්ඛණො, (කුසලාකුසලධර්මයන්ගේ විපාක) දන්නාවූ; අප්පමත්තො, (දානශීලාදි කුසල ක්‍රියායෙහි) අප්‍රමාදවූ (පුද්ගල තෙම); අරහතං, (රහසක් පව් නොකරන නිකෙලෙසිවූ) රහතුන්ගේ; නිබ්බාණපත්තියා, (පරම රමණීයවූ) නිර්වාණප්‍රාප්තිය පිණිස; (දෙශනාකරනලද්දවූ) ධම්මං, (සුචරිත ධර්මය; සුස්සූසා, (නුවණැත්තන් කෙරෙහි එළඹ අසාධර්ම) ශ්‍රවණය කොට; සද්දහානො, (ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභය මේයයි කියා) අදහාගැන්මෙන්; පඤ්ඤං ලභතෙ, (ලෞකික ලොකොත්තර) ප්‍රඥව ලබන්නේය; පතිරූපකාරී, (ලෞකික ලොකොත්තර ධර්මය) පුරුදු කරන්නාවූ; ධුරවා, (බහානොතබනලද කායික චෛතසික) වීර්‍ය ඇති; උට්ඨාතා, පටන්ගන්නා ලද වීර්‍ය ඇති (පුරුෂ තෙම); ධනං වින්දතෙ, (ලෞකික ලොකොත්තර) ධනය ලබන්නේය හෙවත් සීතොෂ්ණයෙහි නොමැලිව කෘෂි වණිජ් කර්මාන්තාදිය කරන

පුද්ගලතෙම ඒ කර්මයාගෙන් නොබෝකලකින් දෙලක්ෂයක් ලද්දාවූ චුල්ලන්තෙවාසියා මෙන් ලෞකික ධනයටද; මිලක්ඛතිස්ස නම් මහ තෙරුන් වහන්සේ මෙන් වහාම ලොකොත්තර ධනයටද පැමිණෙන්නේය. හේ කෙසේ ද යත්?

මිලක්ඛතිස්ස මහතෙරුන්වහන්සේ සිතූසේක් අහෝ මේ අනවරාග්‍ර සංසාරයෙහි සැරිසරන්නාවූ මා විසින් කිසිකලෙකත් නො ලද්දාවූ නෛර්යාණිකවූ ප්‍රව්‍රජ්‍යාවක් ලැබ සිටියෙමි, දැන් සද්ධර්මවර චක්‍රවර්තීහුගේ නවලොව්තුරා දහම් නමැති සත්රුවන් ගබඩාවේ මාර්ගඵල නමැති සර්වාභරණයෙන් සැරසී නිවන් නමැති අමෘත රසය අනුභවකොට සංසාර දුක් නමැති දරිද්‍රභාවය නැසුව මැනැවැයි සිතා දෙළොස්අවුරුද්දක් මුලුල්ලෙහි ශයනයක පිටනොතබ සිඳීමෙන් සිටීමෙන් භාවනා කිරීමෙන් කරන නිද්‍රාගමන වේලෙහි පිදුරු සුමඟක් තමන් හිස තබාගෙන කරවටක් දියට බැස භාවනා කොරෙමින් වන දෙවතාවන් ලවා සාධුකාර දෙවමින් දෙළොස් අවුරුද්දකින් සකල කෙලශයන් නසා රහත්වූ සේක, මෙ සිව් අසිති පරාක්‍රමයෙන් යුක්තවූ පුරුෂ තෙම වහාම ලොකොත්තර ධනයට පැමිණෙන්නේය. සච්චෙන, (වාක්) සත්‍යය කරණකොට ගෙන; කිත්තිං පප්පොති; (ඒ ඒ තැන ගුණ කීම් වසයෙන්) කීර්තියට පැමිණෙන්නේය; දදං, (සිතූ පැතූ යම් දෙයක් පරහට) ප්‍රදානය කිරීමෙන්; මිත්තානිගන්ථති, මිත්‍රයන් සමුඞකරන්නේයි නොහොත් එම්බා ආලවකයෙනි! යම් කෙනෙකුන්ට යම් හෙයකින් ශ්‍රද්ධාව උපන්නේ විනම් එ තෙම බණ දන්නා පණ්ඩිත ගුරු උපාධ්‍යාය බුදු පසේබුදු රහතුන් කරා එළඹෙයි, එළඹීමෙන් පයිරුපාසනය කොරෙයි, පයිරුපාසනායයි කියන ලද වන්දනා මානනාදි වතාවත් කිරීමෙන් ඔවුන් කීවාත් අසනසේ සිත් යොමු කොරෙයි, එසේවූ ඔහු හිත උත්සාහවූකල ගුරුවරුන්දීහු අවවාද අනුශාසනා කරනු කැමතිව කී ධර්මයන් අප්‍රමාදව සිත්හිලා අසා දරාගෙන නිර්වාණ සම්පත් දායකවූ පූර්වභාගයෙන් ප්‍රතිපාදනා යයි කියන ලද ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගයට පිළිපදිමින් කුසලා කුසල ධර්මයන්ගේ ඉෂ්ටානිෂ්ට විපාක මේ යයි කියා දැනගත්තාවූ අප්‍රමාද පුද්ගලතෙම ප්‍රඥව යයි කියන ලද ලෞකික ලොකොත්තර විප්‍රකාරවූ ප්‍රඥව ලබන්නේය, කයින් කාලමනා වීර්යයෙන් යුක්තව සිතූ කර්මයෙහි නොමැලිව කෘෂිවණික්කර්මාන්ත කරන දනසිලාදී වූද ධූතව්‍රතාදීවූද ගුණ පුරණ පුද්ගල තෙම ලෞකික ලොකොත්තර ධනයට පැමිණෙන්නේය. සැබෑ බස් කීමෙන් කීර්තියට පැමිණෙන්නේය. සිතූ පැතූ දෙය පරහට ප්‍රදානය කිරීමෙන් මිත්‍රයන් සමුඞ කරන්නේයයි වදාළසේක.

යස්සෙතෙ චතුරොධම්මා සද්ධස්සඝරමෙසිනො
සච්චංධම්මොධිතීචාගො සවෙපෙච්ච න සොචති.

ඉංඝඅඤ්ඤෙපි පුච්ඡස්සු පුථුසමණ බ්‍රාහ්මණෙ
යදි සච්චාද මාචාගා ඛන්ත්‍යා භීයො න විජ්ජති.

ඝරමෙසිනො, ගෘහවාසයෙන්යුක්තවූ; සද්ධස්ස, අචලශ්‍රද්ධාවෙහි පිහිටියාවූ; යස්ස, යම්පුරුෂයක්හට; සච්චං, (වචී) සත්‍යයද; ධම්මො, (සුචරිත) ධර්‍මයද; ධිති, ධෛර්‍ය්‍යයද; චාගො, (වස්තු) පරිත්‍යාගයද යන; එතෙ චතුරො ධම්මා, මේ උක්තප්‍රකාරවූ ධර්‍මයෝ සතරදෙන (විද්‍යමානවූවාහු නම්); සො, ඒ පුද්ගලතෙමේ; වෙ, ඒකාන්තයෙන්; පෙච්ච, පරලොවදී (ලැබිය යුතුවූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභව කරමින්); න සොචති, ශොක නොකරන්නේයි.

යදි, ඉදින්; සච්චා, (වචී)සත්‍යයද; දමා, ඉන්ද්‍රියදමනයද හෙවත් නුවණැත්තන්කරා එළඹ, "කිං භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං"යනාදීන් අසාගැණීමෙන් ප්‍රඥාව ලබන්නේයයි වදාළ තැන "සුස්සූසා" ප්‍රඥා ප්‍රදෙශයෙන් වදාළ ඉන්ද්‍රිය දමනයටද; චාගා, (වස්තු) පරිත්‍යාගය ටද; ඛන්ත්‍යා, (අධිවාසනා) ක්ෂාන්තියටද හෙවත්; ධුරවා උට්ඨාතා යන නාමවයෙන් වදාළ ක්ෂාන්තියට ද යන සතර ධර්‍මයන්ට වඩා; භියො, බොහෝවූ (අධිකවූ ලෞකික ලොකොත්තරවූ ධර්ම කෙණෙක්); න විජ්ජති, නැත්තේය; (එහෙයින්) පුථු, ප්‍රචුරවූ හෙවත් බොහෝවූ; සමණ බ්‍රාහ්මණෙ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් (අතින්); අඤ්ඤෙපි, අනිකුදු ධර්‍ම කෙනෙක් ඇත්නම්; ඉංඝ, වහාම; පුච්ඡස්සු, විචාරා (ගණුවයි වදාළසේක).

මෙසේ ආලවකයා විචාළනාක් සියලුම ප්‍රශ්න විසඳා වදාරමින් එම්බා ආලවකයෙනි! ගිහිගෙයි වසන්නාවූ යම් ශ්‍රද්ධාවන්ත පුරුෂයකුට සත්‍ය වචනය හා සුචරිත ධර්‍මයද, ධෛර්‍ය්‍ය හා වස්තු පරිත්‍යාගයද යන මේ සතර ධර්මය විද්‍යමානවූවාහු නම් හෙතෙම මතු දිව්‍යමනුෂ්‍ය සම්පත්තියෙන් ප්‍රමුදිතවෙයි, නිර්‍වාණසම්පත්තිය හස්තප්‍රාප්ත කෙරෙයි, මීට වඩා ලෞකික ලොකොත්තර ධර්‍ම කෙණෙක් නැත්තේය, ආලවකයෙනි! අප කීවාවූ මේ ධර්‍මයෙහි කොපට සැකයෙක් ඇත්තේවීනම් සෙසුත් මේ ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඇත, ඔවුන් කරා ගොස් තාගේ සැකය දුරුකර ගණුමැයි වදාළසේක.

ඒ අසා ආලවකයා බුදුන්ගේ ශ්‍රීපාදයෙහි වැඳවැටී ස්වාමීනි! අන්කෙනෙකුන්ගෙන් කුමට අසම්ද, හිරු දහසක් නැගිකල නො මැකෙන අඳුරක් ඇද්ද, මා දුක දුරුව මැකී ගියේයයි, කියන්මුත් ඉතිරි වෙනසකුත් වදාළ බණෙක්ද මට කරුණා කොට සැවැත් නුවරසිට මෙතෙක් දුරුකාතර ගෙවා වැඩමකර වදාළබව මට මනාව හැඟී ගියේය, ස්වාමීනි! ගැත්තවුට අදම වැඩ පමණ නැත, අදම තුණුරුවන් හැඳින ගතිමි, කුසල් කරන පින්කෙත හැඳිනගතිමි, සසර සයුරෙන් එතරවන මහ නැවට පැමිණියෙමි, අමෘතමහා නිවන්පුර දොරටුව මම දුටුයෙමි, සර්වලොකෙකවූ මාගේ ශාක්‍ය සිංහ පියාණෙනි! මම් මෙතෙක්කල් මුලුල්ලෙහි සාගින්නෙන් ඉතා පිළිකුල්වූ මිනීමස් කන කල නුඹවහන්සේගේ මෙවැනිවූ අමෘත මහා නිවන් රසය නුදුන්නේ හැයිද, ශාක්‍යකුල තිලකවූ හිමියාණෙනි! පෙර මම නොයෙක් සතුන් මරා කකා රටින් රට ගමින් ගම ඇවිද්දෙමි, අද මෙවක් පටන් ගෙන ඇවිදිනා තැන තුණුරුවන් සිහිනොහැර එම සොම්නසින් පින පිනා නුඹවහන්සේ වැඩවසන දිසාභාගයටද, නුඹවහන්සේගේ ප්‍රවරතර සද්ධර්මරත්නයටද විපුලතර සඞ්ඝරත්නයටද, දෙහොත් මුදුනේ තබා වැඳ පුදා රටින් රට ගමින් ගම නුවරින් නුවර යථොක්ත වූ ගුණ කිය කියා ඇවිදිමියි ප්‍රශංසා කෙරෙමින් "කථන්නුදාන් පුච්ඡෙය්‍යං" යනාදී ගාථාවන් කීයේය.

කථන්නුදානි පුච්ඡෙය්‍යං පුථුසමණබ්‍රාහ්මණෙ
යොහංඅජ්ජ පජානාමි යොචත්ථො සම්පරායිකො.

අත්ථාය වත මෙ බුද්ධො වාසායාළවිමාගමි
සොහංඅජ්ජ පජානාමි යත්ථ දින්නං මහප්ඵලං.

සො අහං විචරිස්සාමි ගාමාගාමං පුරාපුරං
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතන්ති.

සම්පරායිකො, සම්පරායිකවූ භවත් ස්වර්ගාපවර්ග සම්පත් ප්‍රදානය කරන්නාවූ; යොචත්ථො, යම් අර්ථයක් ඇත්නම් (ඒ අර්ථය); සොඅහං, ඒ මම; අජ්ජ, අද; පජානාමි, ප්‍රකාරයෙන් දනිමි (ලං ස් හෙයින්); ඉදානි, දැන්; පුථු, ප්‍රචුර වූ; සමණ බ්‍රාහ්මණෙ, මහණ බමුණන් අතින්); කථන්නු, කුමට; පුච්ඡෙය්‍යං, විචාරම් ද; බුද්ධො, (භූත භවිෂ්‍යත් වර්තමාන සඞ්ඛ්‍යාත කාලත්‍රය වර්ති වූ සර්වධර්මයන් සර්වාකාරයෙන් පරොපදෙශ රහිතව ස්වයම්භූ ඥානයෙන් දැන සත්‍යාවබොධය කළාවූ) සර්වඥයන් වහන්සේ; මෙ, මට; අත්ථාය, ඒකාන්තයෙන් වැඩ පිණිසම; ආළවියං, අලව් නම් මාගේ මේ විමා

නයම; වාසාය, විසීම පිණිස; ආගමි, වැඩ වදාළසේක; යස්ස, යම් (සර්වඥ) කෙණෙකුන් විෂයෙහි; දින්නං, දෙනලද දානය; මහප්ඵලා, මහානිසංස ඇත්තේයයි කියා; සො අහං, ඒ මම; අජ්ජපජානාමි, අද (දිනයෙහි) විශෙෂයෙන් දැනගතිමි; සම්බුද්ධං, සම්‍යක් සම්බුද්ධ සර්වඥයන් වහන්සේටද; ධම්මස්සච, (සපර්‍යාප්ති නවලොකො ත්තර) සද්ධර්මයටද; සුධම්මතං[1], (සම්මුති සඞ්ඝ සහිතවූ අෂ්ටාර්‍ය පුද්ගල) මහා සඞ්ඝයා වහන්සේටද; නමස්සමානො, නමස්කාර කරන්නාවූ; සො අහං, ඒ මම; ගාමා ගාමං, ගමක් ගමක් පාසාද; පුරා පුරං, නුවරක් නුවරක් පාසාද; විචරිස්සාමි (යථොක්ත ගුණ යන් ප්‍රකාශ කෙරෙමින්) හැසිරෙමි.

එවංවුත්තෙ ආලවකො යක්ඛො භගවන්තං එතදවොච අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති එවමෙවං භො ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි. ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

එවංවුත්තෙ, (ශ්‍රී සද්ධර්මාමෘත දෘෂ්ටාවූ සර්ව ලොකෛක විමල විපුලාඛිල ජනානන්දකර ත්‍රිභුවනෛක තිලකවූ සර්වඥරාජොත්තම යාණන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් යක්ෂයාගේ දෘෂ්ටිමන් බිඳුවා) මෙසේ ධර්මදෙශනාකර වදාරණලද කල්හි; ආලවකො යක්ඛො (නැවත නැවතත් විශෙෂයෙන් ප්‍රසන්නාකාර දක්වන්නාවූ) ආලවක නම් යක්ෂසෙනාධිපති තෙම; භගවන්තං, (මාරවීර තිමිර නිකර විධ්වංසනයට අසිසිර කිරණාංශු මණ්ඩලායමාන වූ) සර්වඥරාජොත්තමයාණන් වහන්සේට; එතදවොච, මෙසේ කීයේය නොහොත් මෙසේ සොත්‍ර කෙළේය; භො ගොතම, භවත් ගෞතම ගොත්‍රොද්භූතවූ සර්වඥරාජොත්තමයාණන් වහන්ස; අභික්කන්තං, (නිඛිලජනමනඃ ප්‍රසාදකරවූ නුඹවහන්සේගේ ධර්මදෙශනාවෙන් ලබනලද මාගේ ශ්‍රද්ධාප්‍රතිලාභයද) ඉතා යහපත, භො ගොතම, භවත් ගෞතමයාණන්වහන්ස; අභික්කන්තං, (නුඹවහන්

---

1 සුධම්මතං, යහපත්කොට දෙශනාකර වදාරණ ලද්දාවූ; ධම්මස්සච, (සපර්‍යාප්ති නවලොකොත්තර) සද්ධර්මයටද; සඞ්ඝස්සච, (අෂ්ටාර්‍යපුද්ගල) මහ සඞ්ඝයා වහන්සේටද; — සමහර

සේගේ ධම්ම දෙශනාව) ඉතා යහපත් වන්නේය; භො ගොතම, භවත් ගෞතමයාණන්වහන්ස; නිකුජ්ජිතං, අධොමුඛවූ භාජන යක්; සෙය්‍යථාපි උක්කුජ්ජෙය්‍ය වා, උඩුකුරු කර තබන්නෙක් යම්සේ ද; පටිච්ඡන්නං, (තෘණපත්‍රාදියෙන්) වැසී තුබූ නිධානයක්; විවරෙය්‍ය වා, විවෘතකොට දක්වන්නෙක් යම්සේ ද; මූළ්හස්ස, මංමුළා එකක්හට; මග්ගං ආචික්ඛෙය්‍ය වා, මාර්ගය කියන්නෙක් යම්සේ ද; අන්ධකාරෙ, (චතුරාඞ්ගයෙන් යුක්තවූ ඝන) අන්ධකාර යෙහි; චක්ඛුමන්තො, ඇස් ඇති පුරුෂ කෙනෙක්; රූපානිදක්ඛින්තීති, (නීලපීතාදි) රූපයන් දකිත්වයි කියා; තෙලපජ්ජොතං, ප්‍රසන්න තිල තෛල ප්‍රජ්වලිත මහා ප්‍රදීපයක් හෙවත් මහ තල තෙල් විළක්කුවක්; සෙය්‍යථාපි ධාරෙය්‍ය වා, යම්සේ දරන්නේ වේ ද; එවමෙවං, එපරිද්දෙන්ම; භො ගොතමෙන, භවත්ගෞතම සර්වඥරාජොත්තමයාණන් වහන්සේ විසින්; අනෙක පරියායෙන, නොයෙක් කාරණාවෙන්; ධම්මොපකාසිතො, (මාගේ දූසි මින් බිඳුවා) ධම්මදෙශනාකර වදාරණ ලද සේක; එසො අහං, ඒ මම; භගවන්තං ගොතමං, භාග්‍යවත් ගෞතම ස්වාමීන් වහන්සේ ද; ධම්මඤ්ච, ධර්මරත්නයද; භික්ඛුසඞ්ඝඤ්ච, භික්ඛුසඞ්ඝයා වහන්සේද; සරණං ගච්ඡාමි, සරණකොටයෙමි; අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, ජීවිතාන්තය දක්වා; සරණ ගතං, සරණගියාවූ; උපාසකං, උපාසකයෙකැයි කියා; මං, මා; භවං භො ගොතමො, භවත් ගෞතම සර්වඥයන් වහන්ස (තුබවහන්සේ); ධාරෙතූති, සිත්හිලා දරා වදාරණ සේක්වා.

මෙසේ ආලවක නම් යක්ෂ සෙනාධිපතිතෙම භාග්‍යවත් සර්වඥ රාජොත්තමයාණන් වහන්සේගේ ධර්මදෙශනාවට ප්‍රසංශා කෙරෙමින් ධර්මදෙශනාවෙන් උපමතවූ ශ්‍රද්ධා ප්‍රතිලාභය හඟවා උපමා චතුෂ්කයකින් සර්වඥයන් වහන්සේට ප්‍රසංශා කරණුයේ ස්වාමීන් වහන්ස! යම් කිසිවෙක් අධොමුඛවූ භාජනයක් උඩුකුරු කොට තබාද, එසේ හෙයින්ම සද්ධර්මයට පිටිපෑ අසද්ධර්මයෙහි සිත් වැටී සතර අපායට අභිමුඛව හොත්තාවූ මා එයින් ගොඩනගා මාර්ග ඵල නමැති දිව්‍ය යානාවෙහි වැදහොවා අමෘතමහා නිවන්පුරයට හැරදමා වදාළසේක් වන්නේය. තවද ස්වාමීනි! යමෙක් තෘණ පර්ණාදියෙන් වැසී තුබූ මහත් සත්රුවන් නිධානයක් විවෘතකොට දක්වාද, එසේම කාශ්‍යපබුදුන්ගේ ශාසනාන්තර්ධානය පටන් මිථ්‍යා දෘෂ්ටි නමැති තෘණපර්ණාදියෙන් වැසීතුබූ බුද්ධශාසන නමැති ගුණ රුවන් නිධානය විවෘතකොට දක්වා වදාළ බව අහස්මැද අඳුරු බිඳහැර පුන්සඳ ගෙනහැර දක්වා වදාළාක් වැන්නේය, තවද ස්වාමීනි! සමසක් මුංමුළාව පරතෙර නැති මහ වනයමවන් පුරුෂ

යක්හුගේ අතගෙන මේ මගින් මෙසේ එවයි කියා රජමහවතකට හරණක් යම්සේද; එසෙයින් චතුසසත්‍යය ප්‍රතිච්ඡාදනව මොහයෙන් මූළාව දිගසසරකෙලවරක් නැති ජාති ජරාදි අනෙකොපද්‍රවයෙන් හා අප්‍රිය සම්ප්‍රයොග ප්‍රිය විප්‍රයොග දුක්ඛාදි අනෙක කටු පහන් ඇති සංසාර නමැති මහා වනාන්තරයට වැද යනමං නොදුන මංමුලාව කුල්මත්ව ඇවිදිනාවූ මාගේ අත අල්වාගෙන ආලවකය තෝ නොබාළුව අභය මහානගරයට පාර මම දන්නෙමි කියා ස්වර්ගමොක්ෂ දෙකට මාර්ගය හැර වදාළාක් වැන්නේය. තවද කරුණා නිධානවූ බුදුපියාණෙනි! චතුරඞ්ගයෙන් යුක්තවූ අන්ධකාරයෙහි පහන් මග නො දුක භයපත් වූ මිනිසක්හට මහත්වූ පහන් ආලෝකයක් ගෙනවුත් දරන්නෙක් යම්සේ ද එමෙන් මෙලොව පරලොව වැඩ නොදක්නා මොහාන්ධකාරයට පැමිණියාවූ බුඩාදී රත්නත්‍රය නුවණැසින් නොදුකනුන් මාගේ දූෂ මන් සිඳුවා ධර්මදේශනා නමැති ප්‍රදීප ධාරණයෙන් මොහාන්ධකාරය විධ්වංශනය කොට මාර්ගඵල නමැති මහා ප්‍රදීපය දරා වදාළාක්හු වැන්නෝය. එහෙයින් ස්වාමීනි! ඒ මම බුත්සරණ යෙමි. දහම් සරණ යෙමි, සඟසරණ යෙමි. තිලෝගුරු මාගේ පියාණෙනි! යම් කිසිවෙක් ඉතා සියුම්වූ මුවහත් ඇති මහත්වූ කඩුවක් ඔසවාගෙන ආලවකය! තෝ බුදුන්සරණ හැරපියව, දහම් සරණ හරුව, සඟ සරණ හරුව ඉදින් නොහරිනම් මේ කඩුවෙන් තාගේ හිස කපා හරිමි කියා ස්වාමීනි! මාගේ හිස ඒකාන්තයෙන් කපා හැරි නමුත් තුණුරුවන් සරණ නොහරිම්, එබැවින් ස්වාමීනි! දිවිහිමියෙන් සරණගියාවූ උපාසකයෙකැයි කියා මා දරා වදාළමැනවයි තමාගේ අචල ශ්‍රද්ධාව ප්‍රකාශ කෙරෙමින් එකත්පස්ව සිටියේය.

මෙසේ යථොක්ත ධර්මදේශනාවගේ කෙළවරවීමද එදා රෑ පහන්වීමද හිරුනැගීමද දශසහශ්‍රී ලොකධාතුවෙන් රැස්ව ආවාවූ බ්‍රහ්මයන් විසින් මහත්කොට පවත්වන ලද සාධුකාර ඝෝෂාවද, අලව් නුවර රාජපුරුෂයන් විසින් අලව් රාජකුමාරයා එතනට පැමිණවීමද එකවිටම වූයේය. ඒ කුමාරයා ගෙන ගිය රාජපුරුෂයෝ විමානයෙහි පැවති සාධුකාර නාදය අසා කිමෙක්ද විමානයෙහි මහත්වූ සාධුකාර ශබ්දයෙක් පැතනැංගේය, ගින්නෙන් දිය නැගිකලක් වැන්නේය, දිඹුල්මල් පිපුනාක් වැන්නේය, අපායෙහි පියුම් පිපුනාක් වැන්නේය, අද මේ කවර අරුමයෙක් දෝ බුදුන් වැඩි තැනකම්ස මෙබඳුවූ සාධුකාර ශබ්දයෙක් ඇත්තේ නොවෙයි අපටවත් දුක බලා සුබොදන පුත්රුවන මෙතැනට වැඩිසේක් දෝ හෝයි සිත සිතා පෙර සේ නොබාවම නැමී කුගස කරා ගොස්

අතුඅතරෙන් පැන නැගී ගොස් දිවන බුද්ධරංසි ප්‍රභාවන් හා කජ් ගිනිගත් රුවන් මෙරක් සේ වැඩහුන් බුදුන් දැක සතුටුව බුදුන් දිසාවට වැඳුම් ගෙන නැමීහුන් ආලවකයා දැක නොබාවම ආලවකයා ලඟට ගොස් කියන්නාහු එම්බා පින්වත් මහා යක්ෂයාණෙනි! තාගේ බිලියමට ගෙනා අපගේ මේ අලව් රාජකුමාරයන් වහන්සේ හැරගෙන කනොත් කාපියව, බොනොත් බීපියව, අපගෙන් අද පටන් තොපට දෙන බිලියම් බතෙක් නැත්තේ යයි කියමින් කුමාරයා පිරිනැමූහ— එසින් කීහ.

අයංබාද මහායක්ඛ කුමාරං ලොක පූජිතං
ඉතොපරං නත්ථිතුය්හං බලිකම්මං දිනෙ දිනෙ.

එවිට ආලවක නම් යක්ෂතෙම කෙළදහසක් කෙලෙසුන් නසා සෝවාන්ව ආර්‍ය්‍ය ජාතියෙහි පිහිටි හෙයින් ප්‍රාණඝාතාදිය අසූචියක් සේ පිළිකුලකොට සිතා මහත් ලජ්ජාවට පැමිණ මිනිසුන්ගේ ගහට බලවත් හෙයින් පෙම්බර මවක සේ කුමාරයා දෙයතින් වඩාගෙන බුදුන්ට කියන්නේ ස්වාමීනි! සිය පින් ලකුණෙන් හා සියලුම අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ගෙන් සම්පූර්ණවූ මේ රාජකුමාරයා මට ගොදුරට ගෙනාවාහුය, මාගේ මෙබඳු තපුරුවූ ගොදුරු නැති කලාවූ නුබවහන්සේට ඔදවැඩියාවූ සිතින් මොහු පූජා කෙරෙමි, මෝහට හිතවැඩ පිණිස කරුණාකොට පිළිගෙන වදාළ මැනවයි කියා බුදුන් අතට පූජා කෙළේය. එසින් කීහ —

ඉමං කුමාරං සතපුඤ්ඤලක්ඛණං
සබ්බංගුපෙතං පරිපුණ්ණ ව්‍යඤ්ජනං.

උදග්ගචිත්තො සුමනො දදාමිතෙ
පටිග්ගහෙ ලොකහිතාය චක්ඛුමාති.

සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ ඒ ආලවක කුමාරයා ශ්‍රී හස්තයෙන් වඩාගෙන වදාරමින් යක්ෂයාට හා කුමාරයාට ජය මඞ්ගල්‍යය කරණාර්ථයෙන් උපාර්ථ ගාථාවක් වදාළසේක. ආලවක නම් යක්ෂතෙමේද කුමාරයාට තිසරණ ගන්වමින් "දීඝායුකො හොතු අයං කුමාරො සරණමුපෙතු අයං කුමාරො" යනාදීන් ආශීර්වාද කෙළේය. මේ කුමාරයා වැඩිවඩිනාය කොට මටම ගෙනවුත් දෙන්නේ යයි කියා සර්වඥයන් වහන්සේ කුමාරයා රාජපුරුෂයන් අතට දුන්සේක. මේ කුමාරයා රාහුල කුමාරයන් වහන්සේට පවා නොලද්දවූ බුදුන්ගේ ශ්‍රීහස්ත ස්පර්ශයක් ලත් හෙයින් එතැන් පටන් හස්තාලවක කුමාර යයි කියා දෙවිමිනිසුන් කෙරෙහි ප්‍රසිද්ධ විය.

ඒ කුමාරයා ගෙනගිය රාජපුරුෂයෝද බුදුරැස්නමැති අමාවිලෙහි ගැලී ගැලී බුදුන් වැඳ අවසර ගෙන කුමාරයා වඩාගෙන කඩින මින් අලව්නුවර කරා දිව එන්නන් දැක ඒ මාර්ගයෙහි ඒ ඒ තැන සීසාන වපුරන කර්මාන්තකාරාදීහු කිමෙක් දෝ හෝ යක්ෂතෙම කුමාරයා ඉතා ලදරු නිසා පිළිනොගත්තියාදෝ හෝයි සිතා හඬින් නැති ගෙන සිට රාජපුරුෂයන් අතින් විචාළෝය. එවිට රාජපුරු ෂයෝ කියන්නාහු අපට වන් දුක්දුක සුඛොදන පුත්රුවන ඒ අප ගේ ආලවක විමානයට වැඩමකර වදාළසේක. උන්වහන්සේ වැඩ වදාළතැන ආලවකයාවැනි මහත් කදයෝ ඉතා මොලොක් වෙති. තෙපි භය නොගණුව! බුදුන්විසින් අපටපැමිණි භය දුරීභූතකරන ලද්දේ යයි තමන් දුටු ඇසූ සියල්ලම කීවාහුය. එපවත් ඇසූ සියලු මනුෂ්‍යයෝම ඉපිල පැනනැගී සාධුකාර සියදහස් ගණින් පවත් වමින් නාලාගිරිනුවන් රජගහ නුවර සෙයින් අලව්රම එක කොලා හල කෙරෙමින් ඇතුළු නුවරම වන්හ. රජ්ජුරුවෝ එපවත් අසා ගුරුළු තුඩින් ගැලවීගිය නාරජෙකු සේ ප්‍රීතියෙන් පිනා ගොස් වසරෝසමග, අපසිඩාසීබුදුන්ට දිවිපුදන්ට යම්හයි කියමින් ඇමති සියදහස් සමගින් සලුපට ඉන දවට දවමා බුදුන් වැඩවසන යක් විමන දිසාවට ගමන් ගත්සේක.

එදවස් අලව් රාජදේවීන් වහන්සේ පුත්‍ර සොකයෙන් නොකා නොබී හඬ හඬා අනේ මාගේ රත්රුවක් වැනි පුත්රුවන මාගේ ලයක් වැනි මාගේ ඇසක් වැනි පුත්රුවන ආලවකයා ලෙහෙ පෙර පෙරා හඬව හඬවා අනුභව කෙරෙයි, මාගේ ජීවිතය තිබී මෙන් කම් කිම්ද? විසක් කාපියා නැසියෙම් දෝ හෝයි ගින්නට පැන දිව ඇද කාපියා මියෙම් දෝ හෝයි කිය කියා විලාපයෙන් හුන්සේක, එසේම සොළොස් දහසක් කුඩා මවු බිසෝවරුද සැම දහසක් කිරිමවුනුද මහාසොකීව හුන්නාහුය, ඔවුන් හැමින් එප වත් අසා අමෘතාභිෂේකයක් ලදුවාසේ සතුටින් පිනාගොස් සතුටු කඳුලෙන් නෙත් පුරාගෙන බුදුන් කරා නික්මුනාහුය, මේ දනන් එදා ඉතිරිවූ කෙනෙක් නැත, ඇද්ද, සියලුම රජ බමුණු වෙළඳ ගොවි ඇතුළු වූ සියල්ලෝම නොබ ගමන් ගත් මුහුදක් මෙන් බුදුන් දිසාවට නික්මුණාහුය.

සම්බුදුයන් වහන්සේ එපවත් දැක ආලවකයෙනි! අපට භික්ෂා චාරයට කල්වන්නේයයි වදාරා පාසිවුරුගෙන වඩනාආකාර දැක්වූ සේක, ආලවක තෙමේ ද එවිට ස්වාමීනි මමත් යෙමි ගැන්නවුම පාත්‍රය දුනමැනවැයි කියා බුදුන්ගේ පාත්‍රය ලබාගෙන බුදුන්කැටුව අඩ යොත්නක් මාර්ගය ගෙවා ගෙන නගරාසන්නයට ආයේය

එවිට බුදුහු ආලවකයෙහි ඉතිකින් තෙපි හිඳුව, අද මාගෙන් බණ අසා සෝවාන් ඵලයට පැමිණි බව නොදන යම් කිසි කෙනෙක් තොප කෙරෙහි ක්‍රොධකළාහු, නම් ඔහුට සවර්ගමොක්ෂයට අනතරාය පෙනෙයි. එබැවින් තෙපි හිඳුවයි වදාරා පාත්‍රය ගෙන වදාරමින් අලව්නුවරට වැඩ දොර දොර නැගී පුන්සඳ මඬලක් සේ සිතුමිණි රුවණක්සේ කුසල මහිමයෙන් පොළොව පලා ගෙන පැනනැගී පියුම්පිට පියුමක් තබන්නාසේ දෙසිය සොළොසක් මඞ්ගල්‍ය ලක්ෂණයෙන් විරාජමානවූ ශ්‍රීපාද චන්ද්‍රයන් පිනුම් පිට තබ තබා බුඬශ්‍රීන් මුලුලොව බබුලුවමින් වඩනාසේක.

එකල දක්ෂිණ ශ්‍රීපාදයෙහි පඤ්චාංගුලි නඛාග්‍රයෙන් පඤ්චවර්ණ බුඬවරරශ්මි කදම්බයෝ පස්දෙනෙක් නිගීනව අනන්ත නම් නාග රාජයෝ පස්දෙනෙකුසේ ඇතුළු නුවරට දිව නුවර වටා තුන් ගලක් සිසාරා පවුරුපදනම් අටළුවල ගැසි ගැසී නොනොවර්ණයෙන් රැලිදිදී සියලු නුවර ව්‍යාප්ත වෙමින් ප්‍රාසාද කුළුගෙවල් හික්කි පවුරු පදනම් තොරණ අටළු වාසල් කවුළු දොර යනාදිය රන්පට රිදීපට පොරවන්නාසේ ස්වර්ණ කල්ක ගා පියන්නාසේ ඒ ඒ දිග දිව සියලු නුවර දිව්‍යපුරයක් මෙන් ශොභාමත් කළහ. එකෙණෙහි සියලු බන්ධනාගාරවල වසන හස්ති අශ්ව මයුර ශාරිකාදීහු එකනින් නාදකළහ. බෙර සක් තිමිර තන්ත්‍රි වීණාදි තූර්‍ය්‍යභාණ්ඩයෝ තුමූ තුමූ තූර්‍ය්‍යනාද පැවැත්වූහ. සියලු ස්ත්‍රී පුරුෂයෝ පැලඳි කනක කටකාදි ආභරණයෝද, මනොහර නාද කළහ. මෙබඳුවූ අනෙකවිධ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් සියලු සත්වයන් පිනවමින් අනොපමෙය්‍යවූ බුඬවිලාසයෙන් යුක්තව පිඬු පිණිස වඩනාසේක. එකල අලව්රජ්ජුරුවන් ඇතුළුවූ මහසෙනඟ තමන් ගේ අශෙෂ පූජීවූ ප්‍රාතීහාර්‍ය්‍යයෙන් යුක්තව මහාබ්‍රහ්මයා සේ පියුම්පිටින් වඩිනා බුදුන් දැක බුඬාලම්බන ප්‍රීතීන් පිණ පිණා නිල්මුහුද ගැලෙනුවන් සෙයින් ස්වර්ණවර්ණ බුදුරැස්හි ගැලී හැලී වැඳ පෙරලමින් ස්වාමීනි අප ශුද්ධොදන ශාක්‍යපුත්‍ර සිඬාර්ථ හිමියානෙනි ගැත්තවුන්ගේ භය නසන්ව අද අලුයම වැඩියා දෝ ඊයේ සවස වැඩියා දෝ හෝ යි කිය කියා සනත් කුමාර නම් මහාබ්‍රහ්මයා පිරිවරා ගන්නාවූ තව්තිසා දෙව් සේනාවක්සේ බුදුන් පසුපස්සෙහි නික්මුනාහුය. මෙසේ තමන් වහන්සේ දුටු දුටු තැන වැඳ පෙරළමින් දිව්පුදමින් දොහොත් මුදුනෙ තබා සාධුකාර දෙන්නවුන් දැක දැකත් බුදුහු ධර්ම දෙශනාවට කල් නොවන නිසා පිණ්ඩපාතකොට වළඳ වදාරා නගරමාරයෙහි පවිත්‍රවූ එක්තරා මහ රුකක් මුල පනවන ලද

උතුම් බුද්ධාසන මස්තකයෙහි විජම් බණ දෙසන ද, දෙව්ලොව පරසතු රුක්මුල පාණ්ඩුකම්බලශෛලාසන මස්තකයෙහි වැඩහුන් නාසේ බුදුශ්‍රීන් දිලිහි දිලිහී වැඩහුන්සේක. එවේලෙහි අලව් රජ්ජුරුවන් වහන්සේ අලව් නුවර වාසීන් සමග බුදුන් වැඳ දෑහොත් මුදුන්දී සිට සවාමීනි ලොව්තුරා බුදුරජාණෙනි මෙබඳුවූ අතිදරුණු කර්කශ සවභාව ඇති අමු මිනීමස් භක්ෂණය කරන යක්ෂයා කෙසේ නම් තීක්ෂණ කර වදාළසේක්දැයි විචාළසේක.

මහරජ මම පෙරෙව්ද අලුයම්හි දෙව්රමදී ලොව බලන්නෙම් තොප සියල්ලන් දක සැවැත්නුවර සිට තිස්යොදුන් මග ගෙවා හීනෙළ් සවස ආලවකයාගේ විමානයට ආයෙමි, එවිට ආලවකයා ආශිර්විෂයෙකුසේ කිපී දිවගන අවුත් සෙනහඩසේ හඬගසා ශ්‍රමණ භවත් ගෞතමයා සුලංපහරින් හකුලුවා පරසක්වළ ගසම්හියා කල්ප විනාශකර වාතයක්සේ යහපත්වූ සලඟක් මවාලිය, ඒ චණ්ඩමාරුතයට පවන්හැල්ලකුදු නැතිකොට අන්තර්ධාන කොට හැරියෙමි නැවතත් ශ්‍රමණයා සැඩවතුරේ ගලා මරම්හි දසදිග මේඝ ගර්ජනා පතුරුවා අකුණු සෙන විදුලිය පැහැර කල්පවිනාශකර මේඝයක් මෙන් මහත්වූ වර්ෂාවකුත් වස්වාලිය, ඒ මේඝය මාගේ ආනුභාවෙන් අන්තර්ධාන කොට හැරියෙමි. නැවත නැවතත් ගිනිගෙන දිලිහෙන පහන වර්ෂාවක්ද, ආයුධ වර්ෂාවක්ද, උණුඅළුවර්ෂාවක්ද, වැලිවර්ෂාවක්ද, ගිනිඅඟුරුවර්ෂාවක්ද, කලල්මඩවර්ෂාවක්ද, වස්වාලිය, ඒ මම සුවඳමල් සුවඳසුණු සුවඳ කපුරු සුවඳ කලල් සඳුන් කල්ක කොට හැරියෙමි, නැවතත් භයානකවූ අන්ධකාරයක් මවාලිය, ඒ අන්ධකාරය මා කරා දිවඅවුත් හිරුදුටු අඳුරක් සෙයින් අතුරුදන්විය, මෙසේ වැසි සුලං ගිරි ශස්ත්‍ර අළු වැලි අඟුරු කලලන්ධකාරය, යන නවවිධ වර්ෂාවක් කොටත් මා නසානත නොහී නැවත ඔහුගේ නානාප්‍රකාර ආයුධ දුරා සිවුරඟ සෙනඟ ගෙන මා හා යුද්ධකොට පැරද ඔහුසේ මහානුභාව සම්පන්නවූ වේලායුධය දමාගැසීය, ඒ වේලායුධය සෙනහඩසේ ගුගුරා මුළුලොව දමවා දිලිහි මා කරා දිවඅවුත් මාගේ දෙපයමුල පාපිස්නා කඩක්සේ වැටීගියේය, තමින් පසු නොබැස නැවත තමා අතින් ජලපොළොවසේ අති ගාම්භීරවූ ප්‍රශ්නයන් ඇසීය, ඒ ප්‍රශ්නයන් විසඳ ඔහට බණ කීම්, ඒ බණ අසා අලවකයා කෙළදහසක් කෙලෙසුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන්ඵලයෙහි පිහිටා මට උපාසකවියයි වදුරා සියලුම ආලවක සූත්‍රය ගෙනහැර දක්වා වදාළසේක. මේ

ආලවක සූත්‍ර ධර්මදෙශනාවගේ කෙළවර සුවාසූදහසක් දෙනා අමාමහ නිවන් දුටුවාහුය. මෙසේ ත්‍රිභුවනෛක ප්‍රදීපායමානවූ සර්‍වඥ රාජෝත්තමයාණන් වහන්සේ මේ ආලවක සූත්‍රාන්ත ධර්මදෙශනාව ආලවක විමානයෙහිදී ආලවක යක්‍ෂයාහට වදාළසේක. නැවත අලව් නුවරදී අලව් රජ්ජුරුවන්ට වදාළසේක, දෙව්රමට වැඩ අනඳ මහතෙරුන් වහන්සේට වදාළසේක, එසේ හෙයින් සකල සුරනර කර්ණරසායනවූ උතුම් මේ ආලවක සූත්‍රය සර්‍වඥරාජෝත්තම- යාණන් වහන්සේ තුන් වාරයක් වදාළසේක. මෙසේ එදවස් මේ සූත්‍රාන්ත ධර්මදෙශනාවෙන් බොහෝ දිව්‍ය මනුෂ්‍යයන් අමාමහ නිවන් දක්වා ජේතවනාරාමයට වැඩිසේක.


ඒ අලව් රජ්ජුරුවෝද ආලවක නම් යක්‍ෂ තෙමේ සෝවාන්ව බුදුන්ට ආයර්‍ය ශ්‍රාවකවූයේ යයි කියා බුදුන්ගෙන්ම ඇසූ හෙයින් මහත්වූ ආදර උපදවා වෙසමුණි රජ්ජුරුවන්ගේ දෙවාලය සමීප යෙහි එම නමැති ආලවක නම් යක්‍ෂසෙනාධිපති තෙම දෙවාල යක් කරවා දවස් පතා පුෂ්පගන්ධාදී යක්‍ෂානුරූප කොට වැඳුප් පඬුරු සලස්වාලූසේක. ආලවක නම් යක්‍ෂතෙමේද එතැන් පටන් ධාර්මිකවූ රක්‍ෂාවරණයෙන් කිසි උවදුරක් විය නොදී අලව්රට රක්‍ෂා කෙළේය.

මෑතභාගයෙහි ඒ හස්ථාලවක කුමාරතෙමේද වැඩිවිය පැමිණ බුදුන් කරා එළඹ තුණුරුවන් ආශ්‍රයකොට නොබෝකලකින්ම අනාගාමිව සියලු බුඩවචනය ඉගෙණගෙන නිරන්තරයෙන්ම පන්සියයක් උපාසකවරුන් පිරිවර ඇතුව බුදුන්ට උපස්ථානයට එළඹෙති, සර්‍වඥයන් වහන්සේ ඒ මනාව සුශික්‍ෂිතවූ උපාසක පිරිස දැක හස්තාලවකයෙනි තොපගේ පිරිස බොහෝව කවර ප්‍රකාරයකින් මෙතෙක්දෙනාගේ සිත් ගෙන වෙසේ දැයි විචාළ සේක. ස්වාමීනි දානයෙන් සතුටුවන්නවුන් වස්තු ප්‍රදානයෙන් සිත් ගණිමි: ප්‍රියවචනයෙන් සතුටුවන්නවුන් ප්‍රිය කරුණාවෙන් සිත් ගණිමි, කිසියම් කටයුත්තක් පැමිණි කල්හි ඒ කටයුත්තක් සම්පාදනය කරදීමෙන් උන්ගේ සිත්ගණිමි, ඒ ඒ තරම් ලෙසට නම්බු කැමැත්තවුන්ට ඒ ඒ තරම් ලෙසට ඉසුරුදීමෙන් සමානාත්මතාවෙන් සිත් ගණිමියි දැන්වූසේක. එවිට බුදුහු ශභපතැයි වදාරා භික්‍ෂූන්ට ආමන්ත්‍රණය කොට "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං උපාසකානං චතූහි සඞ්ගහ වත්ථූහි පරිසං සංගණ්හන්තානං යදිදං හත්ථකො ආලවකො" යි යනුවෙන් මහණෙනි සතර සංග්‍රහ

වස්තුවෙන් ජනරංජනය කරණ මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙන් යම් මේ හස්තාලවක කුමාරතෙම අග්‍රයයි එතදග්‍ර පාළියෙහි තබා වදාළසේක. මෙසේ සංසාර චාරකයක් වැනිව සිටි අති නපුරු දුර්ජන ස්වභාව ඇති ආළවක නම් යක්ෂයාහටද දුක් සැප කෙසේ බවත් නොදක්නා ලදරු අලව් රාජ කුමාරයාහටද වඩබාමුඛයම සම්ප්‍රාප්තවූ සමුද්‍ර ජලය සේ ආලවක යක්ෂයාහට ගොදුරුව සිටි අලව්රට වාසීන්ටද ලොව්තුරා සැපත් සාදාදීම් වශයෙන් සතුටු කරවා මහා කරුණා ඥානයෙන් දේශනාකර වදාරණ ලද්දාවූ උතුම් ආලවක සූත්‍රාන්ත ධර්මදේශනාව බුදුන් පිරිනිවන් පෑ වදාළායින් පසු ප්‍රථම සංගීති කාලයෙහි මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛවූ පන්සියයක් පමණ ක්ෂීණාශ්‍රවක භික්ෂූන් වහන්සේලාගේ මුඛ කැමැති පද්මයන් ප්‍රබෝධ කරමින් එතැන්පටන් දෙදහස් තුන්සිය දොළොස් අවුරුද්දක් මුලුල්ලෙහි ශ්‍රොතෘ ජනමනඃ ප්‍රසාදනය කරවන දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිර්වාණ සම්පත් සාධා දෙමින් අවුත් මෙතැන්හිදු සියලු සත්වයන්ට මේ ආලවක සූත්‍රාන්ත ධර්මදේශනාව නිසා ලෞකික ලෝකෝත්තර සම්පත් සාධාදෙන්නේය. එසේ හෙයින් මෙහි ධර්මශ්‍රවණාර්ථය පිණිස රැස්වූ ශ්‍රද්ධා බුද්ධි සම්පන්න සත් පුරුෂාදීන්ගේ කුසල් නමැති නෙත්‍රයට රසාංජනයක්මෙන් පහළවූ මේ සූත්‍රරත්නයෙන් තුන්යම් රාත්‍රිය මුලුල්ලෙහි පවත්වන ලද්දාවූ මේ ධර්මදානයාගේ ආනිසංසයෙන් මතු බුදුවන මෛත්‍රෙය නම් දිපදෝත්තමයාණන් වහන්සේ දක බණ අසා අමාමහ නිවන් දකින්ට හේතුවේවා.

ආලවක සූත්‍ර ව්‍යාඛ්‍යානය නිමි

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු